# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# වාර්ෂික වාර්තාව
# 2012


නො : 70 පාර්ලිමේන්තු පාර,

පැලවත්ත, බත්තරමුල්ල.

දුරකථන අංක : 7909021 - 22

ෆැක්ස් : 2784925 – 28

ඊ මේල් :gmtshda@gmail.com

aetshda1@gmail.com

## දර්ශනය

ආර්ථික හා සමාජීය වශයෙන්

තිරසාර කුඩා තේ වතු ප්‍රජාවක්

බිහි කිරීම

## මෙහෙවර

විශිෂ්ඨතම උපකාරක සේවා

සැපයීම තුලින් කුඩා තේ ඉඩම්

අංශයේ ඵලදායිතාව සහ

ගුණාත්මය වර්ධනය කිරීම

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# වාර්ෂික වාර්තාව 2012
# සභාපතිතුමාගේ විමර්ශනය

කුඩා තේවතු අංශය වෙනුවෙන් සේවා සැපයීම පිණිස 1977 වර්ෂයේ ස්ථාපිත කරනු ලැබූ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙහි 2012 වසරේ වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙමි. අප ආයතනයෙහි දිගුකාලීන සංවර්ධන ප්‍රතිඵලය ලෙස කුඩා තේවතු හිමියන්ගේ ජීවන තත්වය ඉහල නංවාලීම අරමුණුකර තිබේ. එමෙන්ම කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ මෙහෙවර වශයෙන් සෑම කුඩා තේවතු ඉඩමකම ඒකක ඵලදායිතාවය වර්ධනය කිරීමත්, තම දළු නිෂ්පාදනය සඳහා ඉහල මිල අපේක්ෂාවෙන් ගුණාත්මක දළු නිෂ්පාදනය වර්ධනය කිරීමත් හඳුනාගෙන ඇති අතර ඒවා ප්‍රධාන මධ්‍යකාලීන අරමුණු බවට පත්කර ගනිමින් කටයුතු කර ඇත.

ඒ අනුව ක්ෂේත්‍රයේ අපේක්ෂා මුදුන්පත්කර ගැනීම පිණිස ප්‍රතිඵල පාදක කළමණාකරන ක්‍රමවේදය තුලින් නව ක්‍රියාත්මක සැලසුමක් ඔස්සේ සේවා සැපයීම් කටයුතු 2010 වසරේ සිට ක්‍රියාත්මක කර තිබේ.

2012 වසරේ ජාතික තේ නිෂ්පාදනය වූ කිලෝ මිලියන 326.27 න් කිලෝ මිලියන 233.10 ක් එනම් 71.4%ක් කුඩා තේවතු අංශයට නිෂ්පාදනය කිරීමට හැකිවී තිබීම පිළිබඳව මම සතුටු වෙමි. එසේම තේ නැවත වගාව සඳහා හෙක්ටයාර් 1087 ක් උදුරා දැමීමද, හෙක්ටයාර් 889 ක් තේ නැවත වගාවද නිමකර තිබේ. එමෙන්ම හෙක්ටයාර 239 ක අළුතින් තේ වගාව ආරම්භ කිරීමටද කටයුතු කර තිබේ. කුඩා තේවතු අංශයෙහි පෙර වර්ෂයට සාපේක්ෂව ඒකක ඵලදායිතාව හෙක්ටයාරයකට සකස්කල තේ කිලෝ ග්‍රෑම් 1966 සිට 2001 දක්වා 1.8% කින් වැඩිකර ගැනීමට අපට හැකි වී ඇත. සියළුම උච්චත්වයන් සඳහා කුඩා තේ වතු හිමියන් අමු දළු කිලෝවක් සඳහා මේ දක්වා ලද මිල ගණන්වලට අනුව වඩා ඉහල මිලක් 2012 වසරේ ලබාගෙන තිබූ අතර, අමු දළු කිලෝවක් සඳහා ලද සාමාන්‍ය මිල ද 8.8% කින් වැඩි වී තිබුනි.

විශේෂයෙන්ම තේ වගාවේ බොහෝ කාර්යන්වලදී ශ්‍රමික පිරිවැය ඉහලයාම වැනි බාධක හමුවේදී සහනයක් ලෙසට කුඩා තේ වගාකරුවන්හට තේ නැවත වගාව සඳහා ලබාදුන් දිරිදීමනාව හෙක්ටයාරයකට රු.300,000 දක්වා වැඩිකර දීම රජයට හැකිවුයෙන්, එය කුඩා තේ වතු අංශයෙහි ඉහල නිමැවුම දිරිමත් කිරීමට නිසැකවම හේතුවී ඇත.

නොඑල් පද්මසිරි කාරියවසම්
සභාපති

# කුඩා තේ ඉඩම් අංශයේ කාර්යඵල දර්ශක - 2012

| | | | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| 1 | කුඩා තේ බිම් ප්‍රමාණය ( හෙක්ටයාර් ) | | 120,324 | 120,664 | 120,955 |
| 2 | කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව | | 388,645 | 389,561 | 390,346 |
| 3 | කුඩා තේ වතු නිෂ්පාදනය (කිලෝ මිලියන) | | 230.1 | 229.0 | 233.10 |
| 4 | ජාතික නිෂ්පාදනයට දායකත්ව ප්‍රතිශතය | | 69.4 | 69.9 | 71.4 |
| 5 | සාමාන්‍ය ඵලදායිතාවය (සකස් කළ තේ / කි.ග්‍රෑ./ හෙක්ටයාරයකට) | | 1,976 | 1,966 | 2,001 |
| 6 | තේ නැවත වගා බිම් ප්‍රමාණය /හෙක්ටයාර් (දිරිදීමනා යටතේ) | | 847 | 772 | 889 |
| 7 | තේ අළුත් වගා බිම් ප්‍රමාණය /හෙක්ටයාර්(දිරිදීමනා යටතේ) | | - | 28 | 239 |
| 8 | නැවත වගා අනුපාතිකය | | 0.73 | 0.66 | 0.76 |
| 9 | භෝග පුනරුත්ථාපනය- පැල සංඛ්‍යාව ( මිලියන ) | | 0.424 | 0.504 | 0.767 |
| 10 | කුඩා තේ වතු සංවර්ධන සමිති | සමිති සංඛ්‍යාව | 1,372 | 1,379 | 1,381 |
| | | සාමාජික සංඛ්‍යාව | 282,502 | 274,161 | 261,493 |
| 11 | ව්‍යාප්ති සහ උපදෙස් සේවා | ඒක පුද්ගල ව්‍යාප්ති සේවා සංඛ්‍යාව | 27,346 | 26,103 | 27,843 |
| | | කණ්ඩායම් වැඩ සටහන් සංඛ්‍යාව | 7,154 | 6,970 | 6,508 |
| | | සහභාගිත්ව ගොවීන් සංඛ්‍යාව | 210,334 | 175,849 | 143,456 |
| 12 | ආයතනයේ මෙහෙයුම් පිරිවැය ( සංවර්ධන රුපියලක් සඳහා) | | 1.08 | 1.04 | 0.85 |
| 13 | තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී : තේ ගොවි අනුපාතිකය | | 1:2643 | 1:2650 | 1:2730 |
| 14 | අමු දළු කිලෝවක සාමාන්‍ය දළ මිල රුපියල් | | 54.11 | 52.63 | 57.27 |

# පටුන

**පිටු අංකය**


I අධ්‍යක්ෂ මණ්ඩලය 01
II විගණන හා කළමණාකරන කමිටුව 02
III විධායක කාර්යමණ්ඩලය 03

**ප්‍රධාන සාරාංශය** 14

**1 වන පරිච්ඡේදය**

**හැඳින්වීම**

1.1 ආයතනය සහ කාර්යභාරය 17
1.2 විගණන හා කළමණාකරන කමිටු කටයුතු 18
1.3 පරිපාලනමය කටයුතු 19

**2 වන පරිච්ඡේදය**

**ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය** 22
2.1 කුඩා තේ ඉඩම් 22
2.2 කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය 22
2.3 කුඩා තේ ඉඩම් හිමියෝ 23
2.4 කුඩා තේ ඉඩම් සංඛ්‍යාව 23
2.5 භූමි වර්ගීකරණය 24
2.6 කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය 24
2.7 නිෂ්පාදන සංයුතිය 27
2.8 ඵලදායිතාව 28
2.9 ආයෝජනයන් 29

**3 වන පරිච්ඡේදය**

**ව්‍යවස්ථාපිත අරමුණු හා ප්‍රතිඵල පාදක සංවර්ධන කාර්යයන්** 32
3.1 මධ්‍යකාලීන ප්‍රතිඵල පාදක සංවර්ධන කාර්ය ඉලක්ක / කාර්යඵලය 35
3.2 දශකයේ විශේෂ කාර්ය සාධනයන් 51
3.3 ප්‍රධාන කාර්යපාදක දර්ශක 52

**4 වන පරිච්ඡේදය**

**කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිල** 53
4.1 ශ්‍රම පිරිවැය 53
4.2 අමු තේ දලු කිලෝවක නිෂ්පාදන පිරිවැය 53
4.3 නිෂ්පාදන ආන්තිකය හා මිල 54
4.4 තේ නැවත වගා කිරීමේ පිරිවැය 54
4.5 දිරිදීමනා අනුපාතිකය හා වගා පිරිවැය (හෙක්ටයාරයකට) 55

**5 වන පරිච්ඡේදය**

තේ සංවර්ධන ව්‍යාපෘති චක්‍රිය අරමුදල් ණය ක්‍රමය 56

**6 වන පරිච්ඡේදය.**

ප්‍රාදේශීය කාර්යාලීය විශේෂ ව්‍යාපෘති කටයුතු 58

වාර්ෂික ගිණුම් ප්‍රකාශ හා ශේෂ පත්‍රය

විගණකාධිපතිගේ වාර්තාව

## උපලේඛන


| අංක | | පිටු අංකය |
|---|---|---|
| (1) | ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව - 2012 | 60 |
| (2) | ආයතනයේ සේවා නියුක්තිය - 2012 | 61 |
| (3) | 3- I සේවා නියුක්තියන්ගේ වයස් ව්‍යුහ විශ්ලේෂණය - 2012 | 63 |
| | 3- II විධායක නිලධාරී අධ්‍යාපන මට්ටම අනුව කාණ්ඩගත කිරීම - 2012 | 64 |
| (4) | කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය ( 1983 - 2012 ) | 68 |
| (5) | තේ නැවත වගා අධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරීත්වය - (1978 – 2012) | 69 |
| (6) | භෝග පුනරුත්ථාපනය (පාළු සිටුවීමේ ) ආධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරීත්වය - ( 1979- 2012 ) | 70 |
| (7) | තේ අලුත් වගා ආධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරීත්වය – (1978 – 2012) | 71 |
| (8) | තේ සමග රබර් වගා කිරීමේ ආධාර ක්‍රමය -(1999 -2009 ) | 72 |
| (9) | 9 - A මව් වගා මගින් නව ප්‍රභේද රිකිලි හා අතු නිකුත් කිරීම | 73 |
| | 9 - B ආයතනික තේ තවාන් ක්‍රියාකාරීත්වය - 2012 | 74 |
| | 9 - C වාණිජ තවාන් සඳහා අවසරපත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය- (1992-2012) | 75 |
| (10) | 10 - A පිහිටීම මත කොළඹ තේ වෙන්දේසියේ තේ සඳහා මිල ( 1985 – 2012 ) | 76 |
| | 10 - B අමු දළු කිලෝවක නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව (සහනාධාර සහිත ) - 2012 | 77 |
| (11) | 11 - A වගා පිරිවැය ඇස්තමේන්තුව - උස් / මැදි බිම් තේ නැවත වගා හෙක්ටයාරයකට – 2012 | 78 |
| | 11 - B වගා පිරිවැය ඇස්තමේන්තුව - පහත් බිම් තේ නැවත වගා හෙක්ටයාරයකට - 2012 | 79 |
| (12) | මානව සම්පත් පුහුණු වැඩසටහන් - 2012 | 80 |
| (13) | කුඩා තේ වතු හිමියන් සඳහා ණය වාරික ක්‍රමය යටතේ පොහොර ලබාදීම (1993 – 2009) | 81 |
| (14) | තේ අපනයනය හා විදේශ විනිමය ඉපයීම | 82 |
| (15) | දළජාතික නිෂ්පාදනයට තේ මගින් එකතු කල වටිනාකම | 83 |

පිටු අංකය

රූ සටහන් අංක


| | | |
|---|---|---|
| (1) | මුලු තේ ඉඩම් ප්‍රමාණයට කුඩා තේ ඉඩම් දායකත්වය | 22 |
| (2) | කළමණාකාරිත්ව ආයතනයන්හි නිෂ්පාදන දායක ප්‍රතිශතයන් | 25 |
| (3) | කුඩා තේ වතු අංශයේ වාර්ෂික / මාසික තේ නිෂ්පාදනය (2010/2012) | 26 |
| (4) | කුඩා තේ වතු අංශයේ වාර්ෂික තේ නිෂ්පාදන ප්‍රවනතාවන් (2000/2012) | 26 |
| (5) | තේ නැවත වගා ආධාර මුදල වැඩි කිරීම (1979 – 2012) | 35 |
| (6) | තේ නැවත වගා ආධාර සඳහා අයදුම් කිරීම (2000 – 2012) | 36 |
| (7) | තේ නැවත වගා ආධාර ගෙවීම්හි ප්‍රගතිය (1992 – 2012) | 38 |
| (8) | භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය යටතේ ගෙවීම්හි ප්‍රගතිය (1993 – 2012) | 41 |

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
## ප්‍රධාන කාර්යාල සංවිධාන ව්‍යුහය




**සංවිධාන ව්‍යුහය**
**කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ MSD /30 පරිදි**

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

## ප්‍රාදේශීය කාර්යාල සංවිධාන ව්‍යුහය




(6) මධ්‍යම කළමණාකරණ 1-1

(26) මධ්‍යම කළමණාකරණ 1-1

(30) කනිෂ්:කළමණාකරණ1-1

(165) කළමණාකරණ සහකාර2-2

(119) කළමණාකරණ සහකාර 1-2

(07) කළමණාකරණ සහකාර 1-2(තවාන සහා:)

(14) ප්‍රාථ:මට්ටම 3

(18) ප්‍රාථ:මට්ටම 1

385

**සංවිධාන ව්‍යුහය**

**කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ MSD /30 පරිදි**

**අධ්‍යක්ෂ මණ්ඩලය :**

1. සභාපති - නොවල් පද්මසිරි කාරියවසම් මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්**

| | නම | තනතුර | ආයතනය | දු. අංකය |
|---|---|---|---|---|
| 1. | ආචාර්ය එස්.එස්.බී.ඩී.ජී. ජයවර්ධන මහතා | සභාපති | තේ පර්යේෂණ මණ්ඩලය | 051-3519619 |
| 2. | එම්.විදානපතිරණ මහතා | පෞද්ගලික කම්හල් හිමියන්ගේ සංගමයේ නියෝජිත | - | 077-6031000 |
| 3. | දිශ්නා ධර්මසේකර මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂිකා, (සංවර්ධන) | වැවිලි කර්මාන්ත අමාත්‍යංශය , කොළඹ 02. | 011-2304132 |
| 4. | එම්. අනෝමා නන්දනී මහත්මිය | අධ්‍යක්ෂ | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව | 011 - 2480600 |
| 5. | එච්.ඩී හේමාරත්න මහතා | අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී ලංකා තේ මණ්ඩලය ගාලු පාර , කොළඹ 03 (2012 අගෝස්තු දක්වා) | 011-2508991 |
| | ඩී.ඩබ්.එස්. නාරංගොඩ මහතා | අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී ලංකා තේ මණ්ඩලය (ගාලු පාර, කොළඹ 03) | 011-2508991 |
| 6. | නෙවිල් රත්නායක මහතා | ගරු සභාපති | සමස්ත ලංකා සමිති සංවිධානය | 077-2910003 |
| 7. | කේ.එල්.ගුණරත්න මහතා | ගරු ලේකම් | සමස්ත ලංකා සමිති සංවිධානය | 077-7707623 |
| 8. | එම්.එෆ්.එස්.ඩබ්. ස්ටෙම්බෝ මහතා | ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය නියෝජිත | - | 0777-226751 |
| 9. | රොෂාන් රාජදුරෙයි මහතා | අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී | කහවත්ත ප්ලාන්ටේෂන්ස් සමාගම (2012 අගෝස්තු 03 සිට) | 011-4951353 |
| 10. | පී.ජී දසනායක මහතා (අධ්‍යක්ෂ මණ්ඩල නිරීක්ෂක සාමාජික) | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ස්වාධීන රූපවාහිනී සංස්ථාව (2012-අප්‍රේල් 25 සිට) | 011-2773289 |

අදාල වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 12 ක් පවත්වා ඇත.

**විගණන හා කළමණාකරණ කමිටුව**

| | නම | තනතුර | ආයතනය | දු. අංකය |
|---|---|---|---|---|
| 1. සභාපති - | අනෝමා නන්දනි මිය | අධ්‍යක්ෂ | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව | 011-2480600 |
| 2. සාමාජික - | දිග්නා ධර්මසේකර මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂිකා , (සංවර්ධන) | වැවිලි කර්මාන්ත අමාත්‍යංශය , කොළඹ 02. | 011-2344132 |
| 3. සාමාජික - | එම්.එෆ්.එස්.ඩබ්. ස්ටෙම්බෝ මහතා | ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය නියෝජිත | - | 0777-226751 |
| 4. සාමාජික - | කේ.එල්.ගුණරත්න මහතා | ගරු ලේකම් | සමස්ත ලංකා සමිති සංවිධානය | 077-7707623 |
| 5. නිරීක්ෂක - | සුවිනීතා ඇන්තනී මිය | විගණන අධිකාරී | විගණන උපකාර්යාලය ශ්‍රී ලංකා තේ මණ්ඩලය ගාලු පාර, කොළඹ 03 | 011-2583687 |

අදාල වර්ෂයේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වාර 06 ක් පවත්වා ඇත.

**විධායක කායඪි මණ්ඩලය ප්‍රධාන කායඪාලය** :

සභාපති : නොඑල් පද්මසිරි කාරියවසම් මහතා

සාමාන්‍යාධිකාරි : කේ.පී.බී. ඔබේසේකර මහතා (2012/03/01) සිට (2012/02/29)-(වැ.බ.) දක්වා

**ව්‍යාප්ති අංශය :**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ( ව්‍යාප්ති ) : කේ.පී බී. ඔබේසේකර මහතා (2012/02/29) දක්වා
: සි.ජේ.අයි.ටී. ප්‍රනාන්දු මහතා (2012/05/12)-(වැ.බ.) සිට

**සංවර්ධන අංශය :**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන) : එම්.බී. සිරිල් මහතා

කළමණාකරු (සංවර්ධන) : සි.ජේ.අයි.ටී. ප්‍රනාන්දු මහතා

කළමණාකරු (ප්‍රජා සංවර්ධන ) : ජේ.එම්.පී. ජයසිංහ මහතා

**සැලසුම් හා නියමුකරණ ඒකකය**

කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) : එම්.අයි.එම්.ජේ. සමරවික්‍රම මහත්මිය

සහකාර කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) : ආර්.ඒ. වෛද්‍යරත්න මහතා

**මුදල් අංශය :**

කළමනාකරු (මුදල් ) : ඩී.පී.පී. ජයන්ති මහත්මිය

සහකාර කළමනාකරු (මුදල් ) : පී.ආර්. ඉන්දික පෙරේරා මහතා

ගිණුම් නිලධාරී : බී.එච්.සී.ඒ. බටගොඩ මහතා

**පරිපාලන අංශය :**

සහකාර සාමාන්‍යාධිකරි (සේවා) } : අමිත පැස්කුවල් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් }

කළමණාකරු(මානව සම්පත් /පරිපාලන) } : ටී.එච්. ටී. ද සිල්වා මහතා - වැ.බ.
සහකාර ව්‍යාපෘති කළමනාකරු }

සහකාර කළමනාකරු (මානව සම්පත් හා පාලන):ආර්.එම්.අබේරත්නබණ්ඩා මහතා(2012/11/02දින දක්වා)

පරිපාලන නිලධාරි : පී.අයි.යූ. සෝමසිරි මයා (2012/05/02 දින සිට 2012/09/30 දින දක්වා)
: කරුණා සෝමසිරි මිය (2012/10/01 දින සිට)
: ඊ.එම්.ඩී අමුණුගම මිය (2012-11-15 දින සිට) (2012/05/01දින දක්වා)වැ.බ

**අභ්‍යන්තර විගණන අංශය :**

අභ්‍යන්තර විගණක : කේ.පී. නාරද මහතා

අභ්‍යන්තර විගණන නිලධාරී : දමින්ද ප්‍රියන්ජිත් මහතා (2012/05/02 දින සිට)

## ප්‍රාදේශිය කාර්යාල

### ප්‍රාදේශිය කාර්යාලය ( ගාල්ල )

| | | |
|---|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : | ඒ.ඩබ්.ඩබ්. කරුණාරත්න මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු<br>කාර්යභාර නිලධාරී | : | පී.පී. සෝමසිරි මහතා (වැ.බ.) |
| | : | ජ්.ආර්.එස්. ගුණවර්ධන මහතා |
| | : | එල්.කේ. වීරසේකර මහතා |
| | : | ජී. සිසිර කුමාර මහතා |
| | : | එස්.ජේ.එම්. විජේසිංහ මහතා (2012/06/30 දක්වා) |
| | : | ටී.එම්. සේනාරත්න මහතා (2012/11/20 සිට) (රා.ආ.) |
| පරිපාලන නිලධාරී | : | එච්. දයානන්ද මහතා |
| ගිණුම් නිලධාරී | : | යූ.එල්.එම්.පෙරේරා මිය(2012/05/01 දින දක්වා) වැ.බ. |
| | : | (2012/08/17 දින සිට) |

### ප්‍රාදේශිය කාර්යාලය ( මාතර )

| | | |
|---|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : | පී.පී. බන්දුල මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු<br>කාර්යභාර නිලධාරී | : | එස්.එස්.බී. දිසානායක මහතා (2012/02/10 දින සිට)(වැ.බ.) |
| | : | ඩී.එල්.සී. සූරියආරච්චි මහතා |
| | : | ඩී.එම්.ජේ. නාකන්දල මහතා |
| පරිපාලන නිලධාරී | : | එම්.එච්.ඒ. කරුණාරත්න මහතා (2012/10/05 දින දක්වා) |
| | : | කේ.එච්.එම්.ඒ. අමරලතා මිය (2012/11/09 දින සිට)-(වැ.බ.) |
| ගිණුම් නිලධාරී | : | එච්.එම්.එල්. පුෂ්පකුමාරි මිය (2012/05/01 දක්වා) වැ.බ.<br>(2012/08/17 සිට) |
| | : | යූ.එල්.එම්. පෙරේරා මිය<br>(2012/05/02සිට2012/08/16 දින දක්වා ) |

### ප්‍රාදේශිය කාර්යාලය ( මහනුවර )

| | | |
|---|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : | එච්.ආර්.අරුණශාන්ත මහතා (2012/02/08 දින දක්වා ) වැ.බ. |
| | : | එස්. අබේසිංහ මහතා<br>(2012/03/19 - 2012/10/30 දක්වා) (රා.ආ.) |
| | : | කේ.ඒ.බී.ද.ඒ. රාජපක්ෂ මහතා (2012/11/01 දින සිට) වැ.බ. |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු | : | එස්.එම්.කේ.කේ.බී. කපුගෙදර මහතා (වැ.බ.) |
| සහකාර කළමනාකරු (මුදල් ) | : | ඒ.පී. සෝමසිරි මහතා |
| කාර්යභාර නිලධාරී | : | එස්.එම්.කේ.කේ.බී. කපුගෙදර මහතා |
| | : | ඩබ්.ජේ.ඩබ්. අරඹේපොල මහතා |
| | : | ටී.එම්.ජේ. හේරත් මහතා |
| | : | ටී. අමරසේකර මහතා |
| | : | අනුරුද්ධ බණ්ඩාර මහතා |
| පරිපාලන නිලධාරී | : | ජ්.ජේසුදාසන් මහතා (2011/05/01 දින දක්වා)වැ.බ |
| | : | පී.එම්.පී.බණ්ඩාරනායක මහතා (2012/05/02 දින සිට) |

**ප්‍රාදේශිය කායඹාලය ( රත්නපුර )**

ප්‍රාදේශිය කළමනාකරු : යූ.එල්. ආරියපාල මහතා (වැ.බ)
සහකාර ප්‍රාදේශිය කළමනාකරු ( ව්‍යාප්ති ) } පී.ඒ.ඒ. ගමගේ මහතා (වැ.බ.)
කාර්යභාර නිලධාරී
: කේ.ඒ.බී. පද්මරාජා මහතා
: එල්.යූ. කුමාරසිරි මහතා
: කේ.එම්.ආර්.එල්. බණ්ඩාර මහතා
: පී.ඩී.කේ. බාලචන්ද්‍ර මහතා (2012/01/16 දින සිට)-(වැ.බ.)
පරිපාලන නිලධාරී : ඩී.එම්.එන්.කේ.බී. තානායම්වත්ත මහතා (2012/05/01 දක්වා) වැ.බ.
(2012/10/01 සිට)
: කරුණා සෝමසිරි මිය (2012/05/02දින සිට2012/09/30 දක්වා)
ගිණුම් නිලධාරී : එම්.ඒ. පියසිලි මිය (2012/05/01 දක්වා)-(වැ.බ)
(2012/06/01 දින සිට)
: ඩබ්.එම්. ධනපාල මහතා (2012/05/01 සිට 2012/05/31 දක්වා)

**ප්‍රාදේශිය කායඹාලය ( ඌව )**

ප්‍රාදේශිය කළමනාකරු : ඒ.ඩබ්. නිල්මල්ගොඩ මහතා(2012/02/15 දක්වා) රා. ආ.
ප්‍රාදේශිය කළමනාකරු : එච්.ආර්. අරුණ ශාන්ත මහතා (2012/02/15 සිට ) වැ.බ
සහකාර ප්‍රාදේශිය කළමනාකරු ( ව්‍යාප්ති ): } එම්.එම්. විජේබණ්ඩාර මහතා (වැ.බ.)
කාර්යභාර නිලධාරී :
: ඩබ්.ටී.ආර්.පී. විමලරත්න මහතා
: කේ.එම්.ඒ.ඩී.එස්. කුරුප්පු මහතා (2012/01/16 සිට)-(වැ.බ.)
: ඩී.එම්.ජී. වික්‍රමරත්න බණ්ඩාර මහතා (2012/01/16 සිට)-(වැ.බ.)
සහකාර කළමනාකරු : ඩී. එම්. ගුණපාල මහතා
(මානව සම්පත් හා පාලන)
ගිණුම් නිලධාරී : ඩබ්.එම්. ධනපාල මහතා (2012/05/01 දක්වා)-(වැ.බ)
(2012/06/01 දින සිට)
: එම්.ඒ. පියසිලි මිය (2012/05/02 සිට 2012/05/31 දක්වා)

**ප්‍රාදේශිය කායඹාලය ( නුවරඑළිය )**

ප්‍රාදේශිය කළමනාකරු : එච්.වයි.බී. උකුවෙල මහතා (2012.03.18 දක්වා) වැ.බ.
: පී.ඒ.ඩබ්. නිල්මල්ගොඩ මහතා (2012/03/18 සිට) රා. ආ.
සහකාර ප්‍රාදේශිය කළමනාකරු ( ව්‍යාප්ති ): ඩබ්. එච්. පි. එස්. විජේතුංග මහතා (වැ.බ.)
කාර්යභාර නිලධාරී : ඩී.එම්.ආර්.කේ.බී. දසනායක මහතා
: ජේ. බෝගහවත්ත මහතා
: පී.එන්. යගමුණි මහතා (2012/01/16 සිට)-(වැ.බ.)
: බී.ඩී.ඒ. හියරාපිටිය මහතා (2012/01/16 සිට)-(වැ.බ.)

| | | |
|---|---|---|
| සහකාර කළමනාකරු (මුදල් ) | : | ඒ. පී. එන්. එස්. කළුආරච්චි මහතා (2012/10/05 දින දක්වා) |
| පරිපාලන නිලධාරී | : | පී.එම්.පී.බණ්ඩාරනායක මහතා (2012/05/01 දක්වා) වැ.බ. |
| | : | ඩී.එම්.එන්.කේ.බී.තානායම්වත්ත මහතා<br>(2012/05/01 සිට 2012/09/30 දක්වා ) |
| | : | ජී.අයි.යූ. සෝමසිරි මහතා (2012/10/01 දින සිට) |
| මහජන සම්බන්ධතා නිලධාරී | : | ඒ. දිසානායක මහතා |

**ප්‍රාදේශිය කාර්යාලය ( කෑගල්ල )**

| | | |
|---|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : | පී. ඒ. ඩබ්. නිල්මල්ගොඩ මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු ( ව්‍යාපෘති ):<br>කාර්යභාර නිලධාරී | | ඒ. ගුණවර්ධන මහතා (වැ.බ.) |
| | : | ඩී.එම්.පී.එස්. ඒකනායක මහතා |
| | : | ආර්.ඒ.පී.පී. රණසිංහ මහතා |
| පරිපාලන නිලධාරි | : | එම්.පී.සෝමදාස මහතා(2012/05/01 දක්වා) වැ.බ. |
| | : | ජ්.එම්.ඩී. අමුණුගම මිය<br>(2012/05/02 සිට 2012/11/15 දක්වා) |

**ප්‍රාදේශිය කාර්යාලය ( කළුතර )**

| | | |
|---|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : | කේ.ඒ.බී. ද රාජපක්ෂ මහතා (2012/09/19 දින දක්වා) වැ.බ. |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු ( ව්‍යාපෘති ):<br>කාර්යභාර නිලධාරි | | එල්.එච්. රංජිත් මහතා (වැ.බ.) |
| | : | ඒ.ඒ.ඩී.පී. අබේතිලක මහතා |
| | : | එම්.එම්. චන්ද්‍රපාල මහතා (2012/01/16 සිට)-(වැ.බ.) |
| පරිපාලන නිලධාරි | : | එම්.කේ.කේ. සෝමසිරි මිය (2010-10-01 දින සිට)-(වැ.බ) |
| | : | එන්.වී. ප්‍රීති පුෂ්පකුමාරි මිය (2012/05/10 දින සිට)-(වැ.බ.) |

**රත්නසිරි වික්‍රමනායක ජාතික පුහුණු මධ්‍යස්ථානය**

| | | |
|---|---|---|
| කළමනාකරු ( පුහුණු ) | : | එස්. අබේසිංහ මහතා |

# පරිපාලන දිස්ත්‍රික් කාර්යාලයන්

**ප්‍රධාන කාර්යාලය**

**අංක 70, පාර්ලිමේන්තු පාර,**

**පැලවත්ත, බත්තරමුල්ල.**

**දුරකථන අංක : 011 – 7909020/21**

| පරිපාලන දිස්ත්‍රික්කය | කාර්යාලය | ව්‍යාපෘති මධ්‍යස්ථානය | උප කාර්යාලය | සේවා කොට්ඨාශය |
|---|---|---|---|---|
| ගාල්ල | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>ගාල්ල ප්‍රාදේශිය කාර්යාලය<br>අංක 81, ප්‍රදිපාගාර වීදිය,<br>කොටුව, ගාල්ල<br>දු: අංක : 091 - 7201126/28<br>ෆැක්ස් : 091-2244382 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>ප්‍රාදේශීය ව්‍යාපෘති මධ්‍යස්ථානය<br>වලහන්දුව වත්ත, ගාල්ල.<br>දුරකථන අංක : 091- 2234324 | වදුරඹ | කුරුපනාව<br>උනන්විටිය<br>උඩුගම<br>බද්දෙගම<br>වදුරඹ |
| | | | ඇල්පිටිය | ඇත්කඳුර<br>පිටිගල<br>නියාගම<br>ඇල්පිටිය<br>බටපොල<br>කහඳුව |
| | | | හිංගල්ගොඩ | දෙල්ලව<br>මාවනාන<br>නෙළුව<br>හබරකඩ<br>හල්විටිගල<br>හිනිදුම<br>ඕපාත |
| | | | අක්මීමන | ඉමදූව<br>කොට්ටව<br>යක්කලමුල්ල<br>බෙරනාගොඩ<br>අක්මීමන |

| පරිපාලන දිස්ත්‍රික්කය | කාර්යාලය | ව්‍යාප්ති මධ්‍යස්ථානය | උප කාර්යාලය | සේවා කොට්ඨාශය |
|---|---|---|---|---|
| මාතර / හම්බන්තොට | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මාතර ප්‍රාදේශිය කාර්යාලය<br>අංක 31, කාලිදාස පාර<br>මාතර<br>දු: අංක : 041 - 7200799<br>041 - 7200394/96<br>ෆැක්ස් : 041- 2226487 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ප්‍රාදේශිය ව්‍යාප්ති මධ්‍යස්ථානය<br>මොරවක, අලපලාදෙනිය. | කොටපොල | දෙනියාය<br>කළුබෝවිටියන<br>මොරවක<br>දෑරංගල<br>කොළවෙනිගම<br>කොටපල<br>පිටබැද්දර |
| | | | අකුරැස්ස | කනංකෙ<br>අකුරැස්ස<br>තෙලිජ්ජවිල<br>තිබ්බටුවාව<br>කැටන්විල<br>කඹුරුපිටිය |
| | | | පස්ගොඩ | බෙරලපනාතර<br>වරාපිටිය<br>කිරිලිපන<br>දම්පහල<br>පස්ගොඩ<br>ඌරුබොක්ක<br>දෙයියන්දර |
| නුවරඑළිය/ මහනුවර | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ගම්පල ප්‍රාදේශිය කාර්යාලය<br>අංක 22, හිල්විදිය,<br>ගම්පොල<br>දු: අංක : 081 - 7201863<br>081 - 7201593<br>ෆැක්ස් : 081- 2351293 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය තිස්පනේ<br>ප්‍රාදේශිය ව්‍යාප්ති මධ්‍යස්ථානය<br>තිස්පනේ, නව තිස්පනේ.<br>දුරකථන අංක : 054-3541075 | ගම්පල | පන්විලතැන්න<br>ගම්පල<br>නිල්ලඹ<br>පුපුරැස්ස<br>පුස්සැල්ලාව |
| | | | උඩුනුවර | හන්දෙස්ස<br>වට්ටප්පොල<br>කුරුඳුවත්ත<br>උලපනේ<br>දොලොස්බාගේ |
| | | | කොත්මලේ | රුවන්පුර<br>තිස්පනේ<br>හරංගල<br>හෙල්බොඩ<br>පූඩළුඔය |
| | | | ගිනිගත්හේන | ගිනිගත්හේන<br>පොල්පිටිය<br>ලක්‍ෂපාන<br>නාවලපිටිය<br>වැලිගම්පල |

| පරිපාලන දිස්ත්‍රික්කය | කාර්යාලය | ව්‍යාප්ති මධ්‍යස්ථානය | උප කාර්යාලය | සේවා කොට්ඨාශය |
|---|---|---|---|---|
| මහනුවර / මාතලේ / කුරුණෑගල | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මහනුවර ප්‍රාදේශීය කාර්යාලය අංක 2 / 7 / 1, ගන්නෝරුව පාර, පේරාදෙණිය, මහනුවර<br>දු: අංක : 081 - 7200827<br>081 - 7201821<br>ෆැක්ස් : 081- 2389011 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය සුරියගොඩ,මුරුතලාව.<br>දුරකථන අංක : 081 - 2412139 | මාතලේ | උකුවෙල<br>මාතලේ<br>රත්තොට<br>අලවතුගොඩ |
| | | | වත්තේගම | ප්‍රජාපිටිය<br>වැරැල්ලගම<br>තෙල්දෙණිය<br>වත්තේගම |
| | | | හගුරන්කෙත | හේවාහැට<br>මන්දාරම්නුවර<br>හගුරන්කෙත<br>වලපනේ |
| | | | ගිරාගම | ගන්නොරුව<br>ගලගෙදර<br>මැණික්දිවෙල<br>දන්තුරේ |
| රත්නපුර | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය<br>1 / 28, නව නගරය, රත්නපුර.<br>දු: අංක : 045 - 7201243<br>045 - 7201904<br>ෆැක්ස් : 045 - 2228647 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය<br>සන්නස්ගම, රත්නපුර.<br>දුරකථන අංක: 045 - 2275323 | නිවිතිගල | නිවිතිගල<br>රත්නපුර<br>වැද්දාගල<br>කලවාන<br>අයගම<br>කුකුලේගම |
| | | | බලංගොඩ | ඕපනායක<br>පින්නවල<br>රාස්සගල<br>ඉඹුල්පේ<br>ඇල්ලරාව<br>වැලිගෙපොල<br>බලංගොඩ |
| | | | රක්වාන | පොතුපිටිය<br>මාදම්පේ<br>කොලොන්න<br>රක්වාන<br>පැල්මඩුල්ල<br>කහවත්ත |

| පරිපාලන දිස්ත්‍රික්කය | කාර්යාලය | ව්‍යාපෘති මධ්‍යස්ථානය | උප කාර්යාලය | සේවා කොට්ඨාශය |
|---|---|---|---|---|
| | | | කුරුවිට | ඇහැලියගොඩ<br>ගල්ලෑල්ල<br>ගිලිමලේ<br>එරත්න<br>කිරිඇල්ල<br>වේවැල්වත්ත |
| බදුල්ල / මොනරාගල | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය බණ්ඩාරවෙල ප්‍රාදේශිය කාර්යාලය නව බදුල්ල පාර, බණ්ඩාරවෙල.<br>දු: අංක : 057 - 7200241<br>057 - 7200081<br>ෆැක්ස් : 057- 2232237 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ප්‍රාදේශිය ව්‍යාපෘති මධ්‍යස්ථානය බෝගහමඩිත්ත, හාලිඇල.<br>දුරකථන අංක : 055 - 2294363 | හාලි ඇල | ලුණුගල<br>පස්සර<br>වැපස්සාවෙල<br>හාලි ඇල<br>ඇටම්පිටිය<br>බදුල්ල |
| | | | බණ්ඩාරවෙල | හපුතලේ<br>බණ්ඩාරවෙල<br>ලියන්ගහවෙල<br>ඇල්ල<br>බල්ලකෙටුව<br>හල්දුම්මුල්ල |
| | | | වැලිමඩ | වැලිමඩ<br>බොරලන්ද<br>ලුණුවත්ත<br>බඹරපාන |
| කළුතර / කොළඹ | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය කළුතර ප්‍රාදේශිය කාර්යාලය දඩුගොඩයාවත්ත පාර, ඉද්දගොඩ, මතුගම.<br>දු: අංක : 034 - 7200183<br>034 - 7201630<br>ෆැක්ස් : 034-2249690 | | මීගහතැන්න | මීගහතැන්න<br>යටිටපාත<br>පැලවත්ත<br>ඉත්තපාන<br>බදුරලිය<br>හැඩිගල්ල |
| | | | හොරණ | හොරණ<br>බුලත්සිංහල<br>මහගම<br>මතුගම<br>අගලවත්ත<br>කෙලින්කන්ද |

| පරිපාලන දිස්ත්‍රික්කය | කාර්යාලය | ව්‍යාප්ති මධ්‍යස්ථානය | උප කාර්යාලය | සේවා කොට්ඨාශය |
|---|---|---|---|---|
| කෑගල්ල | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>කෑගල්ල ප්‍රාදේශිය කාර්යාලය<br>කෘෂිකර්ම ගොඩනැගිල්ල,<br>කච්චේරිය පාර, කෑගල්ල.<br>දු: අංක : 035 - 7201254<br>035 - 7201243<br>ෆැක්ස් : 035 - 2230163 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>ප්‍රාදේශිය ව්‍යාප්ති මධ්‍යස්ථානය<br>ශිගුල | දැරණියගල | දැරණියගල<br>නුරිය<br>යටියන්තොට<br>දෙහිඕවිට<br>මාලිබොඩ<br>කිතුල්ගල<br>දික්ඇල්ල |
| | | | කෑගල්ල | කෑගල්ල<br>අරණායක<br>බුලත්කොහුපිටිය<br>වලල්පොල |
| | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>හන්තාන පුහුණු මධ්‍යස්ථානය<br>5 කණුව , මැද කොටස<br>උඩවෙල , හන්තාන<br>දු: අංක : 081 - 7201760<br>081 - 7201873<br>ෆැක්ස් : 081 - 3800679 | | | |

**<u>සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය</u>**

| | |
|---|---|
| නෙවිල් රත්නායක මහතා | - ගරු සභාපති |
| කේ.එල්.ගුණරත්න මහතා | - ගරු ලේකම් |
| එන්.එම්.ආර්.ජයතිලක මහතා | - ගරු භාණ්ඩාගාරික |
| ජේ.එම්.බී.ජේ.බණ්ඩාර මහතා | - ගරු නියෝජ්‍ය සභාපති |
| කේ.විරසිංහ මහතා | - ගරු නියෝජ්‍ය ලේකම් |

**01. ගාල්ල - කුඩා තේවතු සංවර්ධන ප්‍රාදේශිය සමිති සංවිධානය**

| | |
|---|---|
| පී.එච්.සුසන්ත ද සිල්වා මහතා | - ගරු සභාපති |
| ටී.එච්.රිචඩ් මහතා | - ගරු ලේකම් |
| එම්.ඒ.ආර්.ගුණවර්ධන මහතා | - ගරු භාණ්ඩාගාරික |

**02. මාතර - කුඩා තේවතු සංවර්ධන ප්‍රාදේශිය සමිති සංවිධානය**

| | |
|---|---|
| නෙවිල් රත්නායක මහතා | - ගරු සභාපති |
| කේ.විරසිංහ මහතා | - ගරු ලේකම් |
| ඩබ්.පී.හේමා මහත්මිය | - ගරු භාණ්ඩාගාරික |

**03. කළුතර - කුඩා තේවතු සංවර්ධන ප්‍රාදේශිය සමිති සංවිධානය**

| | |
|---|---|
| කේ.එල්.ගුණරත්න මහතා | - ගරු සභාපති |
| කේ.ටී.පියදාස මහතා | - ගරු ලේකම් |
| යසපාල ගුණවර්ධන මහතා | - ගරු භාණ්ඩාගාරික |

**04. රත්නපුර - කුඩා තේවතු සංවර්ධන ප්‍රාදේශිය සමිති සංවිධානය**

| | |
|---|---|
| ජේ.එම්.බී.ජේ.බණ්ඩාර මහතා | - ගරු සභාපති |
| ජගත් සෙනරත් පතිරණ මහතා | - ගරු ලේකම් |
| ඕ.කේ.රත්නතිලක මහතා | - ගරු භාණ්ඩාගාරික |

**05. කෑගල්ල - කුඩා තේවතු සංවර්ධන ප්‍රාදේශිය සමිති සංවිධානය**

| | |
|---|---|
| පී.ආර්.ඒ.රත්නායක මහතා | - ගරු සභාපති |
| එන්.එම්.ආර්.ජයතිලක මහතා | - ගරු ලේකම් |
| එච්.ඩී.අනුර ජයරත්න මහතා | - ගරු භාණ්ඩාගාරික |

**06. මහනුවර - කුඩා තේවතු සංවර්ධන ප්‍රාදේශීය සමිති සංවිධානය**

| | |
|---|---|
| බී.ජී.අබේසිංහ මහතා | - ගරු සභාපති |
| ඩබ්.ඩී.ජයරත්න මහතා | - ගරු ලේකම් |
| ආර්.ටී.ගුරුසිංහ මහතා | - ගරු භාණ්ඩාගාරික |

**07. නුවරඑළිය - කුඩා තේවතු සංවර්ධන ප්‍රාදේශීය සමිති සංවිධානය**

| | |
|---|---|
| ඩබ්.ආර්.එස්.කරුණාරත්නමහතා | - ගරු සභාපති |
| ඩී.ජී.එස්.පී.පියසේන මහතා | - ගරු ලේකම් |
| පී.කේ.සෝමරත්න මහතා | - ගරු භාණ්ඩාගාරික |

**08. ඌව - කුඩා තේවතු සංවර්ධන ප්‍රාදේශීය සමිති සංවිධානය**

| | |
|---|---|
| ආර්.එම්.ගුණසේකර මහතා | - ගරු සභාපති |
| එච්.එම්.දයානන්ද මහතා | - ගරු ලේකම් |
| ඒ.එම්.ගුණරත්න මහතා | - ගරු භාණ්ඩාගාරික |

# ප්‍රධාන සාරාංශය

## කුඩා තේ බිම් ප්‍රමාණය

කුඩා තේ ඉඩම් සංගණනය 2005 පරිදි අත්හරින ලද තේ ඉඩම් රහිත ඇස්තමේන්තුගත සමස්ත තේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 125019 කි. (පර්චස් 20 අඩු බිම්ද සහිතව) ගතවූ දශකයේ දත්ත පරිදි ආයතනයෙහි සහනාධාර සහිතව වාර්ෂිකව සාමාන්‍යයෙන් හෙක්ටයාර් 1092 ක පමණ භූමි ප්‍රමාණයක් තේ නැවත වගාව සඳහා උදුරා දැමීමත්, හෙක්ටයාර් 891 ක පමණ සාමාන්‍ය ප්‍රමාණයක් වාර්ෂිකව තේ නැවත වගාවත් සිදුකර තිබේ. ගතවූ වසර 03 ක ප්‍රවනතාව අනුව වාර්ෂිකව හෙක්ටයාර් 1016 ක ප්‍රමාණයක් උදුරා දැමීමද, හෙක්ටයාර් 836 ක පමණ ප්‍රමාණයක් නැවත වගා කිරීමද සිදුවී තිබේ. සහනාධාර යටතේ තේ නැවත වගාව කිරීමට අමතරව වාර්ෂිකව ගොවීන් විසින් ආයතනයෙහි සහනාධාර රහිතවද තේ නැවත වගාව සහ අලුතින් තේ වගාව සඳහා යොමුවී ඇත. තේ සඳහා හොඳ වෙළඳපොළ මිල, විකල්ප භෝග වලට යොමුවීම, තේ සමඟ අතුරු භෝග වගා කිරීම, අඩු ආදායම්ලාභීන් සඳහා ක්‍රියාත්මක කල විශේෂ ව්‍යාපෘති වැඩසටහන් සහ කාලීනව සිදුවන හිතකර සහ අහිතකර ප්‍රතිඵල මත මෙම වර්ධනය වාර්ෂිකව අඩු වැඩි වශයෙන් දැකිය හැක. 2012 වර්ෂයේ කුඩා තේ වතු අංශය පිළිබඳ තේ පරීක්ෂක /ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ මට්ටමින් ප්‍රශ්නාවලියක් මගින් රැස්කරගනු ලැබූ ඇස්තමේන්තුගත පසුබිම් තොරතුරු පරිදි ගොවීන් 785 දෙනෙකු තේ වගාව සඳහා අලුතින් එකතුවී තිබේ. එම තොරතුරු පරිදි සහනාධාර රහිතව අළුතින් තේ වගාව කර තිබූ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 291 කි. එමෙන්ම වැඩිම භූමි ප්‍රමාණයක් එනම් හෙක්ටයාර 84 ක් පමණ රත්නපුර දිස්ත්‍රික්කයෙන් තේ අලුත් වගාව සඳහා එකතුවී තිබුණි. මේ අනුව 2012 වසර අවසානය වන විට තේ වගාව සහිත ඇස්තමේන්තුගත සමස්ත කුඩා තේ වතු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 120,955 කි.

## කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය හා ජාතික නිෂ්පාදන දායකත්වය

ගතවූ දශකයක කාලය තුළ කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය කිලෝ මිලියන 188 සිට කිලෝ මිලියන 233 දක්වා වර්ධනය කරගැනීමට හැකිවී තිබේ. ජාතික නිෂ්පාදන දායකත්වයද 62% සිට 71.4% දක්වා වර්ධනය වී තිබේ. 2011 වර්ෂයට සාපේක්ෂව කිලෝ මිලියන 4.09 කින් හෙවත් 1.52% කින් වැඩිවී ඇත.

## කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය

ජාතික පොහොර සහනාධාර සහිත විවෘත වෙළඳපල මිල ක්‍රමය යටතේ කුඩා තේවතු හිමියන්හට පොහොර ලබාගැනීමට හැකිවීම මත 2012 වසරේදී ද කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය මෙන්ම සාමාන්‍ය ඵලදායිතාවයද වැඩිවී තිබේ. එනම් සාමාන්‍ය වාර්ෂික ඵලදායිතාවය හෙක්ටයාර් එකකට / නිමි තේ කිලෝ ග්‍රෑම් 1976 සිට 2001 දක්වා එනම් 1.26% කින් වැඩිකර ගැනීමට හැකිවිය. 2011 වසරට සාපේක්ෂව උඩරට හා මැදරට තේ නිෂ්පාදනය පිලිවෙලින් 0.9% හා 0.4% කින් අඩුවී තිබුනද පහතරට තේ නිෂ්පාදනය 0.4% කින් වැඩිවී තිබුනි. පහතරට සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාර් එකකට / නිමි තේ කිලෝ ග්‍රෑම් 2083 සිට 2142 දක්වා එනම් 2.8% කින් වැඩිවී තිබුනි.

## තේ නැවත වගා බිම් ප්‍රමාණය හා නැවත වගා අනුපාතිකය

උපරිම ඵලදාවක් ලබමින් තේ භූමි ප්‍රමාණය ස්ථායිව පවත්වා ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තියට අනුකූලව පවත්නා තේ භූමි ප්‍රමාණයෙන් 2% ක් වාර්ෂිකව තේ නැවත වගාකළ යුතුවේ. සංගණන තොරතුරු පරිදි කුඩා තේ ඉඩම් අංශයේ සමස්ත මේරූ තේ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 116,492 කි. එමෙන්ම හෙක්ටයාර් 21,613 ක් දැනටමත් වසර 25 ඉක්මවූ තේ ඉඩම් වේ. මෙම භූමි ප්‍රමාණය හැකි ඉක්මනින් නැවත වගාවට යොමු කිරීමේ අවශ්‍යතාවයක් පවතී. ප්‍රතිපාදන වලට අනුකූලව ආයතනයෙහි පූර්ව වර්ෂයන්හි අයවැය ඇස්තමේන්තුවල භෞතික ඉලක්ක අඩු කිරීම මත 2010 වසරේ උදුරා දැමීම කරන ලද භූමි ප්‍රමාණය වූ හෙක්ටයාර 1015 න් හෙක්ටයාර 889 ක් හෙවත් 88% ක් 2012 වසරේ තේ නැවත වගාව නිම කර ඇත. ජාතික අවශ්‍යතාවය මත හෙක්ටයාර් 2300 ක් වාර්ෂිකව නැවත වගාකල යුතු වුවද, ඉහත සීමාකාරී තත්වයන් යටතේ තේ නැවත වගාකර ඇති තේ නැවත වගා අනුපාතිකය 0.76% කි.

## භෝග පුනරුත්ථාපනය

නිර්දේශිත පරිදි කප්පාදුව සිදුකිරීම, පස සංරක්ෂණ ක්‍රම යෙදීම හා සෙවන පාලනය වැනි කටයුතු සමඟ පාළු තැන්වල තේ පැල සිටුවීම ඒකාබද්ධව සිදුකිරීම සඳහා බෝග පුනරුත්ථාපන දිරිදීමනාව ගෙවනු ලැබේ. මේ සඳහා අයදුම් කිරීම පෙර වර්ෂයට සාපේක්ෂව 34% කින් ද , අවසර පත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය 44% කින් ද වැඩිවී ඇත. වගාකරන ලද පැල සංඛ්‍යාව පැල මිලියන 0.767 කි. මෙය 2011 වසර සමග සැසඳීමේදී 52% කින් පමණ වැඩිවීමකි. අයවැය ප්‍රතිපාදන අනුව ඉලක්කගත පැල සංඛ්‍යාව 377400 කි. එහෙත් රේඛීය අමාත්‍යාංශ උපදෙස් මත ක්ෂේත්‍ර අවශ්‍යතාවය සඳහා ප්‍රමුඛතාවය සලකා කටයුතු කලයුතු බවට තීරණය වුයෙන් එම පැල සංඛ්‍යාව 766991 ක් දක්වා වැඩිකිරීමට කටයුතු කරන ලදී. ප්‍රතිපාදන සීමාව මත පැල සංඛ්‍යාව අඩු වුවද බෝග පුනරුත්ථාපනය සඳහා ඉලක්කගත පැල සංඛ්‍යාව මිලියන 1.3 කි.

## ව්‍යාප්ති හා උපදේශක සේවා

සියලුම ප්‍රාදේශිය කාර්යාල හා ව්‍යාප්ති කාර්යාල මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති හා උපදේශක සේවා වැඩසටහන් යටතේ 2012 වර්ෂයේදී පවත්වන ලද කණ්ඩායම් වැඩ සටහන් සංඛ්‍යාව 6508 කි. මෙය 2011 වසරට සාපේක්ෂව 6.6% ක අඩුවීමකි. 2012 වසරේ ඉලක්කගත වැඩසටහන් ගණන 6846 කි. එහි වාර්ෂික ප්‍රගතිය 5% කින් අඩුවී තිබේ. 2012 වසරේ එම වැඩසටහන් සඳහා සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව 143,456 කි. ඉලක්කගත ගොවීන් සංඛ්‍යාව 175,289 කි. මේ අනුව ඉලක්කගත ගොවීන් සංඛ්‍යාවෙන් එම ප්‍රගතිය 82% කි.

කුඩා තේ ඉඩම්වල පාංශු ආම්ලිකතාවය පරීක්ෂා කිරීම් සඳහා පස් සාම්පල 16,235 ක් 2012 වසරේදී පරීක්ෂා කරන ලද අතර, එම ප්‍රමාණයේ ප්‍රගතිය ඉලක්කගත සාම්පල සංඛ්‍යාව වූ 23257 න් 70% කි.

## කුඩා තේ වතු සංවර්ධන සමිති

1989 වර්ෂයේ සිට ආරම්භ කරන ලද කුඩා තේ වතු සංවර්ධන සමිති නීතිගත සංවිධාන බවට පත්කරන ලද සමිති ක්‍රමයකි. ප්‍රාදේශිය සංවිධාන 8 ක් සහ සමස්ත ලංකා සමිති සංවිධානයෙන් යුතු මෙම සමිති ක්‍රමය යටතේ 2012 වසර වන විට සමිති 1381 ක් ලියාපදිංචි වී තිබුනි. එහි සමස්ත සාමාජික සංඛ්‍යාව 261,493 කි. 2011 වසර හා සසඳන විට 2012 වසරේ සමිති සංඛ්‍යාව 02 කින් හෙවත් 0.1% කින් වැඩිවී ඇත. සාමාජික සංඛ්‍යාව 12668 කින් හෙවත් 4.6% කින් අඩුවී තිබුනි.

**ආයතනයේ මෙහෙයුම් පිරිවැය**

2012 වසරේ ආයතනයේ සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 276.323 කි. මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 233.738 කි. 2011 වර්ෂය හා සසඳන කළ ප්‍රතිපාදන මුදල් පරිද්, සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 67.9 කින් වැඩිවී තිබේ. මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 15.21 කින් වැඩිවී තිබේ. ඒ අනුව මෙහෙයුම් පිරිවැය හා සංවර්ධන පිරිවැය අතර අනුපාතය 0.85 කි. පසුගිය වසර හා සසඳන විට මෙහෙයුම් පිරිවැය 0.19 කින් අඩුවී තිබේ. එහෙත් ප්‍රතිපාදිත මුදල් සීමාව තුල සංවර්ධන ඉලක්ක හා කාර්යඵලයන් ඍජු ලෙස මෙහෙයුම් සමාලෝචන කටයුතු සඳහා උපයෝගී කරගත නොහැකි බැවින්, එම අගය මෙහෙයුම් සමාලෝචනය සඳහා උපයෝගිකර ගැනීම යථාරූපී නොවේ.

**තේ ගොවි හා තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරී අනුපාතිකය**

ඵලදායි ව්‍යාප්ති සේවාවන් සඳහා තිබියයුතු ව්‍යාප්ති කාරක සහ ගොවි සංඛ්‍යාවේ අනුපාතිකය 1:1000 ක් පමණ වුවද, කුඩා තේ වතු අංශයේ ක්ෂේත්‍ර නිලධාරී හා තේ ගොවි අනුපාතිකය 1:2730 කි. මේ අනුව ආවරණ ගොවි සංඛ්‍යාව පහත හෙලීම සඳහා නිලධාරී සංඛ්‍යාව වැඩි කල යුතු මුත් ආයතනයේ ප්‍රතිපාදන හා පිරිවැය සීමා තත්ත්වයන් සැලකිල්ලට ගෙන එසේ වැඩිකල නොහැකිවුවද, ඒ වෙනුවට සේවා කටයුතු වලදී කුඩා තේ වතු සංවර්ධන සමිති වැනි ප්‍රජා සංවිධානවල සහායක සේවාවන්හි සහාය ලබාගැනීමට ආයතනය විසින් කටයුතු කරන ලදි. කෙසේ වුවද තේ ඉඩම් වල ඵලදායිතාව තව දුරටත් වර්ධනය කිරීම සඳහා කෘෂි ව්‍යාප්ති කටයුතු වල සූක්ෂමතාව වැඩි කල යුතුව ඇත.

**අමු දළු සඳහා මිල**

2012 වසර ශ්‍රී ලංකා තේ වෙළඳපොල සඳහා ලද මිල ගණන් පරිද් අමු දළු කිලෝවක් සඳහා වර්ෂාවසානයේ කුඩා තේ වතු හිමියන් සඳහා ලැබූ සාමාන්‍ය අමු දළු මිල උඩරට සඳහා රු. 54.91 ක් ද, මැදරට සඳහා රු.51.34 ක් ද, පහතරට සඳහා රු. 59.54 ක් ද වූ අතර , සියළුම ප්‍රදේශයන්හි සාමාන්‍යය රු. 57.27 ක් විය. සියළුම ප්‍රදේශ සඳහා සාමාන්‍ය මිල පරිද් 2012 වසරේදී කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදන ආන්තිකය ධන අගයක් ගෙන තිබුණි .

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# වාර්ෂික වාර්තාව – 2012

## 1. හැඳින්වීම.

### 1.1. ආයතනය හා කායඝභාරය.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ, 1977 පෙබරවාරි මස 01 වන දින කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදි.

අනතුරුව ප්‍රධාන ප්‍රඥප්තියට සංශෝධන එකතුකර 1991 අංක 36 දරණ පනත, 1997 අංක 21 දරණ පනත, 2003 අංක 34 දරන පනත සහ 2006 අංක 24 දරණ පනත සම්මත කරතිබේ.

**පරමාර්ථ :**

කුඩා තේ ඉඩම් සංවර්ධනය කිරීම, නිෂ්පාදනය වැඩි කිරීම, ඵලදායිතාවය වර්ධනය කිරීම, දළු අලෙවි කටයුතු සහ කුඩා තේ ඉඩම් හිමියන්ගේ සුභ සිද්ධිය පිණිස කටයුතු කිරීම ආයතනයේ පරමාර්ථ වේ.

තේ පාලන පනතට අනුව " අක්කර 10 ට අඩු තේ ඉඩම් කුඩා තේ ඉඩම්" ලෙස සැලකේ. එසේ වුවද ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ පැවති අක්කර 10 -50 දක්වා වූ තේ ඉඩම් සඳහා සංවර්ධන කටයුතු කිරීමේ බලතල 1978 ජනවාරි මස 01 දා සිට කුඩා තේවතු සංවර්ධන අධිකාරිය වෙත ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පවරන ලදි. ඒ අනුව පුද්ගලික අයිතිය යටතේ ඇති අක්කර 50 ට අඩු සියළුම තේ ඉඩම්වල සංවර්ධනය සඳහා අදාල සහායක සේවාවන් ආයතනය විසින් මෙතෙක් සපයා තිබුණි.

2011/2012 වසරවලදී අක්කර 10 සිට 50 දක්වා වූ තේ බිම් ප්‍රමාණ සඳහා ඉඩම් සංවර්ධන සේවා සැපයීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙතත්, තේ වගා උපදෙස් හා ව්‍යාප්ති සේවා සැපයීම ශ්‍රී ලංකා තේ පරේෂණායතනය වෙතත් පවරා ඇත. ඒ අනුව පනතෙහි පවතින ප්‍රතිපාදන පරිදි අක්කර 10 ට අඩු තේ බිම් සඳහා පමණක් ඒවායේ සංවර්ධනයට සහ ඊට අදාල සහායක සේවාවන් ආයතනය විසින් සපයනු ලැබේ.

**අධිකාරියේ කායඝභාරය.**

1. කුඩා තේ වතු වල සහ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතු වලද සංවර්ධනයට අනුබල දීම හෝ සංවර්ධනය කිරීමට භාර ගැනිම.
2. එම තේ ඉඩම් වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්ත ශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනිම හෝ සංවර්ධනය කිරීම.
3. මෙම තේ ඉඩම් වල හෝ එකී කර්මාන්තශාලා වල කෙරෙන නිෂ්පාදන අලෙවිය දියුණු කිරීම හෝ අලෙවි කිරීම භාර ගැනිම.
4. එකී ඉඩම් හා කර්මාන්ත ශාලා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි පහසුකම් සහ සේවාවන් සපයා දිම හෝ ලබා දිම සඳහා නැතහොත් එම පහසුකම් සහ සේවාවන් ලබා දිම පහසු කිරීම සඳහා ද, එම ඉඩම් වල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීමෙහි හෝ ඒවා ඇසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ට ව්‍යවස්ථාපිත හිමිකම් සහ පාරිශ්‍රමික ගෙවීමද ඇතුළුව ඔවුන්ගේ සුභ සිද්ධිය සඳහා ද අවශ්‍ය සියළු පියවර ගැනිම.
5. කුඩා තේවතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීමට සහ අධිකාරිය වෙත ලියාපදිංචිකර ඇති එවැනි සමිති වල සාමාජිකයනට අධාර ලබාදීම සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා රීති සැදීමට විධිවිධාන සැලසීම.
6. කුඩා තේවතුවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම
7. දත්ත එකතු කිරීමට හා බෙදාහැරීමට භාර ගැනීම සහ කුඩා තේවතු වල සංවර්ධන හැකියාව දැනගැනීම
8. උචිත ප්‍රතිපත්ති පිළබඳව අමාත්‍යාංශයට උපදෙස් දීම සහ වෙනත් අදාල නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම

ඉහත සඳහන් අංක 02,03,04 හි කාර්යභාරයන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පනතින් ඉවත් කිරීමට සහ වෙනත් කාර්යයන් ආදේශ කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.

මීට අමතරව 1978 ජනවාරි 01 වන දින සිට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වරින් වර පවරන ලද කාර්යයන් සහ අනෙකුත් අදාල පහත සඳහන් සෙසු කාර්යයන්ද ඇතුලත් වන පරිදි අධිකාරිය විසින් කටයුතු කරගෙන යන ලදි.

1. පෞද්ගලික අංශයේ කළමනාකාරිත්වය යටතේ පවත්නා ඉඩම් සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් ආධාර ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම.

   I තේ නැවත වගාව. II අළුත් වගාව. III පැළ සැපයීම.

   IV රබර් සමග තේ වගා කිරීම. V පොල් සමග තේ වගා කිරීම.

2. තේ පොහොර බෙදා හැරීම, වැවිලි ද්‍රව්‍ය, උපකරණ හා ප්‍රවාහන පහසුකම් ලබාදීම වැනි උපකාරක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

3. ව්‍යාප්ති හා උපදේශක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

4. කුඩා තේ ඉඩම් හිමියන්ගේ දලු නිෂ්පාදිත තේ කම්හල්වල මිළ අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම

5. දළු එකතු කිරීමේ සමිති මධ්‍යස්ථාන පිහිටු වීම

**1.2. විගණන හා කළමනාකරණ කමිටු කටයුතු**

කමිටුව විසින් පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධව විමර්ශනයන් මූලිකව සිදුකරන ලදි.

1. අභ්‍යන්තර විගණන වාර්ෂික සැලැස්ම විමසුමට භාජනය කර අනුමත කිරීම.
2. අභ්‍යන්තර විගණන වාර්තා මගින් අනාවරණය කර තිබූ කරුණු සමාලෝචනයට භාජනය කිරීම හා යෝජනා ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට කටයුතු කිරීම.
3. විගණකාධිපති වාර්තා සමාලෝචනය කිරීම හා එමගින් දක්වා ඇති ඌනතාවයන් නැවත ඇතිවීම වැලැක්වීම සඳහා අවශ්‍ය වූ නිවැරදි කිරීමේ පියවර ගැනීම.
4. විගණන විමසුම් පිළිබඳ පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පරීක්ෂාව.
5. වාර්ෂික අයවැය ලේඛණ, අභ්‍යන්තර මූල්‍ය ප්‍රකාශන සමාලෝචන කිරීම සහ කාර්ය සාධනය මත ඉලක්ක සාක්ෂාත් කරගැනීම ඇගයීම.

6. අවසන් ගිණුම් හා වාර්ෂික වාර්තා කාලිනව ඉදිරිපත් කිරීම සහතික වීම.
7. මානව සම්පත් හා වෙනත් සම්පත් පරිපාලනය හා සංවර්ධනය කිරීමේ කටයුතු සමාලෝචනය කිරීම හා තීරණ ගැනීම.
8. කාර්ය මණ්ඩල විනයට අදාල කරුණු සමාලෝචනය කිරීම, ආයතනික වියදම් අරපිරිමැස්ම කෙරෙහි යොමුකරවීම.
9. පවත්නා චක්‍රලේඛ හා රෙගුලාසි අනුව කටයුතු කරන්නේද යන්න පිළිබඳව විමර්ශනය කිරීම හා අඩුපාඩු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම

විගණන හා කළමණාකරණ කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලද 2012 වසර ක්‍රියාකාරී සැලැස්ම පරිදි විගණන පරීක්ෂණ 09 ක් හා ක්ෂණික පරීක්ෂණ 19 ක් 2012 වසරේදී නිමකර තිබේ.

## 1.3 පරිපාලනමය කටයුතු

### 1.3.1 සංවිධාන ව්‍යුහය සහ බඳවාගැනීමේ පරිපාටිය

අනුමත සංවිධාන ව්‍යුහය හා බඳවා ගැනීමේ පරිපාටිය අනුව සියළුම සේවකයන් අදාල තනතුරුවලට අන්තර්ග්‍රහණය කර තිබුනි.

**වර්ෂය තුළ සිදුකරන ලද පත්කිරීම්**

අධිකාරියේ පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතිය පරිදි අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව වර්ෂය තුල පහත සඳහන් තනතුරු සඳහා පත්කිරීම් සිදුකිරීමට කටයුතු කරන ලදි.

| තනතුර | ශ්‍රේණිය | සංඛ්‍යාව |
|---|---|---|
| අභ්‍යන්තර විගණන නිලධාරී | JM 1-1 | 01 |
| පරිපාලන නිලධාරී | JM 1-1 | 05 |
| ගිණුම් නිලධාරී | JM 1-1 | 04 |

### 1.3.2 ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ ප්‍රතිඵල පාදක කළමණාකරණ උපාය මාර්ග

කුඩා තේවතු ක්ෂේත්‍රයේ අපේක්ෂාවන් ඉලක්කගත සංවර්ධන ප්‍රතිඵල තුලින් සාක්ෂාත් කරගැනීමට සකස්කර තිබූ උපාය මාර්ග පරිදි 2012 වසරේ කටයුතු කරගෙන යන ලදී. මෙම උපායමාර්ග ව්‍යවස්ථාපිත අරමුණු ඉටුකරලීම සඳහා සැකසූ ආයතනික සංයුක්ත සැලැස්මට අනුකූලවූ, වාර්ෂික ක්‍රියාත්මක සැලැසුම් තුලින් ඉටුකිරීම පිණිස 2009 වසරේ සැලසුම් කිරීම ආරම්භකර, 2010 වසරේ සිට ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ.

මෙහිදී ආයතනයෙහි දිගුකාලින සංවර්ධන ප්‍රතිඵලය " කුඩා තේවතු හිමියන්ගේ ජීවන තත්ත්වය නංවාලිම " ලෙස හඳුනාගෙන තිබේ.

ඒ අනුව 2012 වසර වෙනුවෙන්ද පහත සඳහන් මධ්‍යකාලින ප්‍රතිඵල ලගාකර ගැනීම පිණිස වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව කටයුතු කරන ලදී.

## සංවර්ධන ප්‍රතිඵල

**දිගුකාලින බලපෑම/ ප්‍රතිඵලය** - කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්ත්වය නංවාලිම

**මධ්‍ය කාලින ප්‍රතිඵල**

1. වසර 06 කදි වසරකට / හෙක්ටයාරයකට / සකස්කල තේ / කිලෝ
   පහත රට 2700 දක්වා
   මැද රට 1700 දක්වා
   ඌව 1500 දක්වා වැඩි කිරීම
2. වසර 5 කදි කම්හල් මට්ටමින් අමු දලු ගුණාත්මය 75% දක්වා වර්ධනය කිරීම
3. වසර 06 ක් තුළ ප්‍රජා මූලික සංවිධාන 50% කින් ශක්තිමත් කිරීම
4. වසරක් තුල වඩාත් සඵලදායි ලෙස ක්‍රියාත්මක වීම සඳහා ආයතනය ශක්තිමත් වීම
5. වසර 05 ක් තුලදී තේ ඉඩම් වලින් 10% ක් අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමුකරවීම

### 1.3.3 ප්‍රතිපත්තිමය තීරණ

(i) තේ නැවත වගාව සඳහා දැරිය යුතු පිරිවැය එතෙක් ලබාදුන් දිරිදීමනා මුදලින් ආවරණය වූ ප්‍රමාණය සමස්ත වගා පිරිවැයෙන් 14% ක පමණ ප්‍රමාණයක අවම මට්ටමක තිබීම මත දිරිදීමනා මුදල තවදුරටත් වැඩිකලයුතු බවට තීරණය කරන ලදී. ඒ අනුව 2012 වසරේ අය වැය යෝජනා මගින් එම සහනාධාර මුදල 2013.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි උස්, මැදි හා පහත් යන සියළු බිම් සඳහා හෙක්ටයාරයකට රුපියල් 350,000 ක් වන පරිදි වැඩි කිරීමට යෝජනා විය.

(ii) මුළු ඉඩම් අයිතිය හෙක්ටයාර 01 ක් හෝ ඊට වඩා අඩු කුඩා තේ ඉඩම් හිමියකුට පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගා කරනු ලබන ඉඩම් සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල හෙක්ටයාරයකට රුපියල් 260,000 ක් දක්වා වැඩිකිරීමට තීරණය විය.

(iii) තේ නැවත වගාව සඳහා පස සාරවත් කිරීම සහිතව එක් ඉඩම් හිමියකුට වසරකට අවසරපත්‍ර නිකුත් කරන උපරිම බිම් ප්‍රමාණය හෙක්ටයාර 02 දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදී.

(iv) පස සාරවත් කිරීම සහිතව තේ අළුත් වගාව සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල හෙක්ටයාරයකට රුපියල් 250,000 දක්වා වැඩි විය යුතු බවට තීරණය විය. ඒ අනුව 2012 වසරේ අය වැය යෝජනා මගින් හෙක්ටයාරයකට රුපියල් 250,000 දක්වා වැඩි කිරීමට යෝජනා විය.

(v) පස සාරවත් කිරීම රහිතව තේ අළුත් වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 195,000 ක් ලෙසට වැඩිකිරීමට තීරණය කරන ලදී.

## 2. ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය.

2.1. **කුඩා තේ ඉඩම්** :

තේ පාලන පනතට අනුව " අක්කර 10 ට අඩු තේ ඉඩම් කුඩා තේ ඉඩම්" ලෙස සැලකේ. එසේ වුවද ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ පැවති අක්කර 10 -50 දක්වා වූ තේ ඉඩම් සඳහා සංවර්ධන කටයුතු කිරීමේ බලතල 1978 ජනවාරි මස 01 දා සිට කුඩා තේවතු සංවර්ධන අධිකාරිය වෙත ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පවරන ලදී. ඒ අනුව පුද්ගලික අයිතිය යටතේ ඇති අක්කර 50 ට අඩු සියළුම තේ ඉඩම්වල සංවර්ධනය සඳහා අදාල සහායක සේවාවන් ආයතනය විසින් මෙතෙක් සපයා තිබුණි.

2011/2012 වසරවලදී අක්කර 10 සිට 50 දක්වූ බිම් ප්‍රමාණ සඳහා ඉඩම් සංවර්ධන සේවා සැපයීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙතත්, ව්‍යාප්ති සේවා සැපයීම ශ්‍රී ලංකා තේ පරේෂණායතනය වෙතත් පවරා ඇත. ඒ අනුව 2012 වර්ෂයේ සිට පනතෙහි පවතින ප්‍රතිපාදන පරිදි අක්කර 10 ට අඩු තේ බිම් සඳහා පමණක් ඒවායේ සංවර්ධනයට සහ ඊට අදාල සහායක සේවාවන් ආයතනය විසින් සපයන ලදී.

2.2. **කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය** :

2005 කුඩා තේ වතු සංගණනය පරිදි කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය වූ හෙක්ටයාර් 132,329 ද ( පර්චස් 20 අඩු භූමි සහිතව ) සහිතව ශ්‍රී ලංකාවේ සමස්ත තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර් *221,968 ක් පමණ වනු ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත තේ භූමි ප්‍රමාණයෙන් 59% ක් කුඩා තේ ඉඩම් අංශයට අයත් වේ. 1994 / 95 කුඩා තේ ඉඩම් සංගණන තොරතුරු හා සසඳා බැලීමේදී දශකයක කාල පරිච්ඡේදයක් තුල ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 82,919 සිට හෙක්ටයාර් 116,492 දක්වා ( පර්චස් 20 ට වැඩි ඉඩම් පමණි.) එනම් 40% කින් පමණ වැඩිවී ඇත.

සමස්ත කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 132,329 කි. (පර්චස් 20 ට අඩු භූමිද සහිතව) මෙයින් හෙක්ටයාර 7,310 ක් අත්හැරදමා ඇති තේ ඉඩම් වේ. ඉතිරි තේ භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 118,275 මේරූ හා නොමේරූ තේ ඉඩම් වේ. පර්චර් 20 අඩු බිම් ප්‍රමාණයන් හැර මේරූ හා නොමේරූ මුලු තේ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 116,492 කි. තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ පාදක තොරතුරු සමීක්ෂණය - 2011 පරිදි හෙක්ටයාර් 340 ප්‍රමාණයක් 2011 වසර සඳහා තේ වගාවට අලුතින් එකතුවී තිබේ. 2012 වර්ෂය අවසාන වන විට නව වගා බිම් ප්‍රමාණය වූ හෙක්ටයාර 291 ද ඇතුළුව ඇස්තමේන්තුගත මුළු කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 120,955 කි.

**රූ සටහන අංක 01**

**මුළු තේ ඉඩම් ප්‍රමාණයට කුඩා තේ ඉඩම් හි දායකත්වය**




මූලාශ්‍ර
* ශ්‍රී ලංකා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තාව 1994 / 1995 - ශ්‍රී ලංකා තේ මණ්ඩලය
* කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණනය 2005 - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

2.3. **කුඩා තේ ඉඩම් හිමියෝ.**

2005 වසර වන විට කුඩා තේ හිමියන් සංඛ්‍යාව 370,842 කි. (පර්චස් 20 වඩා අඩු වගාකරුවන්ද ඇතුළුව) මොවුන්ගෙන් 82% ක් තනි අයිතිය යටතේ වූ ඉඩම් හිමි කුඩා තේ වතු හිමියන් වන අතර, මෙම පිරිස සඳහා තේ වගා භූමි ප්‍රමාණයෙන් 76% ක් පමණ අයත් වේ. තේ පරීක්ෂක කොට්ඨාශ පාදක තොරතුරු ඇස්තමේන්තු පරිදි 2012 වසර තුළ ගොවීන් 785 දෙනෙකු තේ වගාව සඳහා අලුතින් එකතුවී ඇත.

2.4. **කුඩා තේ ඉඩම් සංඛ්‍යාව.**

1994 සිට 2005 වසර දක්වා කාලය තුළ සමස්ත කුඩා තේ ඉඩම් සංඛ්‍යාව 206,652 සිට 350,982 (පර්චස් 20 වැඩි) දක්වා එනම් 70% කින් වැඩිවී ඇත. ශ්‍රී ලංකාවේ ඇති කුඩා තේ ඉඩම් කැබලි ප්‍රමාණයෙන් 11.6% ක් පර්චස් 20 ට වඩා අඩු ඉඩම් කැබලි වන අතර ඒවා මුළු තේ බිම් ප්‍රමාණයෙන් 1.5% ක් ආවරණය වේ. කුඩා තේ ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් 75% ක් අක්කරයට අඩු ඉඩම් කැබලි වන අතර, 95% ක් අක්කර දෙකකට වඩා අඩු ඉඩම් කැබලි ගණයට අයත් වේ. අක්කර 10 ට වැඩි ඉඩම් ප්‍රතිශතය 0.78% ක් වූ ඉතා සුළු ප්‍රමාණයකි.

2005 වසරේ සංගණනය පරිදි සමස්ත කුඩා තේ ඉඩම් කැබලි සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය විසිරීම පහත පරිදි වේ.

**වගු අංක 1**

**ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් අනුව කුඩා තේ ඉඩම් කැබලි සංඛ්‍යාව - 2005**

| දිස්ත්‍රික්කය | කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව | කුඩා තේ ඉඩම් සංඛ්‍යාව | හෙක්. ගණන | ඉඩම් සංඛ්‍යාව / ඒකකය හෙක්. ප්‍රමාණය අනුව | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | <1/2 අඩු | 1/2 - < 1 | 1 - < 2 | 2 - < 3 | 3 - < 5 | 5 - < 10 | >10 - |
| කොළඹ | 478 | 491 | 246 | 423 | 35 | 22 | 4 | 4 | 2 | 1 |
| ගම්පහ | 9 | 9 | 2 | 9 | - | - | - | - | - | - |
| කළුතර | 35,908 | 38,263 | 7,823 | 35,793 | 1,927 | 396 | 74 | 38 | 26 | 9 |
| මහනුවර | 29,224 | 30,747 | 16,058 | 25,457 | 3,345 | 1,094 | 353 | 206 | 140 | 152 |
| මාතලේ | 1,387 | 1,408 | 1,672 | 1,011 | 166 | 81 | 40 | 38 | 41 | 31 |
| නුවරඑළිය | 16,875 | 17,547 | 7,205 | 15,270 | 1,663 | 302 | 100 | 77 | 55 | 80 |
| ගාල්ල | 81,491 | 90,524 | 27,427 | 79,432 | 8,296 | 1,840 | 467 | 276 | 166 | 47 |
| මාතර | 63,273 | 67,613 | 25,417 | 58,470 | 6,835 | 1,296 | 430 | 290 | 176 | 116 |
| හම්බන්තොට | 2,386 | 2,533 | 546 | 2,373 | 141 | 14 | 4 | 1 | - | - |
| කුරුණෑගල | 145 | 151 | 180 | 111 | 23 | 8 | 3 | 2 | - | 4 |
| බදුල්ල | 28,101 | 29,679 | 9,020 | 26,989 | 1,747 | 574 | 182 | 85 | 56 | 46 |
| මොණරාගල | 634 | 637 | 199 | 551 | 72 | 11 | 1 | 2 | - | - |
| රත්නපුර | 92,038 | 97,984 | 30,441 | 87,070 | 7,910 | 1,880 | 530 | 345 | 141 | 108 |
| කෑගල්ල | 18,893 | 19,637 | 6,093 | 17,333 | 1,680 | 400 | 98 | 65 | 31 | 30 |
| **එකතුව** | **370,842** | **397,223** | **132,329** | **350,292** | **33,840** | **7,918** | **2,286** | **1,429** | **834** | **624** |
| **ප්‍රතිශතය** | | | | **88.19** | **8.52** | **1.99** | **0.57** | **0.36** | **0.21** | **0.16** |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණනය – 2005**

කුඩා තේ ඉඩම් අංශයේ තේ ඉඩම් වර්ධනය සඳහා විශේෂයෙන් අමුදලු සඳහා ලැබෙන මිල ඉහල යාම , තේ වගාව සඳහා දිරි දීමනා මුදල වැඩි කිරීම, විශාල ඉඩම් කැබලි කිරීම සහ විකල්ප වගා නොමැති ඉඩම් තේ වගාවට යොමුවීම යන කරුණු බලපා තිබේ.

## 2.5. භූමි වර්ගීකරණය

* කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණයෙන් අක්කර 113,190 ( 34.6% ) අක්කර එකකට වඩා අඩු තේ ඉඩම් වන අතර, අක්කර 198,707 ( 60.8% ) අක්කර දෙකකට වඩා අඩු තේ ඉඩම් වේ. අක්කර 10 ට වැඩි තේ ඉඩම් ප්‍රමාණය අක්කර 59,731 කි. ( 18.3 % )

**වගු අංක 2**

**ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය සහ කැබලි සංඛ්‍යාව අනුව වර්ගීකරණය - 2005**

| අක්කර | භූමි ප්‍රමාණය අක්කර | % | ඉඩම් කැබලි සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 1 ට අඩු | 113,190 | 34.6 | 297,342 | 75 |
| 1 - 2 ට අඩු | 85,517 | 26.2 | 74,314 | 18.7 |
| 2 - 3 ට අඩු | 31,882 | 9.8 | 15,101 | 3.8 |
| 3 - 5 ට අඩු | 18,413 | 5.6 | 5,299 | 1.3 |
| 5 - 10 ට අඩු | 18,251 | 5.5 | 2,936 | 0.7 |
| 10 සහ වැඩි | 59,731 | 18.3 | 2,231 | 0.5 |
| | **326,984** | | **397,223** | |

**මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තාව**

## 2.6. කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය :

1991 වර්ෂයේ ජාතික තේ නිෂ්පාදනයෙන් 50% ක දායකත්වය දැරූ කුඩා තේ වතු අංශය, වසර 2012 වන විට සිය දායකත්වය 71.4% ක් දක්වා වර්ධනය කරගෙන තිබේ. (උප ලේඛන අංක 04)

2012 වසරේ ජාතික තේ නිෂ්පාදනය කිලෝ මිලියන 326.27 කි. මෙය 2011 වසරට සාපේක්ෂව 0.38% කින් අඩුවී තිබේ.

එහෙත් කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය කිලෝ මිලියන 229.01 සිට 233.1 දක්වා එනම් 1.78% කින් 2012 වසරේදී වැඩි වී තිබේ. 2000 වසරේ 60% ක්ව පැවති කුඩා වතු අංශයේ ජාතික නිෂ්පාදන දායකත්ව ප්‍රතිශතය 2011 වසරේ 69.92 ක් වී ඇති අතර 2012 වසරේ දී එය 71.4% දක්වා වර්ධනය වී තිබුනි.

**වගු අංක 3**
**ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය - 2011 / 2012**
**කළමනාකාරිත්ව ආයතන අනුව දායකත්වය**

| | කළමනාකාරිත්ව ආයතන | තේ නිෂ්පාදනය මෙ. ටො. 2011 | % | 2012 | % |
|---|---|---|---|---|---|
| 01 | පෞද්ගලික අංශය(කුඩා තේ අංශය) | 229,016 | 69.92 | 233,106 | 71.40 |
| 02 | ප්‍රාදේශීය වැවිලි සමාගම් | 94,402 | 28.82 | 89,2160 | 27.30 |
| 03 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය<br>රාජ්‍ය වැවිලි සංස්ථාව | 3,615 | 1.10 | 3,529 | 1.08 |
| 04 | අනෙකුත් | 498 | 0.16 | 427 | 0.13 |
| | **මුළු එකතුව** | **327,531** | | **326,278** | |

(අනෙකුත් = තේ ශක්ති , ටි ස්මොල් හොල්ඩර් ෆැක්ටරීස් ලිමිටඩ් ,ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය, සමුපකාර, ඇල්කඩුව ප්ලාන්ටේෂන් , කළුබෝවිටියන තේ කම්හල් සමාගම)

මුලාශ්‍රය :- ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

( ආයතන වර්ගිකරණයෙහි මිලදි ගත් දළු සියල්ලම කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනයට ඇතුලත් කර ඇත. මෙහිදි පෞද්ගලික අංශය යන්න කුඩා තේ ඉඩම් අංශය ලෙස සලකා ඇත.)

**රූප සටහන් අංක 02**
**කළමනාකාරිත්ව ආයතන අනුව නිෂ්පාදන දායකත්ව ප්‍රතිශතය - 2012**



**රූප සටහන් අංක 03**

**කුඩා තේ වතු අංශයේ මාසික තේ නිෂ්පාදනය -කිලෝ මිලියන**

**( 2011 / 2012 )**




මූලාශ්‍රය :- ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

**රූප සටහන් අංක 04**

**කුඩා තේ වතු අංශයේ වාර්ෂික තේ නිෂ්පාදන ප්‍රවනතාවන්**

**2000 - 2012 දක්වා (කිලෝ මිලියන)**




මූලාශ්‍රය :- ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

## 2.7. කුඩා තේ ඉඩම් නිෂ්පාදන සංයුතිය

2012 වර්ෂයේ ජාතික නිෂ්පාදනයෙහි පහත රට තේ නිෂ්පාදනයෙන් 95% ක්ද, මැදරට මුළු නිෂ්පාදනයෙන් 59% ක්ද, උඩරට මුලු නිෂ්පාදනයෙන් 15% ක්ද කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනයෙන් සමන්විත වී තිබුණි. (වගු අංක 04) තවද 2012 වසරේදී ද පුද්ගලික අංශයේ සමස්ත තේ නිෂ්පාදනයෙන් 82% ක් ම පහතරට තේ නිෂ්පාදනයට අයත් විය.

2011 වර්ෂය හා සසඳන කල 2012 වර්ෂයේදී කුඩා තේ ඉඩම් අංශයේ උඩරට තේ නිෂ්පාදනය 15% කින් අඩුවී ඇති අතර, මැදරට තේ නිෂ්පාදනය 5% කින්ද පහත රට තේ නිෂ්පාදනය 2% කින් ද වැඩිවී තිබේ.

**වගු අංක 04**

**කුඩා තේ ඉඩම් අංශයේ භෞතික හා නිෂ්පාදන දායකත්වය ( පිහිටීම මත )**

**2011/ 2012**

| | | | පිහිටීම | | | |
|---|---|---|---|---|---|---|
| | | වර්ෂය | උඩරට | මැදරට | පහත රට | එකතුව |
| කුඩා තේ බිම් ප්‍රමාණය | (හෙක්ටයාර) | | 5913 | 21403 | 89176 | 116492 |
| දායක ප්‍රතිශතය | % | | 5 | 18 | 77 | |
| ජාතික නිෂ්පාදනය | මෙ.ටො | 2011 | 78219 | 52591 | 196721 | 327531 |
| | % | | 24 | 16 | 60 | |
| | මෙ.ටො | 2012 | 72739 | 52293 | 201246 | 326278 |
| | % | | | | | |
| කුඩා තේ නිෂ්පාදනය | මෙ.ටො | 2011 | 12909 | 29427 | 186680 | 229016 |
| | % | | 5.6 | 12.8 | 81.6 | |
| | මෙ.ටො | 2012 | 11066 | 30969 | 191071 | 233106 |
| | % | | 4.7 | 13.3 | 82 | |
| ජාතික නිෂ්පාදනයට දායකත්වය | % | 2011 | 3.94 | 8.98 | 57 | 69.92 |
| | | 2012 | 3.39 | 9.49 | 28.56 | 71.44 |
| ඵලදායිතාවය | වසරකට / හෙකටයාරයකට/ සකස්කල තේ | 2011 | 2183 | 1375 | 2093 | 1966 |
| | | 2012 | 1872 | 1447 | 2142 | 2001 |

**මූලාශ්‍රය**

i. කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තාව 2005 - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ii. මාසික සංඛ්‍යාන සාරාංශය - ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2012

**2.8. කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය.**

2011 සහ 2012 වසර දෙකෙහිද ජාතික තේ නිෂ්පාදනයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වර්ධනය විමයි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ නිෂ්පාදනය පිළිබඳ දත්ත පරිදි 2011 වසරේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායිතාවය වසරකට හෙක්ටයාරයකට නිමි තේ කිලෝ 1,966 කි. 2012 වසරේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට නිමිතේ කි.ග්‍රෑ. 2001 දක්වා වර්ධනය වී තිබේ.

**වගු අංක 05**

**කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය 2012 ( නිමි තේ / කිලෝ )**
**පරිපාලන දිස්ත්‍රික් පදනමින්**

| පරිපාලන දිස්ත්‍රික්කය | කුඩා තේ බිම් ප්‍රමාණය (හෙක්:) | උස් බිම් | මැදි බිම් | පහත් බිම් | එකතුව | ඵලදායිතාවය (හෙක්:01ට නිමි තේ කිලෝ )* |
|---|---|---|---|---|---|---|
| බදුල්ල | 7,863 | 3,731,237 | 6,072,439 | - | 9,803,676 | 1,247 |
| ගාල්ල | 25,325 | - | - | 47,710,384 | 47,710,384 | 1,884 |
| හම්බන්තොට | 492 | - | - | 284,332 | 284,332 | 578 |
| කළුතර | 7,588 | - | - | 17,408,260 | 17,408,260 | 2,294 |
| මහනුවර | 12,486 | 157,202 | 15,403,904 | 10,015,336 | 25,576,442 | *2,048 |
| කෑගල්ල | 5,753 | - | 278,734 | 9,588,819 | 9,867,553 | 1,721 |
| මාතලේ | 1,190 | - | 923,588 | 522,932 | 1,446,520 | 1,215 |
| මාතර | 22,971 | - | 100,676 | 41,981,546 | 42,082,222 | 1,832 |
| නුවරඑළිය | 5,971 | 7,165,393 | 7,106,932 | 828,544 | 15,100,869 | *2,529 |
| රත්නපුර | 28,232 | 12,399 | 1,083,099 | 62,730,365 | 63,825,863 | 2,261 |
| එකතුව | - | **11,066,231** | **30,696,372** | **191,070,517** | **233,106,120** | **-** |
| **2005 සංගණනය පාදකව බිම් ප්‍රමාණය | - | **5,913** | **21,403** | **89,176** | **116,492** | **-** |
| ඇස්තමේන්තු ගත සාමාන්‍ය ඵලදායිතාව/ හෙක්ටයාරයකට | 2012 | 1,871 | 1,447 | 2,143 | 2,001 | - |
| | 2011 | 2,183 | 1,375 | 2,093 | 1,966 | - |

මූලාශ්‍රය:- ශ්‍රී ලංකා තේ මණ්ඩලය

* පරිපාලන දිස්ත්‍රික් පදනමට පරිබාහිරව කම්හල්වලට අමු දළු මිලදී ගැනීම මත දත්ත යථාරූපි නොවේ

** මේරූ තේ භූමි ප්‍රමාණය

## 2.9 කුඩා තේ අංශයේ ආයෝජනයන්

2012 වර්ෂයේ සංවර්ධන හා ආයතනික ප්‍රාග්ධන පිරිවැය ලෙස රුපියල් මිලියන 221.37 ක් ද, පුනරාවර්ථන වියදම් ලෙස රුපියල් මිලියන 224.18 ක් ද වනසේ රුපියල් මිලියන 445.55 ක මුදලක් ඒකාබද්ධ අරමුදලින් ආයතනය සඳහා වෙන්කර තිබුනි.

2012 වසර සඳහා ලද ප්‍රාග්ධන මුදල රුපියල් මිලියන 199 ක් හා පුනරාවර්තන වියදම රුපියල් මිලියන 219.83 අනුව සමස්ත ලැබීම් රුපියල් මිලියන 418.83 ක් විය.

ඉහත ප්‍රතිපාදනයෙන් කුඩා තේ වතු අංශය සඳහා වූ සමස්ත ප්‍රාග්ධන පිරිවැය රුපියල් මිලියන 225 ක මුදල ආයතනික වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මේ සංවර්ධන කාර්යන් සඳහා ප්‍රමාණවත් නොවූ බැවින්, රුපියල් මිලියන 150 ක අමතර ප්‍රතිපාදන ආයතනයට ලබාදීමේ එකගතාව මත සමස්ත සංවර්ධන හා ආයතනික ප්‍රාග්ධන ප්‍රතිපාදන රුපියල් මිලියන 371.37 සඳහා ප්‍රාග්ධන සංවර්ධන කටයුතු වසර තුලදී ක්‍රියාත්මක කරන ලදී.

මෙහිදී ප්‍රතිපාදිත මුදලින් වැඩිම ප්‍රමාණයක් එනම් 86% ක් වෙන්කරනු ලැබුයේ තේ නැවත වගා සංවර්ධන කාර්ය වෙනුවෙනි.

කෙසේ වුවද අදාල වර්ෂය වෙනුවෙන් ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 199 ක් පමණක් ඒකාබද්ධ අරමුදලින් ලැබුනි. අපේක්ෂාකල අමතර ප්‍රතිපාදන වූ රුපියල් මිලියන 150 ක මුදල නොලැබුනි. නමුත් මුළු සංවර්ධන ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 276.32 ක් විය. ඒ අනුව රුපියල් මිලියන 88.98 ක සහනාධාර මුදල් ප්‍රමාණය උපචිත වියදම් ලෙස ඉදිරි වර්ෂයට ගෙනයාමට ආයතනයට සිදුවිය.

ඉහත පසුබිම යටතේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ලැබීම් හා වාර්ෂික පිරිවැයද, ඇස්තමේන්තුගත සංවර්ධන ඉලක්ක හා කාර්යවිලයද ඍජු ලෙස ආයතනයේ මෙහෙයුම් සමාලෝචනය සඳහා යොදාගැනීම යාථාරූපී නොවේ.

කුඩා තේවතු අංශය සඳහා ආයෝජන කටයුතු මෙහෙයවීම පිණිස ආයතනික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමද ඊට සමාගාමීව සිදුකල යුතු වුවද ප්‍රතිපාදන සීමාව තුල එම කාර්යන් සඳහා ආයතනය විසින් ප්‍රමුඛතාවය ලබාදී නොමැත.

## වගු අංක 06

## පුද්ගලික අංශයේ තේ නිෂ්පාදනය සහ

## ප්‍රතිපාදිත සෙස් අරමුදල - 1998 – 2012

| වර්ෂය | සමස්ත තේ නිෂ්පාදනය ( කි.ග්‍රෑ.මි.) | සමස්ත නිෂ්පාදන දායකත්වය % | | සෙස් මුදල ( රු. මිලි. ) | පුද්ගලික අංශය (කුඩා තේ ඉඩම් අංශය ) සඳහා ප්‍රතිපාදන සෙස් මුදල (රු. මිලි. ) | ප්‍රතිපාදිත අරමුදලේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | පුද්ගලික අංශය | අනෙකුත් අංශ | | | |
| 1998 | 280.05 | 59.2 | 46.1 | 680.3 | 188.5 | 27.7 |
| 1999 | 283.76 | 57.8 | 42.2 | 651.1 | 247.9 | 33.0 |
| 2000 | 305.84 | 60.0 | 40.0 | 701.2 | 259.4 | 37.0 |
| 2001 | 295.09 | 62.1 | 37.9 | 741.0 | 274.5 | 37.0 |
| 2002 | 310.01 | 61.1 | 38.9 | 767.5 | 230.2 | 30.0 |
| 2003 | 303.23 | 61.9 | 38.1 | 739.6 | 332.0 | 37.0 |
| 2004 | 308.08 | 65.9 | 34.1 | 753.8 | 371.6 | 43.7/39.5 |
| 2005 | 317.19 | 64.8 | 35.1 | 771.1 | 290.68 | 39.5 |
| 2006 | 310.82 | 68.3 | 26.1 | 1088.4 | 461.56 | 39.51/43.28 |
| 2007 | 304.61 | 67.5 | 26.2 | - | **426.00 (ලද සැබෑ මුදල රු 418.00 කි) | - |
| 2008 | 318.46 | 67.4 | 25.9 | 1294.64 | 405.30 | - |
| 2009 | 291.13 | 69.3 | 24.8 | 1360.40 | 367.80 | - |
| 2010 | 331.42 | 69.4 | 23.8 | 1193.98 | 394.93 | - |
| 2011 | 327.53 | 69.9 | 30.1 | | 391.59 | |
| 2012 | 326.27 | 71.4 | 28.6 | | 418.83 | |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

** 2007 වර්ෂයේ සිට ප්‍රතිපාදන භාණ්ඩාගාරයේ අරමුදලින් ලැබී ඇත.

**මෙහෙයුම් සමාලෝචනය**

2011 වර්ෂයට සාපේක්ෂව 2012 වසරේ මෙහෙයුම් සමාලෝචනය අනුව මෙහෙයුම් පිරිවැය 0.19 කින් අඩු වී තිබේ. එහෙත් සමස්ත ලැබීම් අඩුවීම මත සංවර්ධන පිරිවැය හා මෙහෙයුම් පිරිවැය අගය යථාරූපී බවක් පෙන්නුම් නොකෙරේ.

තවද ආයතනික ප්‍රාග්ධන වියදම් හා සම්පත් නඩත්තු කිරීම හා මානව සම්පත් සංවර්ධන යන කාර්යයන් සඳහා ප්‍රතිපාදනයන් සීමාවීම නිසා දිගු කාලීනව මෙහෙයුම් පිරිවැය වැඩිවීමේ අවධානමක් ද දැකිය හැක.

**වගු අංක 7**

**මෙහෙයුම් සමාලෝචනය ( 1995 සිට 2012 දක්වා )**

| වර්ෂය | සංවර්ධන පිරිවැය රු. '000 | මෙහෙයුම් පිරිවැය රු. '000 | සංවර්ධන රුපියලක් සඳහා මෙහෙයුම් පිරිවැය. |
|---|---|---|---|
| 1995 | 79821 | 59150 | 0.74 |
| 1996 | 52665 | 58095 | 1.10 |
| 1997 | 63379 | 70547 | 1.11 |
| 1998 | 101191 | 127080 | 1.26 |
| 1999 | 153503 | 116822 | 0.76 |
| 2000 | 115575 | 128460 | 1.11 |
| 2001 | 112839 | 142654 | 1.26 |
| 2002 ** | 166982 | 188126 | 1.13 |
| 2003 | 170134 | 155216 | 0.91 |
| 2004 | 215430 | 156809 | 0.73 |
| 2005 | 192263 | *158695 | 0.83 |
| ***2006 | 198118 | *186396 | 0.94 |
| 2007 | 183782 | 178985 | 0.97 |
| 2008 | 208255 | 188725 | 0.91 |
| 2009 | 185660 | 202146 | 1.08 |
| 2010 | 189194 | 205385 | 1.08 |
| 2011 | 208407 | 218527 | 1.04 |
| 2012 | 276324 | 233738 | 0.85 |

** 2002 වර්ෂය දක්වා ව්‍යාපෘති පිරිවැයද ඇතුලත්ව මෙහෙයුම් පිරිවැය ගණනය කර ඇත.

+ මෙහෙයුම් පිරිවැය උපචිත පදනම යටතේ ගණනය කර ඇත.

## 3. ව්‍යවස්ථාපිත අරමුණු හා ප්‍රතිඵල පාදක සංවර්ධන කාර්යයන්

ආයතනයේ ව්‍යවස්ථාපිත අරමුණු හා බැඳුනු සංවර්ධන කාර්යයන් පහත පරිදි වේ.

01. කුඩා තේ වතු වල සහ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතු වලද සංවර්ධනයට අනුබල දීම හෝ සංවර්ධනය කිරීමට භාර ගැනීම

මෙම ව්‍යවස්ථාපිත අරමුණ ඉටු කිරීම පරමාර්ථ කර ආයතනය විසින් කුඩා තේ ඉඩම් හිමියන් සඳහා පහත සඳහන් සංවර්ධන කාර්යන් ක්‍රියාත්මක කර තිබේ.

01 තේ නැවත වගා දිරි දීමනා ක්‍රමය
02 තේ අළුත් වගා දිරි දීමනා ක්‍රමය
03 භෝග පුනරත්ථාපන දිරි දීමනා ක්‍රමය
04 රබර් සමග තේ වගා කිරීම
05 පොල් සමග තේ වගා කිරීම

02. එම තේ ඉඩම් වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්ත ශාලා සඳහා වෙනත් පහසුකම් අත්කර ගැනීම

මෙම ව්‍යවස්ථාපිත අරමුණ යටතේ අධිකාරිය විසින් 1997 වසරේදී " තේ ශක්ති අරමුදල " පිහිටවනු ලැබූ අතර 2000 වසරේ සිට එය වෙනම ආයතනයක් වශයෙන් ඉහත අරමුණ වෙනුවෙන් අදාල කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

03. මෙම තේ ඉඩම්වල හෝ එකී කර්මාන්ත ශාලාවල කෙරෙන නිෂ්පාදන අලෙවිය දියුණු කිරීම හෝ අලෙවි කිරීම භාරගැනීම

මෙම ව්‍යවස්ථාපිත අරමුණ වෙනුවෙන්

කුඩා තේ වතු හිමියන් දළු සපයන කම්හල්හි අමුදළු ගුණාත්මය වර්ධනය කිරීම
කුඩා තේ දළු නිෂ්පාදිත තේ කම්හල්වල මිල අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම
කුඩා තේ වතු වල නිෂ්පාදිත දළු අලෙවිය සඳහා කුඩා තේ වතු සංවර්ධන සමිති මෙහෙයවීම

04. එකී ඉඩම් හා කර්මාන්තශාලා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වියහැකි පහසුකම් සහ සේවාවන් සපයාදීම හෝ ලබාදීම නැතහොත් එම පහසුකම් හා සේවාවන් ලබාදීම පහසු කිරීම සඳහා ද තේ ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීමෙහි හෝ ඇසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ගේ සුභසිද්ධිය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

මේ යටතේ ,

01. තේ පොහොර බෙදාහැරීම , වැවිලි ද්‍රව්‍ය , උපකරණ හා ප්‍රවාහන සේවා පහසුකම් ලබාදීම වැනි උපකාරක සේවාවන් ක්‍රියාත්මක කිරීම

02. ව්‍යාප්ති හා උපදේශක සේවාවන් ක්‍රියාත්මක කිරීම

03. දළු එකතු කිරීමේ සමිති මධ්‍යස්ථාන පිහිටුවීම

04. තේ ඉඩම් වල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීමෙහි යෙදී සිටින්නන්ගේ සුභ සිද්ධිය සඳහා පියවර ගැනීම සහ සහායක සේවා පුළුල් කිරීමේ අරමුණින් කුඩා තේ වතු සංවර්ධන සමිති නීතිගත සංවිධාන වශයෙන් පිලිගැනීම පිණිස සමිති ලියාපදිංචි කිරීම සහ ඒවායේ කටයුතු පිළිබඳ රෙගුලාසි පැනවීම.

05. කුඩා තේ වතු සංවර්ධන සමිති ප්‍රජා මූලික සංවිධාන වශයෙන් ශක්තිමත් කිරීම සහ කුඩා තේ ඉඩම් හිමියන් තම ඉඩමේ අමතර ආදායම් ඉපයීමේ කටයුතු සඳහා යොමුකිරීම

ඉහත සඳහන් කාර්යන් මගින් ව්‍යවස්ථාපිත අරමුණු ඉටු කිරීම සඳහා ආයතනය විසින් 2012 වසර සඳහා ද අදාල සංවර්ධන කාර්යයන් හා එමගින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම පිණිස ආයතනය විසින් හඳුනාගත් (20 වන පිටුවෙහි සඳහන්) මධ්‍යකාලීන සංවර්ධන ප්‍රතිඵල ඉලක්ක කරගෙන කටයුතු කරන ලදී.

## ක්‍රියාත්මක සැලැස්ම හා ප්‍රායෝගික ගැටළු

කුඩා තේවතු ක්ෂේත්‍රය වෙනුවෙන් ආයතනය අරමුණු කල සංවර්ධන ප්‍රතිඵල ලඟාකරගැනීම පිණිස 2012 වසරේදී සංවර්ධන කාර්යන් වෙනුවෙන් සැලසුම්කල ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 350.8 ක් විය. ඒකාබද්ධ අරමුදලින් නියමිත ප්‍රතිපාදන වූ රුපියල් මිලියන 225 ප්‍රමාණවත් නොවූ බැවින් අමතර රුපියල් මිලියන 150 ක ප්‍රතිපාදන ලබාගත හැකිවනු ඇතැයි යන එකගතාවය මත රුපියල් මිලියන 371.3 ක් සඳහා අදාල සංවර්ධන හා ආයතනික ප්‍රාග්ධන ප්‍රතිපාදන අපේක්ෂිතව ඉලක්ක පිලියෙල කරනු ලැබින.

එහෙත් අපේක්ෂිත අතිරේක ප්‍රතිපාදන රුපියල් මිලියන 150 මුදල ආයතනයට නොලැබුන අතර, වගා කන්න පරිදි ක්ෂේත්‍ර කටයුතු සිදුවන බැවින් හා අඛණ්ඩ ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු වලදී නියමිත ක්ෂේත්‍ර කාර්යයට හිමි වාරික මුදල් නියමිත අවස්ථාවලට සපයාදීමට ප්‍රතිපාදන ලැබීම අත්‍යාවශ්‍ය කාර්යක් වුවද, එසේ නොලැබීම ආයතනයට මුහුණපෑමට සිදුවූ ප්‍රායෝගික ගැටළුවක් වුනි.

පෙර වර්ෂවල සීමිත ප්‍රතිපාදන හේතුවෙන් ක්ෂේත්‍ර ඉලක්ක හෙක්ටයාර 1000 ට අඩුවෙන් තේ නැවත වගා කිරීම සඳහා ඇස්තමේන්තු කලද 2012 වසර සඳහා අමතර ප්‍රතිපාදන අපේක්ෂාවෙන් හෙක්ටයාර 1511 ක් තේ නැවත වගාව සඳහා උදුරා දැමීම සඳහා ඉලක්ක කරන ලදි. ජාතික අවශ්‍යතාවය මත 2% ක් එනම් හෙක්ටයාර 2300 ක් පමණ නැවත වගාව සඳහා ඇස්තමේන්තුකල යුතු නමුදු ඉහත සඳහන් ප්‍රතිපාදන පදනමින් 2012 වසර සඳහා එම ජාතික අවශ්‍යතාවයෙන් 1.3% ක ප්‍රමාණයක් නැවත වගාව සඳහා උදුරා දැමීමට ඉලක්ක කිරීමට හැකිවිය. එහෙත් මෙයින් හෙක්ටයාර 1087 ක් නැතහොත් ඉලක්කගත භූමි ප්‍රමාණයෙන් 72% ක් පමණක් අදාල වර්ෂයතුලදී ආයතනයට සපුරාගත හැකි විය.

එමෙන්ම පස පුනරුත්ථාපනය පළමු වාරිකය සඳහා හෙක්ටයාර 1359 ක් ඉලක්ක කලද එහි කාර්යඵලය හෙක්ටයාර 960 ක් හෙවත් 71% කි. පෙර වර්ෂ වලදී ප්‍රතිපාදන සීමිත වූ බැවින් අවම මට්ටමක ඉලක්ක පිහිටුවීම අනුව පස පුනරුත්ථාපනය දෙවන වාරිකයේ කාර්යඵලය හෙක්ටයාර 888.5 ක් එනම් ඉලක්කගත භූමි ප්‍රමාණය වූ හෙක්ටයාර 900 න් 99% කි. එමෙන්ම තේ නැවත වගාව නිමකලයුතු භූමි ප්‍රමාණය හෙක්ටයාර 900 ක් ඉලක්ක කරනු ලැබූ අතර, එහි කාර්යඵල ප්‍රගතිය 99% ක් නැතහොත් හෙක්ටයාර 889.1 කි. වසරකට පසු නඩත්තු කටයුතු ඉලක්කය හෙක්ටයාර 850 කි. එහි කාර්යඵලය හෙක්ටයාර 806 ක් එනම් 95% ක ප්‍රගතියකි.

ආයතනය විසින් හඳුනාගනු ලැබූ සංවර්ධනාත්මක ප්‍රතිඵල ලගාකරගැනීම පිණිස අපේක්ෂිත ඉලක්ක කරා ආයතනය ගමන්කරමින් සිටීද යන්න මැනීම පිණිස ආයතනය සකස්කර ඇති කාර්යපාදක දර්ශකතුලින් ඇගයීමට කටයුතු කරනු ලැබේ.

**මධ්‍යකාලින ප්‍රතිඵල පාදක ඉලක්ක හා කාර්යඵලය**

## 3.1. මධ්‍යකාලින ප්‍රතිඵල - 01

### වසර 06කදී වසරකට / හෙක්ටයාරයකට / සකස්කල තේ / කිලෝ පහත රට 2700 දක්වා ද මැද රට 1700 දක්වාද ඌව 1500 දක්වාද වැඩි කිරීම

#### 3.1.1 වාර්ෂිකව 2% මට්ටමින් තේ නැවත වගාව පවත්වාගෙන යාම

කුඩා තේ ඉඩම් වල තේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීම පිණිස අඩු අස්වනු සහිත පැරණි බීජ තේ ඉඩම් හි නැවත අනුමත රිකිලි තේ වගා කිරීමට අනුබල දීම මෙම දිරි දීමනාව මගින් අපේක්ෂා කරනු ලැබේ. උස් / මැදි හා පහත් බිම් යන සියළු බිම් සඳහා හෙක්ටයාරයකට රු.300,000/- ක් වනසේ වාරික වශයෙන් පහත පරිදි හෙක්ටයාර එකක උපරිම බිම් ප්‍රමාණයක් සඳහා ආධාර මුදල් ගෙවන ලදි. නැවත වගා කිරීමේ පිරිවැයට අනුව සමස්ත වගා පිරිවැයෙන් 14% දක්වා පමණ ප්‍රමාණයක් දිරි දීමනා මගින් ආවරණයවීම ප්‍රමාණවත් නොවූ බැවින්, අදාල සහනාධාර මුදල පහත සඳහන් වාරික පදනමින් වැඩි කිරීමට ප්‍රතිපත්තිමය වශයෙන් තිරණය කරන ලදි.

**තේ නැවත වගා සහනාධාර වාරික මුදල - හෙක්ටයාරයකට**

| | |
|---|---|
| පැරණි තේ උදුරා දැමීම | රු. 80000 |
| පස පුනරුත්ථාපනය 1 වන වාරිකය | රු. 30000 |
| පස පුනරුත්ථාපනය 2 වන වාරිකය | රු.120000 |
| තේ නැවත වගාව | රු. 40000 |
| පළමු වසර නඩත්තුව | රු. 30000 |
| මුළු මුදල | රු.300000 |

**රූප සටහන් අංක - 05**

**තේ නැවත වගා ආධාර මුදල වැඩි කිරීම/ හෙක්ටයාරයකට 1979 සිට**



**නැවත වගාව සඳහා අයදුම් කිරීම**

2012 වසරේ ක්‍රියාත්මක සැලැස්ම පරිදි තේ නැවත වගාව වෙනුවෙන් ගොවීන් 13330 දෙනෙකුගෙන් පමණ අයදුම්පත්‍ර ලබාගැනීම සඳහා ඉලක්ක කරනු ලැබූ නමුදු ගොවීන් 12349 දෙනෙකු නැවත වගාව සඳහා අයදුම් කර තිබුණි. එමගින් උදුරා දැමීමට අපේක්ෂිත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 3271 ක් විය. මෙයින් ගොවීන් 11889 දෙනෙකු සඳහා අවසර පත්‍ර 2012 වසරේදී නිකුත් කරනු ලැබිණ. මෙමගින් ආවරණය වූ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2648 කි.

**රූප සටහන් අංක - 06**

**වගා ආධාර සඳහා වාර්ෂිකව අයදුම් කිරීම 2000 - 2012**




**කාර්යඵලය**

පෙර වර්ෂය හා සසඳන විට ( වගු අංක 08 ) නැවත වගා ආධාර ක්‍රමය සඳහා අයදුම් කිරීම 20% කින් වැඩිවී තිබේ. අයවැය ප්‍රතිපාදන පරිදි උදුරා දැමීම සඳහා ඉලක්කගත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 1511 ක් වුවද හෙක්ටයාර් 1087 ක් පමණක් උදුරා දැමීම නිමකර තිබුනි. උදුරා දැමීමේ ප්‍රගතිය පෙර වර්ෂයට සාපේක්ෂව 15% කින් වැඩිවී තිබුනද, වාර්ෂික ඉලක්කගත භූමි ප්‍රමාණය අනුව 72% ක ප්‍රගතියක් අත්කරගෙන තිබේ. පස පුනරුත්ථාපනය පළමු වාරික ඉලක්කය හෙක්ටයාර් 1359 ක් වුවද, කාර්යඵලය හෙක්ටයාර් 960 කි. මෙය ඉලක්කගත භූමි ප්‍රමාණයෙන් 71% ක ප්‍රගතියකි. පස පුනරුත්ථාපන දෙවන වාරිකය හා නැවත වගා වාර්ෂික ඉලක්කයන් හෙක්ටයාර් 900 බැගින් වූ අතර, එහි කාර්යඵලයන්ද හෙක්ටයාර් 889 බැගින් විය. එය වාර්ෂික ඉලක්කයෙන් 99% ක ප්‍රගතියකි.

තේ නැවත වගා කිරීම සඳහා අදාල වර්ෂයේදී ආයතනය විසින් රු.මිලියන 226.83 ක් ගෙවා ඇත. මෙය පෙර වර්ෂය හා සසඳන විට ( සහනාධාර වාරිකය වැඩිවීම මත ) 20.9% කින් වැඩි වී තිබේ. ගොවීන් සඳහා කෘෂි උපකරණ ලබාදීම වෙනුවෙන් රුපියල් මිලියන 3.949 ක් ද, තේ සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය ණය අරමුදල් ක්‍රමය යටතේ තේ නැවත වගාකල ගොවීන් සඳහා පොලී සහනාධාර වශයෙන් රුපියල් මිලියන 0.112 ක් ද ඇතුළුව සමස්ත වශයෙන් රුපියල් මිලියන 230.898 ක් තේ නැවත වගාව වෙනුවෙන් වැයකර ඇත.

## 08 වන වගුව

## තේ නැවත වගා ආධාර ක්‍රමය

## 2011 / 2012 වර්ෂයේ භෞතික කාර්යඵලය ( හෙක්ටයාර්)

| කාර්යය | වර්ෂය | පහත් බිම් | | | | | උස් / මැදි බිම් | | | එකතුව | වාර්ෂික ඉලක්කය | පෙර වර්ෂය හා සැසඳිමේදී ප්‍රගතිය අඩු /වැඩි වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | | |
| 1. ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | 2012 | 2305 | 526 | 2254 | 3052 | 941 | 1420 | 781 | 1070 | 12349 | 13330 | 20 |
| | 2011 | 1761 | 384 | 1549 | 2432 | 870 | 1366 | 731 | 1228 | 10321 | 11365 | 19 |
| 2. නිකුත් කළ අවසර පත්‍ර සංඛ්‍යාව | 2012 | 2145 | 517 | 2178 | 2938 | 901 | 1329 | 805 | 1076 | 11889 | 11200 | 30 |
| | 2011 | 1214 | 335 | 1476 | 2103 | 731 | 1296 | 847 | 1178 | 9180 | 10062 | 18 |
| 3. අවසර පත්‍ර ආවරණය වු බිම් ප්‍රමාණය | 2012 | 496 | 151 | 553 | 508 | 202 | 290 | 234 | 214 | 2648 | 1795 | 17 |
| | 2011 | 337 | 102 | 394 | 539 | 150 | 267 | 254 | 220 | 2263 | 1668 | 19 |
| 4. බිම් සැකසිම | 2012 | 196 | 51 | 221 | 241 | 85 | 91 | 93 | 109 | 1087 | 1511 | 15 |
| | 2011 | 171 | 44 | 188 | 202 | 87 | 87 | 94 | 74 | 947 | 399 | (7) |
| 5. පස පුනරුත්ථාපනය | 2012 | 186 | 34 | 181 | 183 | 56 | 102 | 81 | 67 | 889 | 900 | (1.3) |
| | 2011 | 162 | 31 | 172 | 174 | 79 | 96 | 108 | 79 | 901 | 824 | (6) |
| 6. තේ නැවත වගා කිරීම | 2012 | 171 | 29 | 198 | 193 | 58 | 81 | 71 | 88 | 889 | 900 | 15 |
| | 2011 | 167 | 30 | 154 | 141 | 74 | 69 | 90 | 47 | 772 | 845 | (9) |
| 7. ගෙවන ලද වගා ආධාර මුදල ( රුපි. මිලියන ) | 2012 | 44.13 | 7.82 | 45.75 | 52.63 | 16.57 | 22.56 | 19.59 | 17.77 | *226.83 | 300.17 | 21 |
| | 2011 | 35.21 | 6.98 | 36.18 | 36.73 | 16.34 | 20.80 | 19.52 | 15.88 | 187.64 | 145.24 | 4.8 |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

* කෘෂි උපකරණ සඳහා රු:මිලියන 3.949 හා පොලී සහනාධාර ලෙස රු:මිලියන 0.112 ක් ද ඇතුළුව ගෙවන ලද මුළු සහනාධාර මුදල රු:මිලියන 230.898 කි.

* * IFAD ව්‍යාපෘතිය ඇතුළුව උදුරා දැමීම හෙක්ටයාර 1133 ක්ද පස පුනරත්ථාපනය හෙක්ටයාර 942 ක්ද තේ නැවත වගාව හෙක්ටයාර 937 ක්ද 2012 වසරේ දී නිමකර තිබේ.

**රූප සටහන් අංක - 07**

**තේ නැවත වගා ආධාර ගෙවීම්හි වාර්ෂික ප්‍රගතිය ( රු. ද. ල. )**

**1993 – 2012**




* සෙස් මුදල සංශෝධනය වීම මත ප්‍රතිශතය දැක්විය නොහැක.

### 3.2.1 භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය

ඒකක ඵලදායිතාවය වර්ධනය කිරීම අරමුණු කර දලු නෙලන රිකිලි තේ ඉඩම් වල නිර්දේශිත කප්පාදුව අනුගමනය කිරීමේදී පාළු සම්පූර්ණ කිරීම, පස සංරක්ෂණ ක්‍රම (කාණු පද්ධති/ ගල් වැටි පිළිසකර කිරීම) හා සෙවන පාලනය කිරීම ඇතුළු අනෙකුත් වගා පිළිවෙත් ඒකාබද්ධව සිදු කිරීම (සෙවන ,කප්පාදුව, වල්පැල නෙලීම ) වෙනුවෙන් භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය යටතේ දිරි දීමනා ගෙවනු ලැබේ.

ඉදිරි වර්ෂ 10 ක කාලයක් තුළ සාර්ථක ලෙස තේ වගාව පවත්වාගෙන යාහැකි ඉඩම් මෙම ආධාර ක්‍රමය සඳහා නිර්දේශ කරනු ලබන අතර, තේ ඉඩම් දෙවන කප්පාදු අවස්ථාවට එළඹ තිබීම හෝ වගාවේ වයස අවුරුදු 07 ඉක්මවා තිබීම, ආධාර ලබා ගැනීම සඳහා සුදුසුකම් වේ.

මෙම ආධාර ක්‍රමය යටතේ සමූහ වශයෙන් පිහිටි, පාළු සපයා දලු නෙලන තේ වගාව පුනරුත්ථාපනය කිරීමේ පදනම මත උඩරට / මැදරට අක්කරයකට පැල 1,000 ක් සහ පහත රට අක්කරයකට පැල 750 ක උපරිමයකට යටත්ව පැලයකට රු. 25/- බැගින් වාරික 2 කදී ආධාර ගෙවීම කරනු ලැබේ.

**කාර්යඵලය**

2011 වර්ෂය සම- සසඳන විට මෙම ආධාර ක්‍රමය සඳහා අයදුම් කිරීම 34% කින් ද, අවසර පත්‍ර නිකුත් කිරීම 44% කින් ද වැඩිවී තිබුණි. එහෙත් වාර්ෂික ඉලක්කගත පැල සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව 49% කින් අඩුවී තිබේ.

සීමිත ප්‍රතිපාදන හා අය වැය ඇස්තමේන්තු සංශෝධනය වීම මත වාර්ෂික ඉලක්කගත පැල සංඛ්‍යාව 377,400 සීමා කල නමුදු, අමාත්‍යාංශ ප්‍රගති සමාලෝචනයේදී ගනු ලැබූ තීරණ පරිදි පාළු සැපයීමේ අවශ්‍යතාවය සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කරන ලදි. ඒ අනුව ඉලක්කගත පැල සංඛ්‍යාව 1,005,840 ක් විය. මේ නිසා පැල 377,400 ක් වූ පළමු ඉලක්කය ඉක්මවා ක්ෂේත්‍ර ප්‍රගතිය පැල 766,991 දක්වා වැඩිකර ගැනීමට හැකි විය. ඒ අනුව සංශෝධිත වාර්ෂික ඉලක්කයට අනුව ප්‍රගතිය 76% කි. ( වගු අංක 09 )

දෙවන වාරිකය ලබාගත් පැළ සංඛ්‍යාව 345,152 කි. මෙය ප්‍රමුඛතාවය සැලසීමේ ඉහත අවශ්‍යතාවය අනුව ඉලක්කගත පැල සංඛ්‍යාව වූ 517584 න් 67% ප්‍රගතියකි. මෙය 2011 වසර තුළ පළමු වාරිකය ලබාගත් පැළ සංඛ්‍යාවෙන් 68% ප්‍රගතියකි. 2012 වසරේ භෝග පුනරුත්ථාපනය කිරීම සඳහා දිරිදීමනා ලෙස රුපියල් මිලියන 14.355 ක් ගෙවා තිබේ. පෙර වර්ෂයට සාපේක්ෂව ගෙවනු ලැබූ සහනාධාර මුදල 126%කින් වැඩිවී තිබේ.

## 09 වන වගුව

## භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය

## 2011 - 2012 වර්ෂයේ භෞතික කාර්යඵලය ( හෙක්ටයාර් )

| කාර්යය | වර්ෂය | පහත් බිම් | | | | | උස් / මැදි බිම් | | | එකතුව | ඉලක්ක | පෙර වර්ෂය හා සැසඳීමේදී අඩු/වැඩි වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | | |
| 1. ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | 2012 | 1193 | 411 | 713 | 493 | 216 | 612 | 278 | 314 | 4230 | | |
| | 2011 | 651 | 105 | 521 | 650 | 209 | 434 | 231 | 288 | 3089 | - | 32 |
| 2. නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව | 2012 | 932 | 409 | 621 | 852 | 198 | 490 | 212 | 311 | 3625 | | 44 |
| | 2011 | 476 | 80 | 422 | 490 | 149 | 310 | 312 | 272 | 2511 | | 76 |
| 3 ඉලක්ක ගත පැල සංඛ්‍යාව | 2012 | 172500 | 106000 | 249440 | 100000 | 31200 | 243500 | 54600 | 48600 | 1005840 | | (23) |
| | 2011 | 238122 | 40293 | 242823 | 289858 | 76243 | 197550 | 171479 | 123366 | 1379734 | | 79 |
| 4 1 පළමු වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව | 2012 | 133644 | 60968 | 127287 | 122012 | 49787 | 118985 | 73210 | 81098 | 766991 | 1005840 | (1.7) |
| | 2011 | 82878 | 17047 | 93011 | 110643 | 46089 | 64648 | 57361 | 32645 | 504322 | 529372 | 19 |
| 2 දෙවන වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව | 2012 | 67293 | 18969 | 58671 | 71151 | 23473 | 64893 | 22317 | 18385 | 345152 | 517584 | 9.6 |
| | 2011 | 15218 | 17698 | 24698 | 47010 | 7577 | 36735 | 30830 | 2635 | 182401 | 424227 | (28) |
| 5. ගෙවන ලද ආධාර මුදල(රුපි. මිලියන ) | 2012 | 2.373 | 0.741 | 2.616 | 2.394 | 0.977 | 2.430 | 1.323 | 1.499 | 14.355 | 8.66 | 127 |
| | 2011 | 0.984 | 0.278 | 1.026 | 1.539 | 0.629 | 1.064 | 0.455 | 0.354 | 6.329 | 9.24 | 76 |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

**රූප සටහන් අංක - 08**

**භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය**

**ගෙවීම්හි ප්‍රගතිය ( 1993 - 2012 )**




* සෙස් මුදල සංශෝධනය වීම මත ප්‍රතිශත වශයෙන් දැක්විය නොහැක.

### 3.2.3 තේ අළුත් වගා ආධාර ක්‍රමය

ප්‍රතිපත්තිමය තිරණ මත 2003 වර්ෂයේ සිට අත්හිටවනු ලැබූ තේ අළුත් වගා ආධාර ක්‍රමය 2010 වර්ෂයේ සිට නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතුකර ඇත. ඒ අනුව විකල්ප බෝග හා ආදායම් මාර්ග නොමැති ප්‍රදේශ සඳහා සීමිත ප්‍රතිපාදන යටතේ තේ අළුත් වගාව කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරන ලදී. අළුත් වගාව සඳහා 2011 වසර අවසානය දක්වා හෙක්ටයාරයකට ගෙවනු ලැබූ සහනාධාර මුදල රුපියල් 150,000/- කි.

### කාර්යඵලය

2012 වසරේදී හෙක්ටයාර 735 ක් සඳහා ඉල්ලුම්පත් ලැබී තිබුන අතර හෙක්ටයාර 517 ක් ආවරණය වන පරිදි අවසර පත්‍ර නිකුත් කර තිබුනි. 2012 වසරතුල හෙක්ටයාර 200 ක් අළුත් වගා කිරීම සඳහා ඉලක්ක කරනු ලැබූ අතර අළුත් වගාව නිමකල බිම් ප්‍රමාණය හෙක්ටයාර 239 ක් විය. තේ අළුත් වගාව සඳහා ගෙවූ සහනාධාර මුදල රුපියල් මිලියන 23.2 කි.

අළුත් වගාව සඳහා ගෙවූ සහනාධාර මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉඩම් හිමියන් සහනාධාර සහිතව තේ අළුත් වගාව කෙරෙහි යොමුවීම අඩුවී තිබුනි. 2012 වසරේ දී 2013 වර්ෂයට නියමිත ජාතික අයවැය යෝජනා මගින් හෙක්ටයාර 01 ක් සඳහා මෙම සහනාධාර මුදල රු.250,000/- දක්වා වැඩිකිරීමට යෝජනා කරන ලදී.

තවද අළුත් අවසරපත්‍රලාභියකු සඳහා සහනාධාර යටතේ තේ අළුත් වගාව යටතේ පැවති උපරිම බිම් ප්‍රමාණය අක්කර 1/2 සිට අක්කර 01 දක්වා වැඩිකිරීමට වසරතුලදී ප්‍රතිපත්තිමය වශයෙන් තිරණය කරනු ලැබිණි.

**10 වන වගුව**

**තේ අළුත් වගා ආධාර ක්‍රමය**

**2011/2012 වර්ෂයේ භෞතික කායඝීඵලය ( හෙක්ටයාර් )**

| කාර්යය | වර්ෂය | පහත් බිම් | | | | | උස් / මැදි බිම් | | | එකතුව | ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | |
| 3. ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | 2011 | - | 270 | - | - | 212 | - | - | - | 482 | |
| | 2012 | 293 | 1113 | 423 | 598 | 549 | 158 | 65 | 109 | 3308 | |
| 4. නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව | 2011 | - | 256 | - | - | 174 | - | - | - | 430 | |
| | 2012 | 257 | 937 | 385 | 582 | 493 | 158 | 70 | 110 | 2990 | |
| 3 බිම් සැකසීම | 2011 | - | 17.46 | - | - | 10.67 | - | - | - | 28.14 | 50 |
| | 2012 | 16.00 | 70.00 | 31.00 | 72.00 | 46.00 | 11.00 | 6.00 | 8.00 | 260.00 | 200 |
| 4 වගාව | 2011 | - | 17.80 | - | - | 10.58 | - | - | - | 28.38 | 50 |
| | 2012 | 16.00 | 69.00 | 31.00 | 60.00 | 45.00 | 6.00 | 5.00 | 7.00 | 239.00 | |
| 5. ගෙවන ලද ආධාර මුදල ( රුපි. මිලියන ) | 2011 | - | 0.573 | - | - | 0.613 | - | - | - | 1.186 | 2.5 |
| | 2012 | 0.740 | 4.583 | 3.526 | 7.809 | 4.707 | 0.714 | 0.220 | 0.904 | 23.206 | 24 |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

**ගුණාත්මක තේ පැල සැපයීම.**

වැඩි දියුණු කල නව තේ ප්‍රභේද සහිත මව් වගා පවත්වාගෙන යාම

තේ නිෂ්පාදනය හා ඵලදායිතාව වර්ධනය කර ගැනිම සඳහා ගුණාත්මක බවින් යුත් රෝපණ ද්‍රව්‍ය කුඩා තේ වතු හිමියන්ට ලබාගැනිමට පහසුකම් සලසාලිම ආයතනයේ සැලකිය යුතු වැදගත් උපාය මාර්ගයකි. ඒ අනුව වැඩි දියුණු කල ප්‍රභේද සහිත ගුණාත්මක බවින් යුත් මව් වගාවන් ආයතනය විසින් පවත්වා ගනිමින් කුඩා තේ වතු හිමියන්ට, වාණිජ තේ තවාන් කරුවන්ට සහ ආයතනයේ තේ තවාන් සඳහා අතු 249327 සැපයීමට කටයුතු කරන ලදි. මව් වගා මගින් වැඩි දියුණු කල නව ප්‍රභේද රිකිලි අතු නිකුත් කල ආකාරය පිළිබඳ සවිස්තර තොරතුරු උපලේඛන අංක 9 - A හි දක්වා ඇත. මෙම කාර්යන් වෙනුවෙන් රුපියල් මිලියන 1.246 ක් වැයකර තිබේ.

**වාණිජ තේ තවාන්**

තේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීම අරමුණු කර ගුණාත්මක පැල කුඩා තේ වතු හිමියන් වෙත ලබාගැනිමට පහසු කරවීම සඳහා ගුණාත්මක බවින් යුත් වාණිජ තේ තවාන් ආයතනයේ ලියාපදිංචි තේ තවාන් වශයෙන් පවත්වාගෙන යාම හා අධීක්ෂණය ඉතා වැදගත් වේ. ඒ අනුව 2012 වසරේදී ප්‍රාදේශිය කාර්යාල මගින් වාණිජ තේ තවාන් 969 ක් පහත පරිදි ලියාපදිංචි කරනු ලැබූ අතර එම තවාන්හි පැල ධාරිතාවය පැල මිලියන 39.41 කි. මෙම තවාන් හි සහතික කරනු ලැබූ පැල සංඛ්‍යාවන්හි ප්‍රගතිය වගු අංක 9-C මගින් දැක්වේ.

**වගුව - 10**

**වාණිජ තේ තවාන් සඳහා අවසර පත් නිකුතුව සහ පැල ධාරිතාවය ( 2011 - 2012 )**

| ප්‍රදේශය | නිකුත් කල අවසර පත්‍ර ගණන | | පැල ධාරිතාවය (මිලියන) | |
|---|---|---|---|---|
| | **2011** | **2012** | **2011** | **2012** |
| මාතර | 117 | 165 | 3.692 | 5.457 |
| රත්නපුර | 82 | 176 | 4.385 | 8.378 |
| කෑගල්ල | 110 | 52 | 5.982 | 2.880 |
| මහනුවර | 111 | 113 | 4.342 | 4.444 |
| ගාල්ල | 142 | 136 | 3.903 | 4.487 |
| නුවරඑළිය | - | 172 | - | 9.028 |
| ඌව | 64 | 128 | 1.811 | 3.656 |
| කළුතර | 37 | 27 | 1.286 | 1.081 |
| **එකතුව** | **663** | **969** | **25.401** | **39.412** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

**ආයතනික තේ තවාන්**

කුඩා තේ වතු හිමියන්ට අවශ්‍ය තේ පැල මිලදී ගැනීමේදී වෙළඳපල මිල ගණන් පාලනය කර ගැනීම හා ගුණාත්මක පැල නිෂ්පාදනය පවත්වාගෙන යාම ආදර්ශ ලෙස පැවතිය යුතුවීම අරමුණු කර ආයතනික තේ තවාන් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව 2012 වසරේ පවත්වාගෙන යනු ලැබූ තවාන් 07 මගින් රිකිලි තේ පැල 591973 ක් නිෂ්පාදනය කරන ලදී. අලෙවිකරනු ලැබූ සමස්ත පැල සංඛ්‍යාව 514676 කි. තවාන් මට්ටමින් පැලයක අලෙවි මිල උපලේඛණ අංක 9 - B හි දක්වා ඇත.

**3.1.4 ව්‍යාප්ති හා උපදෙස් පුහුණු වැඩසටහන්**

සමස්ත වශයෙන් ව්‍යාප්ති හා පුහුණු උපදෙස් වැඩසටහන් 6846 ක් වර්ෂය සඳහා සැලසුම්කල අතර ක්‍රියාත්මක කල වැඩසටහන් සංඛ්‍යාව 6508 කි. මේ සඳහා සහභාගීත්වය අපේක්ෂාකල ගොවි සංඛ්‍යාව 175289 කි. සහභාගි ගොවි සංඛ්‍යාව 143456 කි.

තේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීම සඳහා ව්‍යාප්ති හා උපදේශක සේවා ලබාදීම පිණිස 2012 වසරේදී සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් ගණන 5487 කි. පවත්වනු ලැබූ වැඩසටහන් ගණන 5455 කි. මේ අනුව ඉලක්කගත වැඩසටහන් පරිදි වාර්ෂික ප්‍රගතිය 99% කි. එම වැඩසටහන් සඳහා ගොවීන් 131147 දෙනෙකු ඉලක්ක කරනු ලැබූ අතර සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව 111640 කි. (වගු අංක -11)

**වගුව - 11- i**
**ව්‍යාප්ති හා උපදේශ සේවා - ඵලදායිතා වර්ධනය**
**පුහුණු වැඩසටහන් සංඛ්‍යාව-(1) සහ සහභාගි සංඛ්‍යාව-(2)**

| ප්‍රාදේශිය කාර්යාලය | | වැඩ සටහන් අවසර පත්‍ර හිමියන් දැනුවත් කිරීමේ පුහුණුව(1.1.6) | යෙදවුම් තවාන් සඳහා පුහුණුව (1.1.15) | වාණිජ තවාන් කරුවන් පුහුණුව (1.1.19) | තේ වගාව පිළිබඳ පුහුණුව (1.1.25) | දළු නෙලීම පිළිබඳ පුහුණුව (1.2.6) | කප්පාදුව පිළිබඳ පුහුණුව (1.3.3) | කප්පාදු හැකියා වර්ධන පුහුණුව (1.3.7) | පාංශු කළමණාකරණය පිළිබඳ පුහුණුව (1.4.2) | සෙවන ස්ථාපනය හා කළමණාකරනය පිළිබඳ පුහුණුව (1.5.2) | පෝශක කළමණාකරණය (1.6.1) | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගාල්ල | 1 | 83 | 11 | 27 | 76 | 227 | 82 | 52 | 114 | 126 | 129 | **927** |
| | 2 | 2068 | 182 | 427 | 2195 | 4431 | 1787 | 906 | 2471 | 2649 | 2825 | **19941** |
| මාතර | 1 | 63 | 28 | 20 | 78 | 136 | 73 | 17 | 161 | 155 | 166 | **897** |
| | 2 | 1889 | 514 | 326 | 2282 | 3089 | 1834 | 358 | 4185 | 4502 | 4984 | **23963** |
| කළුතර | 1 | 60 | 16 | 0 | 36 | 168 | 104 | 47 | 90 | 132 | 134 | **787** |
| | 2 | 923 | 133 | 0 | 524 | 2267 | 1826 | 635 | 1379 | 1747 | 2485 | **11919** |
| කැගල්ල | 1 | 42 | 10 | 3 | 34 | 68 | 41 | 31 | 65 | 87 | 61 | **442** |
| | 2 | 900 | 169 | 29 | 735 | 1257 | 771 | 643 | 1436 | 1617 | 1191 | **8748** |
| මහනුවර | 1 | 54 | 16 | 14 | 33 | 91 | 35 | 28 | 70 | 66 | 63 | **470** |
| | 2 | 1128 | 181 | 153 | 672 | 1662 | 620 | 495 | 1283 | 1044 | 1462 | **8700** |
| නුවරඑළිය | 1 | 145 | 20 | 14 | 78 | 69 | 69 | 18 | 59 | 55 | 24 | **551** |
| | 2 | 3691 | 308 | 192 | 1713 | 1315 | 1143 | 251 | 1293 | 892 | 529 | **11327** |
| රත්නපුර | 1 | 62 | 21 | 24 | 38 | 143 | 113 | 52 | 133 | 111 | 128 | **825** |
| | 2 | 1703 | 212 | 231 | 777 | 2432 | 2112 | 890 | 2433 | 1962 | 2571 | **15323** |
| ඌව | 1 | 67 | 23 | 17 | 26 | 114 | 78 | 21 | 67 | 67 | 76 | **556** |
| | 2 | 1340 | 324 | 169 | 544 | 2477 | 1743 | 429 | 1589 | 1533 | 1571 | **11719** |
| **එකතුව** | **1** | **576** | **145** | **119** | **399** | **1016** | **595** | **266** | **759** | **799** | **781** | **5455** |
| | **2** | **13642** | **2023** | **1527** | **9442** | **18930** | **11836** | **4607** | **16069** | **15946** | **17618** | **111640** |
| **ඉලක්කය** | 1 | **448** | **204** | **113** | **280** | **1106** | **614** | **283** | **733** | **839** | **867** | **5487** |
| | **2** | **11808** | **3710** | **1053** | **6835** | **25419** | **14673** | **4316** | **17507** | **22033** | **23793** | **131147** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

ඉහත ව්‍යාප්ති සේවා කටයුතුවලට අමතරව තේ ඉඩම්වල පාංශු ආම්ලිකතාව (Soil pH ) පිළිබඳ පස් සාම්පල් පරීක්ෂාවන් 16235 ක් නිමකර ඇති අතර මෙහි ප්‍රගතිය ඉලක්ක ගත පරීක්ෂණ සංඛ්‍යාවෙන් 70% කි. එමෙන්ම ඒකපුද්ගල ව්‍යාප්ති සේවා 31890 ක් සැලසුම්කර තිබූ අතර, එහි ප්‍රගතිය 27843 කි. මෙය ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාවෙන් 87% ක ප්‍රගතියකි.

**වගුව - 11-ii**

**ඒක පුද්ගල ව්‍යාප්ති කටයුතු හා පාංශු පරීක්ෂණ සංඛ්‍යාව**

| ප්‍රාදේශීය කාර්යාලය | | ගාල්ල | මාතර | කළුතර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | රත්නපුර | ඌව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඒකපුද්ගල ව්‍යාප්ති | ඉලක්කය | 6900 | 6100 | 2160 | 2170 | 2000 | 3000 | 7000 | 2560 | **31890** |
| | ප්‍රගතිය | 6448 | 5664 | 2064 | 2028 | 1738 | 1923 | 5552 | 2429 | **27843** |
| පාංශු පරීක්ෂාව | ඉලක්කය | 4000 | 4500 | 1860 | 1959 | 1945 | 2300 | 2858 | 3835 | **23257** |
| | ප්‍රගතිය | 2421 | 3351 | 1817 | 1562 | 1174 | 445 | 2511 | 2954 | **16235** |

මුලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

## මධ්‍යකාලීන ප්‍රතිඵල - 02

### වසර 5 කදී කම්හල් මට්ටමින් අමු දළු ගුණාත්මය 75% දක්වා වර්ධනය කිරීම

කුඩා තේ වතු හිමියන්ගේ ආදායම වර්ධනය කරවීමට නම් වැඩි ඵලදාවක් සමග අවම නිෂ්පාදන පිරිවැය හා ඉහල වෙළඳපල මිල ඉතා වැදගත් සාධක වේ. නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා ජාතික පොහොර සහනාධාර ක්‍රමය මගින් අඩු මිලට පොහොර ලබාගැනීමට ගොවීනට හැකිවී ඇති නමුදු, අමු දළු සඳහා ඉහල වෙළඳපල මිල ලබාගැනීම සඳහා ගුණාත්මක බවින් යුතු අමු දළු නිෂ්පාදනය වර්ධනය විය යුතු වේ.

දළු ගුණාත්මය වර්ධනය කිරීම සඳහා දළු නෙලන්නන් 10000 ක් පුහුණු කරවීමත්, ගුණාත්මක දළු පමණක් කම්හල් සඳහා භාර ගැනීම අනිවාර්ය කෙරෙන නීති රීති පද්ධතින් ප්‍රවර්ධනය කිරීමත්, දළු සපයන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, සහ දළු ගුණාත්මය පිළිබඳ කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීම යන කටයුතු මෙම ප්‍රතිඵලය ලබාගැනීම සඳහා අපේක්ෂිත ක්‍රියාකාරකම් විය. ඒ අනුව 2012 වසරේදී දළු ගුණාත්මය වර්ධනය කිරීම පිණිස පුහුණු වැඩසටහන් 475 ක් සැලසුම් කරනු ලැබූ අතර වැඩසටහන් 313 ක් ක්‍රියාත්මක කර ඇත. (වගු අංක 12) වාර්ෂික ඉලක්කයට අනුව එහි ප්‍රගතිය 66%කි. සහභාගී ගොවීන් සංඛ්‍යාව 14974 වූ අතර ඉලක්කගත ගොවීන් සංඛ්‍යාව 23280 කි. මේ අනුව සහභාගීත්වයේ ප්‍රගතිය 64% කි.

## වගුව - 12
## දළු ගුණාත්මය වර්ධන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සහ සහභාගී ගොවි සංඛ්‍යාව

| ප්‍රාදේශිය කාර්යාලය | අයිතමය | දළු නෙලන්නන් පුහුණුව (2.2.2) | දළු සපයන්නන් දැනුවත් කිරීම පිළිබඳ පුහුණුව (2.3.4) | දළු ගුණාත්මය පිළිබඳ පුහුණුව (2.5.2) | එකතුව |
|---|---|---|---|---|---|
| ගාල්ල | වැඩසටහන් | 132 | 8 | 46 | **186** |
| | සහභාගිත්වය | 2918 | 583 | 3129 | **6630** |
| මාතර | වැඩසටහන් | 93 | 37 | 52 | **182** |
| | සහභාගිත්වය | 1895 | 1837 | 4786 | **8518** |
| කළුතර | වැඩසටහන් | 66 | 17 | 13 | **96** |
| | සහභාගිත්වය | 887 | 492 | 434 | **1813** |
| කෑගල්ල | වැඩසටහන් | 46 | 4 | 26 | **76** |
| | සහභාගිත්වය | 807 | 59 | 559 | **1425** |
| මහනුවර | වැඩසටහන් | 25 | 3 | 33 | **61** |
| | සහභාගිත්වය | 405 | 108 | 1862 | **2375** |
| නුවරඑළිය | වැඩසටහන් | 27 | 18 | 14 | **59** |
| | සහභාගිත්වය | 495 | 437 | 458 | **1390** |
| රත්නපුර | වැඩසටහන් | 57 | 45 | 76 | **178** |
| | සහභාගිත්වය | 1017 | 1280 | 1789 | **4086** |
| ඌව | වැඩසටහන් | 57 | 32 | 53 | **142** |
| | සහභාගිත්වය | 1142 | 807 | 1957 | **3906** |
| **එකතුව** | **වැඩසටහන්** | **503** | **164** | **313** | **980** |
| | **සහභාගිත්වය** | **9566** | **5603** | **14974** | **30143** |
| **ඉලක්කය** | **වැඩසටහන්** | **602** | **150** | **475** | **1227** |
| | **සහභාගිත්වය** | **11465** | **8249** | **23280** | **42994** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

අපේක්ෂිත ප්‍රතිඵල මැනීම සඳහා කම්හල් මට්ටමින් හොඳ දළු ප්‍රතිශතය යන දර්ශකය යොදගනු ලබන අතර, එම ප්‍රතිඵල සාර්ථකත්වය පිණිස අධිකාරිය මෙන්ම ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි, තේ කොමසාරිස් අංශය හා ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය සමග ඒකාබද්ධ ප්‍රයත්නයක් යොදමින් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

සමස්ත වශයෙන් ව්‍යාප්ති උපදෙස් හා පුහුණු වැඩසටහන් සඳහා රුපියල් මිලියන 4.636 ක් වැයකර ඇත. එයින් පුහුණු ද්‍රව්‍ය සඳහා රුපියල් මිලියන 0.196 ක් වැයකර තිබුනි.

## මධ්‍යකාලීන ප්‍රතිඵල - 03

### වසර 06 ක් තුළ ප්‍රජා මූලික සංවිධාන 50% කින් ශක්තිමත් කිරීම

1989 වර්ෂයේ අග භාගයේදී ආරම්භ කරනු ලැබූ කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රමය නීතිගත සංවිධාන බවට පත් කිරීම සඳහා 1991 අංක 36 දරණ පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරණ කුඩා තේවතු සංවර්ධන පනතෙහි 15 වන වගන්තියේ 2 වන උප වගන්තියේ (ඔ ඕ) ජේදය යටතේ පැවරී ඇති බලතල අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් අංක 878/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1995 අංක 01 දරණ කුඩා තේ වතු සංවර්ධන සමිති රීති ප්‍රකාශයට පත්කරන ලදී.

2012 වසර අවසානය වන විට කුඩා තේ වතු සංවර්ධන සමිති 1381 ක් ලියාපදිංචිව තිබූ අතර එයට අයත් සාමාජිකයන් සංඛ්‍යාව 261493 ක් වන අතර එම තොරතුරු පහත පරිදි විය.

**13 වන වගුව**

**කුඩා තේවතු සංවර්ධන සමිති ව්‍යාප්තිය**

**2011/2012**

| කාර්යාලීය බල ප්‍රදේශය | සමිති සංඛ්‍යාව | | සාමාජික සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | **2011** | **2012** | **2011** | **2012** |
| රත්නපුරය | 284 | 284 | 87,941 | 763,42 |
| ඌව(බදුල්ල සහ මොණරාගල) | 160 | 161 | 21,348 | 21,484 |
| නුවරඑළිය | 183 | 186 | 18,589 | 17,952 |
| මහනුවර සහ මාතලේ | 144 | 141 | 12,336 | 12,379 |
| ගාල්ල | 208 | 208 | 47,790 | 46,293 |
| මාතර සහ හම්බන්තොට | 176 | 177 | 45,638 | 43,176 |
| කෑගල්ල | 127 | 127 | 18,660 | 18,671 |
| කළුතර | 97 | 97 | 21,859 | 25,196 |
| **එකතුව** | **1,379** | **1381** | **274,161** | **261,493** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

2011 වර්ෂය හා සසඳන විට 2012 වර්ෂයේදී සමිති සංඛ්‍යාව 2 කින් හෙවත් 0.1% කින් වැඩි වීමක්ද සාමාජික සංඛ්‍යාවේ 4.6% ක අඩුවීමක්ද දැකිය හැක. 2012 වසර තුල සමිති සංවර්ධන කටයුතු සඳහා රු.මිලියන 1.5 ක මුදලක් ප්‍රතිපාදනය කරන ලද අතර එම සමස්ත මුදලම ආයතනය විසින් වැයකර තිබුණි.

ප්‍රජා මූලික සංවිධාන ශක්තිමත් කිරීම සඳහා කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රියාකාරීත්වයට අදාල සුදුසු නීතිමය වෙනස්කම් කිරීම, සෑම වසර තුනකදීම සමිති 400 ක ක්‍රියාකාරීත්වය සාඵල්‍ය ලෙස වර්ධනය කිරීම, සමිති නිලධාරීන්ගේ ආකල්පමය වෙනස්කම් ඇති කිරීම, සමිති සඳහා සාර්ථක නියමුකරණ ක්‍රමයක් ඇති කිරීම සහ කුඩා තේ වතු සමිති වල ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා චක්‍රිය අරමුදලක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම ආයතනය අපේක්ෂා කරන ලද කටයුතු විය.

2012 වසරේදී, ගම් මට්ටමේ කුඩා තේවතු සංවර්ධන සමිති ප්‍රතිසංවිධානය යටතේ තේරී පත්වූ නිලධාරීන් සඳහා එක්දින පුහුණු වැඩසටහන බැගින් සියළුම සමිති බල ප්‍රදේශ සඳහා පුහුණු වැඩසටහන් 67 ක් පවත්වන ලදී. මෙහිදී මෙම වැඩසටහනට සහභාගී වූ සමිති නායකයන් දැනුවත් කිරීම සඳහා සමිත ආශ්‍රිත කාර්යභාරය, සමිති ආශ්‍රිත ව්‍යාප්ති කාර්යභාරය හා සමිති කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම යන තේමාවන් යටතේ දේශන හා විවෘත සාකච්ඡාවාර මගින් සමිති මෙහෙයවීමේදී පවරා ඇති කාර්යභාරය පිළිබඳ අවබෝධය ලබාදීම සිදුකරන ලදී.

**සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය**

දිස්ත්‍රික් සංවිධාන 08 ක් හා සමස්ත ලංකා සමිති සංවිධානයකින්ද යුතුව මෙම තේ සමිති පද්ධතිය සමන්විත වේ. මෙහිදී ප්‍රාදේශිය සංවිධාන වල කාර්යයන් පහසුකරවීම, තේ ශක්ති සුභසාධන ක්‍රියාවලිය පවත්වාගෙන යාම, ජාතික තේ පොහොර සහනධාර ක්‍රමය ක්‍රියාත්මක වූ අවස්ථාවේදී ඒ සඳහා මැදිහත්ව කටයුතු කිරීම ද, ප්‍රාථමික සමිති සාමාජිකයනට යහපත් සේවාවන් ඉටුකිරීම වෙනුවෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව ව්‍යාප්ති වැඩසටහන් සඳහා සහායවීම වැනි සේවාවන් ඉටුකිරීම සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානයේ කාර්යන් විය.සමස්ත ලංකා සංවිධානය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය , ශ්‍රී ලංකා තේ මණ්ඩලය , ශ්‍රී ලංකා තේ පරේෂණායතනය , ජාතික වැවිලි කළමණාකරණ ආයතනය , තේ ශක්ති අරමුදල යන ආයතනවල අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකත්වය හිමිව ඇති අතර ශ්‍රී ලංකා තේ සංගමයේ නිරීක්‍ෂණ සාමාජික වශයෙන්ද, කොළඹ තේ වෙළඳුන්ගේ සංගමයේ අනුබද්ධිත සාමාජික වශයෙන්ද නියෝජනය කිරීමට ඉඩ සැලසී තිබේ.

## මධ්‍යකාලින ප්‍රතිඵල 04

## වසරක් තුල වඩාත් සඵලදායි ලෙස ක්‍රියාත්මක වීම සඳහා ආයතනය ශක්තිමත් වීම

**අපේක්ෂිත කෙටිකාලින ප්‍රතිඵලයන්**

4.1 කාර්ය මණ්ඩල පුරප්පාඩු වසරක් තුල 5% කට වඩා අවම මට්ටමින් පවත්වාගෙන යාම

4.2 වසරක් තුල ආයතනික කටයුතු හැකිතාක් උපරිම ප්‍රමාණයකට විමධ්‍යගත කිරීම

4.4 වසර 02 ක් තුල ආයතනයේ සියලු ඒකක සම්බන්ධ කිරීම සඳහා දුරස්ථ පරිගණක ජාලගත ක්‍රමය (Wide Area Network) ස්ථාපනය කිරීම

4.5 වසර 02ක් තුල ජාතික තොරතුරු පද්ධතිය සඳහා ආයතනික දත්ත පදනම සම්බන්ධීකරණය කිරීම

4.6 වසර 02 කදී සියලු විගණන මත අනනුසීමිත වීම ( Unqualified)

4.7 වර්ෂය ආරම්භයේ සැලසුම් ක්‍රියාවලිය හඳුන්වා විමර්ශනය හා වසර ආරම්භයේ ක්‍රියාත්මක කිරීම

4.8 නියමුකරණ ක්‍රමය ශක්තිමත් කිරීම සහ ආයතනගත කිරීම

4.9 වසරක් තුල මූල්‍ය පරිපාලන සහ විනය කටයුතු පිළිබඳ අත්පොත් / ක්‍රියාපිළිවෙල සකස්වී තිබීම

4.11 වසර 02 ක් තුලදී කාර්යය මණ්ඩලය 75% ක් රාජකාරී කටයුතු සඳහා පරිඝනක භාවිතා කරවීම

4.13 රාජකාරි කටයුතු සඳහා ආයතනික කාර්යය මණ්ඩලයේ ධනාත්මක ආකල්ප පැවැතිම

4.15 වාර්ෂිකව කාර්යය මණ්ඩලය 5% ක් සඳහා වෘත්තිමය පුහුණුව ලබාදීම

4.16 කාර්ය මණ්ඩලය සඳහා කාර්ය පාදක දිරි දීමනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම, අදාල රාජකාරි කටයුතු කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබා තිබීම හා අන්තර් ආයතනික සම්බන්ධතා පවත්වාගෙන යාම.

මේ යටතේ ආයතන විසින් භෞතික හා මූල්‍ය ප්‍රගතියේ සාර්ථකත්වය, අයවැය අපගමන ප්‍රතිශතය හා විගණන අඩුපාඩු සංඛ්‍යාව ප්‍රධාන කාර්ය පාදක දර්ශක වශයෙන් හඳුනාගෙන තිබේ.

**කාර්ය මණ්ඩල පුරප්පාඩු කටයුතු**

අනුමත සංවිධාන ව්‍යුහය හා බඳවා ගැනිමේ පටිපාටිය අනුව 2012.12.31 දින සිට අධිකාරියේ සියළු සේවකයන් අදාල තනතුරුවලට අන්තර්ග්‍රහණය කිරීමටත් පුරප්පාඩු පැවති තනතුරු සඳහා බඳවා ගැනීමටත් කටයුතු කරන ලදී.

**කුඩා තේවතු හිමියන්හට ඊ-සේවා සැපයීම**

කුඩා තේ වතු හිමියන්ට වඩා යහපත් මහජන හිතකාමී සේවාවක් සැපයීමේ අරමුණ පෙරදැරි කර ගනිමින් කුඩා තේවතු සංවර්ධන අධිකාරිය මගින් දෛනිකව සපයන සේවාවන්හි තොරතුරු මාර්ග ගතව (Online) දවසේ පැය 24 පුරාම කෙටි පණිවුඩ(SMS) හා මාර්ග ගත ක්‍රමය (Online) මගින් කුඩා තේවතු හිමියන්ට ලබාගත හැකිවන පරිදි මධ්‍යගත දත්ත පදනම (Centralized Database) සංවර්ධනය කොට ඇත. ඒ අනුව නව පද්ධතිය මගින් පහත සඳහන් ඊ-සේවාවන් (eServices) කුඩා තේවතු හිමියන්ට ලබාදීමට අධිකාරිය කටයුතු පිළියෙල කර ඇත.

- වගා සහනාධාර අවසර පත්‍රවල තත්‍ය කාල (Real Time) තොරතුරු කෙටි පණිවුඩ ( SMS) මගින් ලබා ගැනීමට පහසුකම් සැලසීම.
- ව්‍යාප්ති සේවා කෙටි පණිවුඩ( SMS ) මගින් ඉල්ලුම් කිරීමට පහසුකම් සැලසීම.
- තේ ඉඩමේ ක්ෂේත්‍ර කටයුතුවලට අදාල පියවර වල වැඩ අවසන්කල පසු අදාල ප්‍රාදේශීය කාර්යාලයට කෙටි පණිවුඩ ( SMS) මගින් දැනුම් දීමට කුඩා තේවතු හිමියන්ට පහසුකම් සැලසීම.
- වාරික මුදල් බැංකු ගත කල වහාම ඒබව ස්වයංක්‍රියව කෙටි පණිවුඩ ( SMS) මගින් කුඩා තේවතු හිමියන්ට දැනුම් දීම.
- මාර්ග ගත (Online) දත්ත පද්ධතිය මගින් රාජ්‍ය තොරතුරු ද්වාරය (www.srilanka.lk ) හරහා අවසරපත්‍ර වල තොරතුරු කුඩා තේවතු හිමියන්ට ලබාදීම.
- රාජ්‍ය තොරතුරු ද්වාරය (www.srilanka.lk ) මගින් වගා සහනාධාර ඉල්ලුම් කිරීම සඳහා පහසුකම් සැලසීම (Online Application)

**කාර්ය මණ්ඩල ඇගයීම්**

ආයතනයේ කාර්ය මණ්ඩලය ඇගයීම පිණිස ක්ෂේත්‍ර හා කාර්යාල කාර්ය මණ්ඩල ඇගයීම් ක්‍රම යොදාගනු ලැබිණි.

## කාර්ය මණ්ඩල පුහුණුව

මානව සම්පත් පුහුණු කිරීම් කටයුතු යටතේ රාජ්‍ය ආයතනවල විගණන ප්‍රශ්න අවම කිරීම, ශ්‍රී ලංකා මූලය වාර්තාකරණ හා කළමණාකරන ප්‍රමිත ක්‍රියාත්මකවීම , රාජ්‍ය ආයතනවල නීතිමය කටයුතු කළමණාකරණය , සේවා ස්ථානයේ ගැටළු නිරාකරණය , විද්‍යාත්මක පිරිමැසුම්දායක හා ආරක්ෂිත රියපැදවීම , අභ්‍යන්තර විගණන නිලධාරී සඳහා පුහුණුව යන වැඩසටහන් 2012 වසරේදී ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව බහුකාර්ය කළමණාකරන සහායක කාර්යභාරය හා වගකීම් පිළිබඳව වැඩමුළු සහ බහුකාර්ය කළමණාකරන ක්‍රමවේදය හඳුන්වාදීම සහ කාර්යභාර නිලධාරීන්ගේ කාර්යභාරය සහ වගකීම් පිළිබඳව වැඩසටහනක්ද පවත්වා ඇත. (උප ලේඛන අංක 12)

ආයතනික කටයුතු වඩාත් සඵලදායි ලෙස ක්‍රියාත්මකවීම සඳහා 2012 වසරේ මානව සම්පත් පුහුණු කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 1.726 ක මුදලක් වැයකර තිබේ.

## මධ්‍යකාලීන ප්‍රතිඵල 05

### වසර 05ක් තුළදී ඉඩම්වලින් 10% ක් අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමු කරවීම.

කුඩා තේ ඉඩම් හිමියන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම සඳහා අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමුකරවීම හඳුනාගෙන තිබේ. මේ අනුව තේ පාදක ගොවිපල කළමණාකරණ ක්‍රමය වාර්ෂිකව තේ ඉඩම් 1000 ක් සඳහා හඳුන්වාදීමත්, කුඩා තේ ඉඩම් 1000 ක වන වගා වගාකරවීමත් මේ යටතේ හඳුනා ගන්නා ලද කෙටි කාලීන ප්‍රතිඵලයකි. මේ යටතේ අදාල වර්ෂය තුලදී වැඩසටහන් 132 ක් සැලසුම් කරනු ලැබූ අතර වැඩසටහන් 73 ක් ක්‍රියාත්මක කර තිබේ. ඒ සඳහා සහභාගිවූ ගොවීන් ගණන 1673 කි. අදාල වර්ෂයේදී පහත පරිදි වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත.

**වගුව - 13**

**තේ පාදක ගොවිපල පුහුණු වැඩසටහන් සංඛ්‍යාව හා සහභාගී ගොවි සංඛ්‍යාව**

| | ප්‍රදේශිය කාර්යාලය | ගාල්ල | මාතර | කළුතර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | රත්නපුර | ඌව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| තේ පාදක ගොවිපල කළමණාකරන පුහුණුව (5.1.4) | **වැඩසටහන්** | | | | | | | | | |
| | ඉලක්කය | 19 | 20 | 12 | 8 | 16 | 16 | 25 | 16 | **132** |
| | ප්‍රගතිය | 2 | 10 | 6 | 14 | 7 | 4 | 16 | 14 | **73** |
| | **සහභාගිත්වය** | | | | | | | | | |
| | ඉලක්කය | 23 | 200 | 240 | 100 | 160 | 108 | 172 | 145 | **1148** |
| | ප්‍රගතිය | 76 | 462 | 246 | 222 | 79 | 69 | 384 | 135 | **1673** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

ඉහත සඳහන් ප්‍රතිඵල මැනීම පිණිස කුඩා තේ ඉඩම් වල අනෙකුත් භෝග පවත්නා ප්‍රතිශතය හා කුඩා තේ ඉඩම් වල පශු පාලනය පවත්නා ප්‍රතිශතය ප්‍රධාන කාර්ය පාදක දර්ශක වශයෙන් හඳුනාගෙන තිබේ.

# දශකයේ විශේෂ කාර්ය සාධනයන්

| | | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | විශේෂිත කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1තේ නැවත වගාව | | | | | | | | | | | | |
| | තේ නැවත වගාව (හෙක්.) | 765 | 891 | 1057 | 1001 | 1024 | 881 | 777 | 847 | 772 | 889 | |
| | ඉලක්කය අනුව ප්‍රගතිය | 98% | 89% | 101% | 95% | 94% | 92% | 92% | 111% | 91% | 99% | |
| | ලබාදී ඇති දිරිදීමනා මුදල (රු.මිලි.) | 122.8 | 188.10 | 174.8 | 183.3 | 172.9 | 194.6 | 178.17 | 177.85 | 189.88 | 226.3 | |
| 2 තේ අළුත් වගාව | | | | | | | | | | | | |
| | තේ අළුත් වගාව (හෙක්.) | 642 | 12 | 8 | 0.83 | *- | *- | *- | *- | 28.38 | 239 | * ප්‍රතිපත්තිමය තීරණ මත ක්‍රියාත්මක නොකරන ලදී. |
| | ලබාදී ඇති දිරිදීමනා මුදල (රු.මිලි.) | 27.95 | 3.25 | 0.30 | 0.042 | *- | *- | *- | *- | 1.17 | 23.21 | |
| 3 භෝග පුනරුත්ථාපනය | | | | | | | | | | | | |
| | පාළු පිරවූ පැළ සංඛ්‍යාව (මිලියන) | 1.63 | 1.48 | 1.24 | 0.52 | 0.516 | 0.519 | 0.43 | 0.424 | 0.50 | 0.77 | |
| | ලබාදී ඇති දිරිදීමනා මුදල (රු.මිලි.) | 9.38 | 14.46 | 8.11 | 7.794 | 4.13 | 4.84 | 3.25 | 3.586 | 2.44 | 14.35 | |
| 4 රබර් සමඟ තේ වගාව | | | | | | | | | | | | |
| | රබර් සමඟ තේ වගාව (හෙක්.) | 15 | 9 | 14.6 | 6.8 | 4.4 | - | - | - | - | - | කුඩා තේ ඉඩම් හිමි ඉල්ලුම් අඩු වීම |
| | ලබාදී ඇති දිරිදීමනා මුදල (රු.මිලි.) | 0.76 | 0.46 | 0.19 | 0.469 | 0.41 | - | 0.028 | - | - | - | |
| 5පොල් සමඟ තේ වගාව | | | | | | | | | | | | |
| | පොල් සමඟ තේ වගාව (හෙක්.) | - | - | - | 0.8 | - | - | - | - | - | - | - එම - |
| | ලබාදී ඇති දිරිදීමනා මුදල (රු.මිලි.) | - | - | - | 0.061 | - | - | - | - | - | - | |
| 6 විස්තීර්ණ වැඩසටහන් | | | | | | | | | | | | |
| 6.1 කණ්ඩායම් ප්‍රවේශයන් | | | | | | | | | | | | |
| | වැඩසටහන් සංඛ්‍යාව | 5219 | 5959 | 6619 | 8084 | 8226 | 8668 | 9170 | 7154 | 6970 | 6508 | |
| | සහභාගිත්ව සංඛ්‍යාව (000') | 138 | 154 | 163 | 236 | 242 | 223 | 219 | 210 | 176 | 143 | |
| 6.2 ඒකපුද්ගල ගොවි හමුව | | | | | | | | | | | | |
| | ගොවි හමු සංඛ්‍යාව | 7865 | 14795 | 31370 | 32261 | 33160 | 38545 | 37268 | 27346 | 26103 | 27843 | |
| 6.3 වගා ද්‍රව්‍ය ආධාර සැපයීම | | | | | | | | | | | | |
| 6.4 ආයතනික තවාන් | | | | | | | | | | | | |
| | තේ තවාන් සංඛ්‍යාව | 8 | 7 | 7 | 8 | 7 | 7 | 6 | 6 | 6 | 7 | |
| | නිෂ්පාදිත පැළ සංඛ්‍යාව (000') | 1106 | 1024 | 1113 | 1089 | 1043 | 1123 | 970 | 838 | 800 | 919 | |
| 6.5 | වාණිජ තේ තවාන් | | | | | | | | | | | |
| | ලියාපදිංචි තවාන් සංඛ්‍යාව | 783 | 1167 | 1667 | 900 | 418 | 678 | 535 | 651 | 663 | 969 | |
| | පැළ ධාරිතාවය (මිලියන) | 43.79 | 32.12 | 41.58 | 38.26 | 38.75 | 25.57 | 23.25 | 24.28 | 25.40 | 39.41 | |
| 6.6 යෙදවුම් සැපයීම | | | | | | | | | | | | |
| 6.6.1 පොහොර සැපයීම | | | | | | | | | | | | |
| | මුළු සැපයුම (මෙ.ටො.) | 9124 | 9007 | 9178 | 5712 | 5202 | 4538 | 1061 | - | - | - | ජාතික පොහොර සහනාධාර ක්‍රමය නිසා ණය ක්‍රමය යටතේ පොහොර ලබා නොගැනීම |
| | ණය ක්‍රමය යටතේ පොහොර සැපයීම (මෙ.ටො.) | 8845 | 8480 | 8412 | 3800 | 1877 | 1378 | 969 | - | - | - | |
| 6.6.2 ජාතික පොහොර සහනාධාර ක්‍රමය | | | | | | | | | | | | |
| | නිර්දේශිත ප්‍රමාණය (මෙ.ටො.) | - | - | - | 43,982 | 51,917 | 51,590 | 136,900 | 124,142 | *35436 | - | *දෙවන අර්ධ වාර්ෂිකයේ සිට ක්‍රියාත්මක නොවේ. |
| | වටිනාකම (රු.මිලි.) | - | - | - | 471 | 1,082 | 1,944 | 5,658 | 4478 | *1507 | - | |
| 7 මානව හා සමාජ සංවර්ධන කටයුතු | | | | | | | | | | | | |
| | කුඩා තේ වතු සංවර්ධන සමිති | | | | | | | | | | | |
| | සමිති සංඛ්‍යාව | 1256 | 1218 | 1276 | 1294 | 1309 | 1319 | 1348 | 1372 | 1379 | 1381 | |
| | සමිති සාමාජිකත්වය (000') | 163 | 161 | 165 | 192 | 202 | 219 | 220 | 283 | 274 | 261 | |
| 8 කුඩා තේ ඉඩම් නිෂ්පාදනය (කිලෝ මිලියන) | | 187.9 | 203.0 | 205.8 | 212.4 | 205.7 | 214.8 | 201.9 | 230.1 | 229.0 | 233.1 | |
| 9 ජාතික නිෂ්පාදනයට දායකත්ව % | | 61.9 | 65.9 | 64.9 | 68.3 | 67.5 | 67.4 | 69.3 | 69.4 | 69.9 | 71.4 | |

## සංවර්ධනාත්මක ප්‍රතිඵල සඳහා කළමණාකරණය
## ප්‍රධාන කාර්යය සාධක දර්ශක

| | මධ්‍යකාලීන ප්‍රතිඵල | ප්‍රධාන කාර්යය සාධක දර්ශක | ප්‍රතිපාදන | මූල්‍ය ප්‍රගතිය | පාදක වර්ෂය 2008 | කාර්යය සාධක දර්ශක ඉලක්ක හා ප්‍රගතිය 2012 | | විශේෂිත කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ඉලක්කය | ප්‍රගතිය | |
| | දිගුකාලීන ප්‍රතිඵලය | I. කුටුම්භ ඒකක වත්කම් වර්ධනයවීමේ ප්‍රතිශතය | | | | | | |
| | කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්වය නංවාලීම | II. ළමුන්ගේ ද්විතීය අධ්‍යාපන ප්‍රතිශතය | | | NA | | NA | පවුල් ආර්ථික සමීක්ෂණ |
| 1 | වසර 06 කදී වසරකට / හෙක්ටයාරයකට/ සකස්කළ තේ කිලෝ ප්‍රමාණය වැඩි කිරීම, | 1.1.දිස්ත්‍රික් මට්ටමින් සහ උච්චත්ව මට්ටමින් ඒකක ඵලදායිතාව වර්ධනයවීම | 340.46 | 271.89 | | | | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සංඛ්‍යාන දත්ත |
| | පහත රට 2700 දක්වා | | | | 2085 | 2400 | 2142 | |
| | මැද රට 1700 දක්වා | | | | 1050 | 1300 | 1447 | |
| | උඩ 1500 දක්වා | | | | 1055 | 1350 | 1872 | |
| | | 1.2කුඩා තේ ඉඩම් වල නිෂ්පාදනය වර්ධනය වීම (කිලෝ මිලියන) | | | 215 | 238 | 233 | |
| | උප එකතුව | | 340.46 | 271.89 | | | | |
| 2 | වසර 05 කදී කම්හල් මට්ටමින් අමු දළ ගුණාත්මය 60% දක්වා වර්ධනය කිරීම | 2.1.කම්හල් මට්ටමින් හොඳ දළ ප්‍රතිශතය | 1.16 | 0.34 | 35% | 55% | ......... | ශ්‍රී ලං.තේ.ම. තේ කොමසාරිස් අංශයේ දත්ත |
| | උප එකතුව | | 1.16 | 0.34 | | | | |
| 3 | වසර 06 ක් තුළ ප්‍රජා මූලික සංවිධානවලින් 50% ක් ශක්තිමත් කිරීම | 3.1.වත්කම් වටිනාකම වර්ධනය වීම | 1.50 | 1.500 | NA | | | පවුල් ආර්ථික සමීක්ෂණ |
| | | 3.2.සළකාගත් කාර්යන් මෙහෙයවන සමිති සංඛ්‍යාව | | | 100 | 230 | 227 | |
| | | 3.3.සාඵල්‍යතාවයන් සම්බන්ධයෙන් සාමාජික ආකල්ප | | | NA | | | |
| | උප එකතුව | | 1.50 | 1.50 | | | | |
| 4 | වසරක් තුළ වඩාත් සඵලදායි ලෙස ක්‍රියාත්මකවීම සඳහා ආයතනය ශක්තිමත් කිරීම | 4.1.ඉලක්ක සපුරාලීමේ ප්‍රතිශතය | 7.65 | 2.550 | | | | |
| | | තේ නැවත වගා ආධාර ක්‍රමය | | | | | | |
| | | a. මූල්‍ය | | | 102% | 100% | 77% | උපරි ද්‍රව්‍ය හා පස ප්‍රකෘතිකරණය 1 ම නොවීම ප්‍රගතිය අඩුවීම මත |
| | | b. භෞතික | | | 92% | 100% | 99% | |
| | | 4.2.විගණන අවුපාවු සංඛ්‍යාව | | | සතුටු හා සාධාරණ | සතුටු හා සාධාරණ | ......... | විගණකාධිපති වාර්තාව පරිදි |
| | | 4.3.ආදායමෙන් අපගමන ප්‍රතිශතය (සංවර්ධන ප්‍රාග්ධන) | | | 13% | 0% | -21% | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන නොලැබීම මත |
| | | 4.4.ආයතනයේ සාඵල්‍යතාවය සම්බන්ධයෙන් කාර්යය මණ්ඩලයේ ආකල්ප | | | NA | | | |
| | උප එකතුව | | 7.65 | 2.550 | | | | |
| 5 | වසරක් 05 ක් තුළදී ඉඩම්වලින් 10% ක් අමතර ආදායම් ඉපයීමේ කටයුතු සඳහා යොමුකරවීම | 5.1.අනෙකුත් බෝග ඇති ඉඩම් ප්‍රතිශතය | 0.05 | 0.04 | 35% | 37% | | පවුල් ආර්ථික සමීක්ෂණ |
| | | 5.2.පශු පාලනය ඇති ඉඩම් ප්‍රතිශතය | | | NA | | NA | |
| | උප එකතුව | | 0.05 | 0.04 | | | | |
| | මුළු එකතුව | | 350.82 | 276.32 | | | | |

## 4. කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිළ

### 4.1 ශ්‍රම පිරිවැය.

කුඩා තේ ඉඩම් අංශයෙහි තත්වයන් පිළිබඳ ක්ෂේත්‍ර මට්ටමින් ලබාගන්නා වාර්ෂික තොරතුරු අනුව කුඩා තේ ඉඩම් අංශයේ දළු නෙලීම, කප්පාදුව, වල්පැල නෙලීම ආදිය සඳහා ශ්‍රමික හිගයද දෛනික වේතන මට්ටම සලකා බැලීමේදී පඩි පාලක සභා ආඥා පනතට අනුව ගෙවීමට නියමිත වේතන මට්ටමට වඩා වැඩි මුදලක් ගෙවනු ලැබීම බව අනාවරණය වන කරුණු වේ. තවද ප්‍රාදේශිය වශයෙන්ද වේතන මට්ටමේ විෂමතාවයන් වාර්තා වන අවස්ථා බොහෝය. ඒ අනුව බොහෝවිට සංවිධානාත්මක නොවන කුඩා තේ ඉඩම් අංශයේ දෛනික කම්කරු වේතන මට්ටම, සංවිධානාත්මක කුඩා තේ ඉඩම් අංශයේ වේතන මට්ටමට වඩා වැඩි අගයක් ශ්‍රමයේ මිල වශයෙන් වාර්තාවී තිබේ.

තවද දළු නෙලීම සඳහා, ශ්‍රමිකයන්ට ගෙවීම් කිරීමේදී නෙලන ලද දළු කිලෝ ප්‍රමාණය මත කුලි ගෙවීම, දෛනිකව නෙලූ දළු ප්‍රමාණයේ සාමාන්‍යය ඉක්මවන විට කිලෝවකට අමතර මිලක් ගෙවීම වැනි අවස්ථාද, කප්පාදුව වැනි පුහුණු ශ්‍රමික කාර්යයන් සඳහා දළු නෙලීමේ දෛනික කුලියට වඩා ඉහල දෛනික කුලියක් ගෙවනු ලබන බවද වාර්තා වී තිබේ.

### 4.2 අමුදළු කිලෝවක නිෂ්පාදන පිරිවැය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දත්ත පරිදි පිහිටීම මත කොළඹ තේ වෙන්දේසියේ ලද මිළ ( උපලේඛන අංක 10 - A) පරිදි ගණනය කරනු ලැබූ අමුදළු කිලෝවක ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය සහ දළු කිලෝවක සාමනය මිළ පහත සඳහන් වේ.

වගුව - 14
**අමුදළු කිලෝවකට ලැබුණු මිළ හා නිෂ්පාදන පිරිවැය**
**1994 - 2012**

| වර්ෂය | සාමාන්‍ය මිල (කි.1 ට රුපි) | සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය (කි.01ට රුපි) |
|---|---|---|
| 1994 | 9.80 | 8.85 |
| 1995 | 11.20 | 7.37 |
| 1996 | 15.70 | 8.28 |
| 1997 | 18.04 | 9.69 |
| 1998 | 20.30 | 11.24 |
| 1999 | 16.86 | 16.81 |
| 2000 | 19.82 | 16.47 |
| 2001 | 21.05 | 16.64 |
| 2002 | 21.83 | 17.03 |
| 2003 | 21.79 | 17.04 |
| 2004 | 26.43 | 15.15 |
| 2005 | 27.17 | 20.29 |
| 2006 | 29.18 | 21.87 |
| 2007 | 40.88 | 30.64 |
| 2008 | 45.45 | 36.24 |
| 2009 | 52.71 | 37.24 |
| 2010 | 54.11 | 38.56 |
| 2011 | 52.63 | 44.43 |
| 2012 | 57.27 | 49.50 |

2012 වර්ෂයේදී දළු කිලෝවක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා හෙක්ටයාර් එකකට සාමාන්‍ය අස්වනු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 9965 ක් (පහතරට රිකිළි තේ) ලෙස සලකා ගණනය කර ඇත. ( ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිෂ්පාදන දත්ත පරිදි ) 2011 වර්ෂයේදී මෙම අස්වනු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 9732 බැගින් ඇස්තමේන්තු කර ඇත.

සමුච්චිත මිළ පාදකව සකස් කිරීම අනුව 2011 වර්ෂය හා සසඳන විට 2012 දී දලු කිලෝවක් සඳහා ගෙවා ඇති සාමාන්‍ය මිළ රු. 4.64 කින් එනම් 8.8% කින් ඉහල ගොස් තිබුණි. ඇස්තමේන්තු ගත නිෂ්පාදන පිරිවැය 11% කින් පමණ වැඩිවී තිබේ. නිෂ්පාදන පිරිවැය ඉහලයාම අවම කිරීම සඳහා ජාතික පොහොර සහනාධාරය විශාල දායකත්වයක් ලබාදෙමින් පොහොර පිරිවැය ප්‍රතිශත මට්ටම 11% කින් පමණ අවම කර ගැනීමට උපකාරී වී ඇත.

**2012 වර්ෂයේ පැවැති දලු මිළ හා ඇස්තමේන්තුගත පිරිවැය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දත්ත පරිදි ( උපලේඛන අංක 10-A) සියළුම උච්චත්වයන් සඳහා තේ කිලෝවක සාමාන්‍ය මිල මෙතෙක් වාර්තා වූ උපරිම මිල බවට පත්ව තිබේ. පහත රට තේ සඳහා රුපියල් 3.78 කින් ද මැදි බිම් සඳහා 4.58 කින් ද උස් බිම් සඳහා වූ මිල රුපියල් 5.15 කින් ද ඉහල ගොස් තිබුණි.

මේ අනුව අමු තේ දලු කිලෝවකට උඩරට ප්‍රදේශයේ රු. 54.91 ක්ද මැදිබිම් සඳහා රු. 51.34 ක්ද පහත් බිම් සඳහා රු. 59.54 ක්ද ලැබුණු අතර සමස්ත, සාමාන්‍ය මිළ දලු කිලෝවකට රු. 57.25 ක්ද විය. පහත් බිම් තේ කිලෝවක් සඳහා ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය (ජාතික පොහොර සහනාධාර මිළ සහිතව ) රු. 49.35කි. (උපලේඛන අංක 10 - B )

### 4.3 නිෂ්පාදන ආන්තිකය හා මිල.

| | | | | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | % |
| 1 | පැරණි තේ උදුරා දැමීම හා කුඩු කිරීම | | | 104 | | 78000 | | | | | | | | | | | | | 104 | | 78000 | 4.52 |
| | (50 % පැල පැටිරි ඉවත්කර දිනකට පඳුරු 40 බැගින් | | | | | | | | | | | | | | | | | | | | | |
| 2 | මුල් කැබලි අහුලා ඉවත් කිරීම | | | 125 | | 93750 | | | | | | | | | | | | | 125 | | 93750 | 5.44 |
| 3 | බෑවුම් සකස් කිරීම , කාණු දැමීම , පෝෂණ සකස් කිරීම | | | 100 | | 75000 | 40 | | 30000 | 10 | | 7500 | 5 | | 3750 | 5 | | 3750 | 160 | | 120000 | 6.96 |
| 4 | ඩොලමයිට් දැමීම ( කි.ග්‍රෑ.1 ක් රු.6.00 බැගින් ) | 1976 | 11856 | 2 | 11856 | 13356 | | | | | | | | | | | | | 2 | 11856 | 13356 | 0.77 |
| 5 | ගෝටමාලා තණ පැල සිටුවීම ( පේළි 100 බැගින් දිනකට ) | | | 54 | | 40500 | | | | | | | | | | | | | 54 | | 40500 | 2.35 |
| 6 | තණ සඳහා පොහොර දැමීම ( කි.ග්‍රෑ.1ක් රු.26.00 බැගින් කි.ග්‍රෑ.830 කට ) | 1610 | 41860 | 4 | 9620 | 12620 | 4 | 24180 | 27180 | 1 | 8060 | 8810 | | | | | | | 9 | 41860 | 48610 | 2.82 |
| 7 | තණ කැපීම ( වාරයට ශ්‍රම දින 1 බැගින් ) | | | 14 | | 10500 | 56 | | 42000 | | | | | | | | | | 70 | | 52500 | 3.04 |
| 8 | වල්පැල නෙළීම ( වාරයට ශ්‍රම දින 10 බැගින් ) | | | 30 | | 22500 | 20 | | 15000 | 100 | | 75000 | 120 | | 90000 | 120 | | 90000 | 390 | | 292500 | 16.96 |
| 9 | සෙවන ගස් වගා කිරීම ( ග්ලිරිසීඩියා හා ඩැඩැප් 300 ක් සඳහා | 300 | 2520 | 8 | 2520 | 8520 | 1 | 252 | 1002 | | | | | | | | | | 9 | 2772 | 9522 | 0.55 |
| | හා ඩොලමයිට් කි.150 ක් සඳහා රිකිලි 1 කට රු.1.00 බැගින් ) | | | | | | | | | | | | | | | | | | | | | |
| 10 | දිග සෙවන ගස් වගා කිරීම ( ශුරුම්බා 100 ක් රු.6/- බැගින් සහ ඩොලමයිට් 100 Kg | 100 | 2082 | 6 | 2082 | 6582 | 1 | 208 | 958 | | | | | | | | | | 7 | 2290 | 7540 | 0.44 |
| 11 | තණ උදුරා දැමීම | | | | | | | | | 20 | | 15000 | | | | | | | 20 | | 15000 | 0.87 |
| 12 | වල්පිල් කැපීම, වළ කැපීම, කුළුණු කැපීම | | | | | | | | | 180 | | 135000 | | | | | | | 180 | | 135000 | 7.83 |
| 13 | තේ පැළ සිටුවීම ( පැළයක් රු.25/- බැගින් ) | 12500 | 3E+05 | | | | | | | 60 | 187500 | 232500 | | | | | | | 60 | 187500 | 232500 | 13.48 |
| 14 | සෙවන ගස් ස්ථාපනය කිරීම ( වාරයට දෙවරක් බැගින් ) | | | | | | 6 | | 4500 | 12 | | 9000 | 15 | | 11250 | 15 | | 11250 | 48 | | 36000 | 2.09 |
| 15 | මුල්පළ ලක්ෂණය මර්දනය කිරීම ( ස්වයංපාලක ග්‍රෑ.300 ක | 3 | 1302 | | | | | | | 20 | 1302 | 16302 | 20 | 1302 | 16302 | 20 | 1302 | 16302 | 60 | 2604 | 47604 | 2.76 |
| | රු.93/- බැගින් වාරයට ග්‍රෑ.250 බැගින් වාර 10 ) | | | | | | | | | | | | | | | | | | 0 | 1302 | 1302 | 0.08 |
| 16 | තේ පඳුරු හැඩ ගැන්වීම | | | | | | | | | | | | 12 | | 9000 | 15 | | 11250 | 27 | | 20250 | 1.17 |
| 17 | වසුන් යෙදීම | | | | | | | | | 100 | | 75000 | 75 | | 56250 | | | | 175 | | 131250 | 7.61 |
| 18 | තේ පොහොර යෙදීම ( T 200 පළමු වසර ) | 1200 | 31200 | | | | | | | 20 | 31200 | 46200 | 20 | 63180 | 78180 | | | | 40 | 94380 | 124380 | 7.21 |
| | ජීවිත වසර | 2430 | 63180 | | | | | | | 60 | | 45000 | 60 | | 45000 | 32 | | 24000 | 152 | | 114000 | 6.61 |
| | T. 750 පස්වන වසර | 1750 | 45500 | | | | | | | | | | | | | | 45500 | | | 45500 | 45500 | 2.64 |
| 19 | පාලු පිරවීම | 2000 | 25 | | | | | | | | | | 12 | 15000 | 24000 | 12 | 15000 | 24000 | 24 | 30000 | 48000 | 2.78 |
| 20 | විවෘතව උදුරා මර්දනය කිරීම ( විලයට ග්‍රෑ. 7 බැගින් ) | 88 | 4840 | | | | | | | 4 | 4840 | 7840 | | | | | | | 4 | 4840 | 7840 | 0.45 |
| | ක්‍රමවත් කැපීම | | | | | | | | | | | | | | | | | | | | | |
| 21 | කෘෂි උපකරණ මිලදීගැනීම හා ප්‍රවාහන සඳහා | | | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 10000 | 0.58 |
| | එකතුව | | | 447 | 28078 | 363328 | 128 | 26640 | 122640 | 587 | 234902 | 675152 | 339 | 81482 | 335732 | 219 | 63802 | 228052 | 1720 | 434904 | 1,724,904 | 100 |

* පිරිවැය ඇස්තමේන්තුව තේ පර්යේෂණායතනයේ නිර්දේශයන්ට අනුකූල වන අතර, අමුද්‍රව්‍ය පිරිවැය හා ශ්‍රමිකයන් පිරිවැයද ඇතුළත් කර ඇත.

**උපලේඛන අංක : 12**

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය -2012 වර්ෂයේ පුහුණු වැඩමුළු

**බාහිර හා අභ්‍යන්තර වැඩමුළු**

| අනු අංකය | සේවක කාණ්ඩය | පුහුණු වැඩ මුළු පවත්වන ලද දින වකවානු | පුහුණු වැඩ මුළු පවත්වන ලද ආයතනය | පුහුණු විෂය / අවශ්‍යතා | පුහුණුලාභින් ගණන |
|---|---|---|---|---|---|
| 1 | සාමාන්‍යාධිකාරි<br>කළමනාකරු මුදල් | 2012.01.05 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | රාජ්‍ය ආයතනවල විගණන ප්‍රශ්ණ අවම කර ගන්නේ කෙසේද. | 2 |
| 2 | කළමණාකරණ සහකාර | 2012.03.15-17 | හන්තාන ජාතික පුහුණු මධ්‍යස්ථානය | බහුකාර්යය කළමණාකරන සහකාර සහායක කාර්යභාරය / වගකීම් | 50 |
| 3 | කළමණාකරණ සහකාර | 2012.03.22-24 | හන්තාන ජාතික පුහුණු මධ්‍යස්ථානය | බහුකාර්යය කළමණාකරන සහකාර සහායක කාර්යභාරය / වගකීම් | 50 |
| 4 | කළමණාකරණ සහකාර | 2012.03.29-31 | හන්තාන ජාතික පුහුණු මධ්‍යස්ථානය | බහුකාර්යය කළමණාකරන සහකාර සහායක කාර්යභාරය / වගකීම් | 50 |
| 5 | කළමණාකරණ සහකාර | 2012.04.19-21 | හන්තාන ජාතික පුහුණු මධ්‍යස්ථානය | බහුකාර්යය කළමණාකරන සහකාර සහායක කාර්යභාරය / වගකීම් | 50 |
| 6 | රියදුරු | 2012.07.13 | ඉඳිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය | විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම. | 08 |
| 7 | ස.ප්‍රා.ක.(ඌව) | 2012.07.09සිට 2012.07.13 | අධිකරණ අමාත්‍යාංශය යටතේ පොල්ගහවෙල ප්‍රා.ලේ.කා. | සමථ කිරීමේ දක්ෂතා සහ ශිල්පීය උපදෙස් පිළිබඳ පුහුණු පාඨමාලා | 01 |
| 8 | ගණකාධිකාරි | 2012.07.10 | ප්‍රාග් සර්විස් ප්‍රයිවට් ලිමි. | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත වෙනුවට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ක්‍රියාත්මක වීම දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය. | 01 |
| 9 | අභ්‍යන්තර විගණන නිලධාරි | 2012.07.19 | සී/ස නිපුණතා සංවර්ධන භාරය , තරුණ කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය | අ.වි.නිළධාරින් සඳහා පුහුණු සම්මන්ත්‍රණය | 01 |
| 10 | පරිපාලන නිලධාරි | 2012.07.12 සිට 2012.07.13 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | සේවා ස්ථානයේ ගැටළු නිරාකරණය පිළිබඳ. | 05 |
| 11 | කාර්‍යභාර නිළධාරි | 2012.08.15-18 | හන්තාන ජාතික පුහුණු මධ්‍යස්ථානය | බහුකාර්යය කළමණාකරන ක්‍රමවේදය හඳුන්වාදීම සහ කාර්යභාර නිලධාරීන්ගේ කාර්යභාරය සහ වගකීම් | 30 |
| 12 | කළමනාකරු (මුදල්)<br>අභ්‍යන්තර විගණක<br>ස.ක.(මුදල්)<br>සහකාර ගණකාධිකාරි<br>අභ්‍යන්තර විගණන නිලධාරි<br>ගිණුම් නිලධාරි | 2012.09.18 | ප්‍රාග් සර්විස් ප්‍රයිවට් ලිමි. | ශ්‍රී ලංකා මූල්‍ය කළමනාකරණ ප්‍රමිත ක්‍රියාත්මකවීම දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය | 10 |
| 13 | කළමනාකරු (මුදල්)<br>අභ්‍යන්තර විගණක<br>සහකාර ගණකාධිකාරි<br>අභ්‍යන්තර විගණන නිලධාරි<br>ගිණුම් නිලධාරි | 2012.10.09 | ප්‍රාග් සර්විස් ප්‍රයිවට් ලිමි. | ශ්‍රී ලංකා මූල්‍ය කළමනාකරණ ප්‍රමිත ක්‍රියාත්මකවීම දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය 1 | 09 |
| 14 | සහකාර සාමාන්‍යාධිකාරි (මානව සම්පත්/පාලන)<br>සහකාර කළමනාකරු (මානව සම්පත්/පාලන)<br>පරිපාලන නිලධාරි | 2012.10.31 සිට 2012.11.02 දක්වා | ශ්‍රී ලංකා පදනම් ආයතනය | රාජ්‍ය ආයතනවල නිතිමය කටයුතු කළමනාකරණය | 08 |

**උපලේඛන අංක 13**

**කුඩා තේ වතු හිමියන් සඳහා ණය ක්‍රමය යටතේ පොහොර ලබාදීම**
**මෙ. ටො. ( 1993 - 2009 දක්වා )**

| වර්ෂය | ණය යෝජනා ක්‍රමය | අනෙකුත් | අත්පිට මුදලට | මුලු නිකුතුව |
|---|---|---|---|---|
| 1993 | 2405 | 448 | 552 | 3405 |
| 1994 | 2811 | 93 | 329 | 3233 |
| 1995 | 3591 | 375 | 417 | 4353 |
| 1996 | 8278 | 426 | 261 | 8968 |
| 1997 | 12879 | 779 | 162 | 13820 |
| 1998 | 11035 | 3915 | 577 | *15527 / +17700 |
| 1999 | 11210 | 712 | 343 | 12992 |
| 2000 | 15317 | 191 | 351 | 15859 |
| 2001 | 15905 | 84 | 432 | 16421 |
| 2002 | 16009 | 163 | 734 | 16906 |
| 2003 | 8845 | 5 | 274 | 9124 |
| 2004 | 8480 | 0.7 | 527 | 9007 |
| 2005 | 8412 | 523 | 243 | 9178 |
| 2006 | 3800 | 1284.2 | 628 | 5712 |
| 2007 | 1877 | 3087 | 238 | 5202 |
| 2008 | 1378 | 2970 | 190 | 4538 |
| 2009 | 964 | - | 92 | - |

\+ ඩොලමයිට් සහිතව

* ඩොලමයිට් රහිතව

** 2009 වසරේ සිට කුඩා තේ ඉඩම්හිමියන් සඳහා පොහොර සහනාධාරය ලබාදීම අධිකාරියේ කාර්යභාරයෙන් බැහැරවී තිබේ.

**උපලේඛන අංක : 14**

**තේ අපනයනය හා විදේශ විනිමය ඉපයීම්**

**1995 – 2012**

| වර්ෂය | **අපනයනය කල ප්‍රමාණය ( කි. ග්‍රෑ. මිලියන ) | * අපනයන ඉපයීම් ප්‍රමාණය ( රු. මිලියන ) | මුළු අපනයන ඉපයීම් වලට දායක ප්‍රතිශතය % |
|---|---|---|---|
| 1995 | 240 | 24638 | 12.62 |
| 1996 | 244 | 34068 | 15.02 |
| 1997 | 269 | 42533 | 15.51 |
| 1998 | 272 | 50280 | 16.19 |
| 1999 | 269 | 43728 | 13.44 |
| 2000 | 288 | 53133 | 12.06 |
| 2001 | 294 | 61602 | 14.31 |
| 2002 | 291 | 63105 | 14.00 |
| 2003 | 298 | 65937 | 13.30 |
| 2004 | 300 | 74890 | 12.08 |
| 2005 | 309 | 81480 | 12.70 |
| 2006 | ***315 | ***86337 | 12.80 |
| 2007 | ***294 | ***106217 | 13.20 |
| 2008 | 320 | 137585 | 15.60 |
| 2009 | 280 | 136183 | 16.70 |
| 2010 | 315 | 155608 | 16.60 |
| 2011 | 323 | 164869 | 14.10 |
| 2012 | 320 | 180430 | 14.48 |

* ප්‍රති අපනයන ඉපයීම් සහිතව

** ආනයනික තේ ද ඇතුළුව

*** ප්‍රති අපනයන ඉපයීම් රහිතව

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

**උපලේඛන අංක : 15**

**දළ ජාතික නිෂ්පාදනයට තේ මගින් එකතු කල වටිනාකම.**

**( 1992 - 2012 )**

| වර්ෂය | එකතු කල වටිනාකම % |
|---|---|
| 1992 | 2.0 |
| 1993 | 2.4 |
| 1994 | 2.3 |
| 1995 | 2.1 |
| 1996 | 2.2 |
| 1997 | 2.4 |
| 1998 | 2.8 |
| 1999 | 2.4 |
| 2000 | 2.6 |
| 2001 | 2.3 |
| 2002 | 2.4 |
| 2003 | 2.3 |
| 2004 | 2.2 |
| 2005 | 2.0 |
| 2006 | 1.8 |
| 2007 | 1.2 |
| 2008 | 1.6 |
| 2009 | 1.7 |
| 2010 | 1.6 |
| 2011 | 1.3 |
| 2012 | 1.3 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

## කුඩා තේවතු සංවර්ධන අධිකාරිය

## 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | උපලේඛන අංකය | 2012 | | (RS.000) 2011 | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| ජංගම වත්කම් | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 7 | 40,633 | | 70,392 | |
| ලැබිය යුතු දෑ | 4,5 | 131,191 | | 215,307 | |
| තොග | 3 | 22,381 | | 19,610 | |
| කලින් ගෙවීම් | 6 | 290 | | 224 | |
| වෙනත් ජංගම වත්කම් | 2A | 4,540 | 199,035 | 4,740 | 310,273 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| ආයෝජන | 2 | | 7,891 | | 6,702 |
| වෙනත් මූල්‍ය වත්කම් | 2A | | 1,484 | | 965 |
| දේපල පිරියත හා උපකරණ | 1 | 332,731 | | 314,454 | |
| අඩු කළා සමුච්චිත ක්ෂය | | 56,983 | 275,749 | 77,362 | 237,092 |
| **ජංගම නොවන වත්කම්** | | | **484,159** | | **555,032** |
| ආයෝජන | | | | | |
| වෙනත් මූල්‍ය වත්කම් | | | | | |
| දේපල පිරියත හා උපකරණ | | | | | |
| අඩු කළා සමුච්චිත ක්ෂය | 8 | 24,116 | | 26,782 | |
| | 9 | 99,529 | 123,645 | 24,744 | 51,526 |
| ජංගම නොවන වගකීම් | | | **484,159** | | |
| පාරිතෝෂික සදහා වෙන් කිරීම් | 10 | | | | |
| මුළු වගකීම් | | | | **239,547** | |
| මුළු ශුද්ධ වත්කම් | 10 | | | **244,613** | |
| ශුද්ධ වත්කම්/ හිමිකම් | | | | | |
| රජයේ ප්‍රාග්ධන දායකත්වය | 01A | 6,164 | | - | |
| ප්‍රදාන | 01B | 176,645 | | 212,473 | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 01C | 143,664 | | 109,857 | |
| සමුච්චිත අතිරික්තය/ ඌණතාවය | | (81,860) | | 72,305 | |
| | | | **244,613** | | **394,635** |
| මුළු ශුද්ධ වත්කම්/ හිමිකම් | | | **244,613** | | **394,635** |

.......................................  ......................

සභාපති  මූල්‍ය කළමණාකරු

# කුඩා තේවතු සංවර්ධන අධිකාරිය

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසරේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

(රුපියල් '000)

| | උපලේඛන අංක | | 2012 | | 2011 |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් අයහාරය** | | | | | |
| ඒකාබද්ධ අරමුදල | | | | | |
| වසර තුළ ලැබුණු අරමුදල් | | | 418,832 | | 191,594 |
| **වෙනත් ආදායම්** | 15 | | | | |
| පොළිය | | 2,231 | | 1,925 | |
| සේවක ණය සදහා | | 3,781 | | 1,858 | |
| විවිධ **ආදායම්** | | 2,395 | | 2,697 | |
| වාහන ඉවත් කිරීමෙන් අතිරික්තය / හිගය | | 994 | | 1,627 | |
| පොහොර බෙදා හැරීමෙන් අතිරික්තය / හිගය | 16 | (79) | | (444) | |
| පැළ තවාන් අතිරික්තය / හිගය | 17 | (572) | | 871 | |
| හන්තාන වියදමට වැඩි ආදායම | | 1,568 | 10,318 | 1,676 | 12,210 |
| | | | 429,150 | | 403,804 |
| **සංවර්ධන වියදම්** | | | | | |
| සහනාධාර | 13 | (268,460) | | (202,059) | |
| ව්‍යාප්ති වියදම් | 14 | (4,619) | | (2,717) | |
| සමාජ සංවර්ධන වියදම් | 13 | (1,500) | | (2,310) | |
| ආයතන ශක්තිමත් කිරීම | | (1,727) | | (928) | |
| | | | (276,306) | | (208,014) |
| **මෙහෙයුම් වියදම්** | 12 | | | | |
| කාර්ය මණ්ඩල වැටුප් | | | | | |
| වැටුප්, දීමනා , සේ.අ.සා.අ., සේ.භා.අ. යනාදී | | (178,549) | | (167,635) | |
| අතිකාල දීමනා / නිවාඩු දින වැටුප් | | (2,274) | | (2,485) | |
| ගමන් වියදම් | | (7,728) | | (7,109) | |
| සැපයුම් සහ පාරිභොජනීයන් | | (3,517) | | (2,930) | |
| නඩත්තු කිරීම | | (15,135) | | (13,545) | |
| සන්නිවේදන | | (4,188) | | (3,863) | |
| බදු කුලී, වරිපනම් සහ විදුලිය | | (4,844) | | (4,505) | |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (17,421) | | (16,455) | |
| **මුළු මෙහෙයුම් වියදම්** | | | (233,655) | | (218,527) |
| | | | (80, 811) | | (22,737) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වල අතිරික්තය / හිගය** | | | | | |
| පාරිතෝෂිකය | | (14,727) | | (16,309) | |
| ක්ෂය ප්‍රමාණය සහ ක්‍රමක්ෂය | | (13,891) | | (21, 424) | |
| ණය ගැතියන්ගේ බොල් ණය / කපා දැමූ ණය සදහා | | (48,022) | (76,640) | (2,476) | (40,209) |
| ප්‍රතිපාදන | | | (157, 451) | | (62,946) |
| දේපළ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අලෙවියෙන් ලත් ලාභය | | | | | |
| IFAD - සමාවර්ති ප්‍රදාන | 14 | 23,618 | | 24,144 | |
| සමාවර්ති **වියදම්** | | (23,618) | | (24,144) | |
| ණය හිමියන් විසින් කපා දැමූ ණය | | | | 46,677 | |
| විශේෂ අයිතමයනට පෙර අතිරික්තය / හිගය | | | | | (46,677) |
| විශේෂ අයිතම | | | | | |
| විලම්බිත ආදායම | | | 5,946 | | 3,512 |
| **අදාළ කාලය සදහා ශුද්ධ අතිරික්තය / හිගය** | | | (151,505) | | (12,757) |

## මූල්‍ය ප්‍රකාශයට සටහන්

01. **ගණකාධිකරණ ප්‍රතිපත්ති**

1.1 **සාමාන්‍ය**

1.1.1 **ගණකාධිකරණ පදනම**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශයන් සකස් කරනු ලබන්නේ ඒකාකාරව යෙදෙන , සාමාන්‍යයෙන් පිළිගත් ගණකාධිකාරී මූලධර්මයන්ට සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ඉදිරිපත් කර තිබෙන ශ්‍රී ලංකා ගණකාධිකාරී ප්‍රමිතීන්ට අනුකූලවය. මූල්‍ය ප්‍රකාශයන් සකස් කර තිබෙන්නේ ඓතිහාසික පිරිවැය ප්‍රඥප්තිය පදනම් කරගෙනය. මෙම ගිණුම කෙරෙහි බලපාන උද්ධමනකාරී කරුණු සැලකිල්ලට ගෙන ඒවා වෙනස් කර නොමැත. උචිත පරිදි යොදාගෙන තිබෙන නිශ්චය ප්‍රතිපත්ති, පහත සටහන් මගින් පැහැදිලි කර ඇත.

1.1.2 ශේෂ පත්‍රයට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයට පසුව ඇති වූ වැදගත් සිදුවීම් ගැන සැලකිලිමත්ව, අවශ්‍ය තැන්හි ගැලපීම් සිදුකර තිබේ.

1.1.3 **සංසන්දනාත්මක සංඛ්‍යා**

වර්තමාන වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීම පිළිබඳ වෙනස්කම්වලට ගැලපෙන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යාවන්ගේ වෙනස්කම් සිදු කර ඇත.

1.1.4 **නිකුත් වූ නව ගණකාධිකාරී ප්‍රමිතීන් තවම ක්‍රියාත්මක වී නොමැති බව**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් ශ්‍රී ලංකා ගණකාධිකාරී ප්‍රමිතීන් පිළිබඳ නවතම කලාපයේ ගණකාධිකාරී මූලධර්මයන් 2012 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව ඇරඹෙන මුදල් වර්ෂය සඳහා අනුකූල වනු ඇත. මුදල් වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් කරනු ලබන ආයතන සඳහා මෙම ප්‍රමිතීන් අදාළ නොවන ඇත.

SLFRS සහ LKAS (IAS වලට අනුරූපිත) SLFRS යන ද්විත්ය මූලට යෙදෙන ගණකාධිකාරී ප්‍රමිතීන් වලින් නව ශ්‍රී ලංකා ගණකාධිකාරී ප්‍රමිතීන් සමන්විත වේ. ශ්‍රී ලංකා ගණකාධිකාරී ප්‍රමිතීන්ට SLFRS සහ LKAS ප්‍රථම වරට භාවිතයේදී එය SLFRS ප්‍රතිග්‍රහණයක් විය යුතුය. මෙම ප්‍රමිතීන්ගෙන් මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි විය හැකි බලපෑම් පිළිබඳව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය දැනට අධ්‍යනයක යෙදෙමින් සිටින අතර මෙම ප්‍රමිතීන් ප්‍රතිග්‍රහණය කිරීමෙන් වන බලපෑම ශේෂ පත්‍ර දිනයට සංඛ්‍යාත්මකව ප්‍රකාශ කර නොමැත.

1.1.5 අතිවිශේෂ කරුණු

වර්ෂය තුළ පොහොර ණයගැතියන් වැනි ඇතැම් ණය ගැතියන්, ඔවුන්ගෙන් ලැබිය යුතු හිඟ මුදල් ගෙවා තිබේ. බොල් ණය අය කරන ක්‍රමය වෙනස් කල අතර මෙම වසර සඳහා වෙන් කරනු ලැබූ බොල් ණය ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 9.465 කි. මුදල් ලබා ගැනීම සැක සහිත වූ ඇතැම් ණයගැතියන් පිළිබඳව සඳහන් කර තිබෙන අන්දමට ගිණුම් සකස් කරණු ලැබීය. නියෝජනය නොවන ශේෂයන් සඳහා බොල් ණය ප්‍රතිපාදන නොමැත.

| **ණය කාලය** | **ප්‍රතිපාදන** |
|---|---|
| **වසරකට අඩු** | **කිසිවක් නොමැත** |
| **වසර එකේ සිට දෙකට වඩා වැඩි** | **30%** |
| **වසර තුනට වඩා වැඩි** | **100%** |

(1) වත්කම් සහ තක්සේරු කිරීමේ පදනම

2.1 දේපල, යන්ත්‍ර සහ උපකරණ

ශේෂ පත්‍රයේ දේපල, යන්ත්‍ර සහ උපකරණ දක්වා තිබෙන්නේ සමුච්චිත ක්ෂය කිරීම් අඩු කළ පිරිවැය ලෙසය. ක්ෂයවීම සඳහා ඉඩ සලසා තිබෙන්නේ පහත දැක්වෙන ප්‍රමාණයන්ට අනුව සෘජු පදනමක් මත කරන ප්‍රති තක්සේරු ක්‍රමයකටය.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| මෝටර් රථ | 20% |
| ලී බඩු, සවි කිරීම් සහ කාර්යාලීය උපකරණ | 12.5% |
| පරිගණක | 20% |

මිලට ගන්නා වසරේ ක්ෂය වීම් සඳහා අය කෙරුවද , වසර තුළ ඉවත් කරන වත්කම් සඳහා ක්ෂය කිරීමක් නොමැත.

පසුගිය වසරේ භාණ්ඩාගාරයෙන් අධිකාරිය වෙත ඩබල් කැබ් රථ 3 ක් ලැබුන අතර රථයක වෙළඳ අගය රුපියල් මිලියන 6.8ක් ලෙස මිල නියම වී තිබූ අතර මෙහි ගිණුම් ගැලපීම් මෙම වසරේදී සිදු කරන ලදී.

මෝටර් රථ ප්‍රත්‍යාගණනය වසර තුලදී සිදු කරන ලදී. ප්‍රත්‍යාගණනය සඳහා වලංගු කාලසීමාව 2012. 12. 31 දිනෙන් අවසන් විය. මෙම තක්සේරුව සිදු කරන ලද්දේ රජය සහතික කරන ලද රථ වාහන තක්සේරු ආයතනයක් මගිනි.

**2.2** ආයෝජන

**පාරිතෝෂික අරමුදල සඳහා වන ස්ථිර තැන්පතු මෙයට ඇතුලත් වේ.**

2.3 **තොග සහ පරිලේඛන**

තොග සහ පරිලේඛන තක්සේරුකර තිබෙන්නේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකම් වලින් වඩා අඩු වටිනකමටය. පිරිවැය ගණනය කර ඇත්තේ FIFO පදනම අනුවය.

2.4 වෙළඳ ණයගැතියන් සහ අයවිය යුතු මුදල්

තේ ශක්ති අරමුදලේ රුපියල් මිලියන 75.2ක් වූ ශේෂය මේ වසර තුලදී කපා හරින ලදි. අයවැය දීමනා වලට පරිබාහිර රුපියල් මිලියන 36.66 ක ප්‍රාග්ධනයක් සපයන ලද අතර රුපියල් මිලියන 38.56ක් අදායම් සහ වියදම් ගිණුමෙන් වැය විය.

2.5 වෙනත් අයවිය යුතු මුදල්

වෙළඳ ණයගැතියන් හැර වෙනත් අයවිය යුතු ප්‍රමාණයන් දක්වා ඇත්තේ උපලබ්දී කිරීමට ඇති ඇස්තමේන්තු වටිනාකම්වලටය.

2.6 මුදල් සහ මුදල් වලට සමාන දේ

මේ යටතට ගැනෙන්නේ අත ඇති මුදල් සහ ඒක්ෂණ තැන්පතුය.

2.7 මුදල් ප්‍රවාහය

මුදල් ප්‍රවාහය ප්‍රකාශය සකසා තිබෙනුයේ අනියම් ක්‍රමයටය.

2.8 ලැබුණු අරමුදල් ගිණුම්කරණය

විසර්ජන ගිණුම හරහා 2007 වසරේ සිට සෙස් අරමුදල ප්‍රේෂණය කර තිබෙනුයේ භාණ්ඩාගාරය මගිනි.

(3) වගකීම්

ශේෂ පත්‍ර දිනය වන විට තිබුණු බැරකම් සියල්ල ගිණුම්ගත කර තිබෙන බවට පැහැදිලි බැරකම් සඳහා ප්‍රතිපාදන සලසා තිබේ. නිවැරදිව ගණනය කළ නොහැකි ප්‍රමාණයන් ඇතුලත් කර නැත. ගිණුම් ශේෂයේ ජංගම වගකීම් ලෙස වර්ග කර තිබෙන්නේ ඉල්ලුවිට ගෙවීමට තිබෙන වත්කම්ය. අදායම් ලෙස දක්වා ඇති රුපියල් මිලියන 46 යනු ණය හිමියන්ට නොගෙවීම් සහ වගකීම් වල වූ වෙනත් ශේෂයන්ය.

3.1 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

සේවයේ 6 වසරේ සිට සියළුම සේවකයන්ට ගෙවිය යුතු වන විශ්‍රාම පාරිතෝෂිකය සඳහා පූර්ණ ප්‍රතිපාදන ගිණුම්වල සලසා තිබේ. ශ්‍රී ලංකා ගණකාධිකාරී ප්‍රමිතීන්ට අනුව අරමුදල් නොමැති වීම හේතුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදනවලට සරිලන පරිදි තැන්පතු වටිනාකම වැඩි කිරීමට නොහැකි වී ඇත. කෙසේ වුවද රුපියල් මිලියන 6.7 ක් පමණක් ස්ථිර තැන්පතු ලෙස ඉහත සඳහන් පරිදි තබා ඇත.

3.2 බදු අයකිරීම

ඒකාබද්ධ අරමුදලින් සහ සෙස් අරමුදලින් අරමුදල් යෙදෙන ආයතනයක් ලෙස කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ආදායම් බද්දෙන් නිදහස්ය.

3.3 අසම්භාව්‍ය වගකීම්

කම්කරු විනිශ්චය සභා සහ උසාවි නඩු සඳහා රුපියල් මිලියන 3 ක පමණ අසම්භාව්‍ය වගකීමක් තිබේ.

(4) 1981 සිට 2012 දක්වා ඒකාබද්ධ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය, කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය සහ තේ සංවර්ධන

ව්‍යාපෘතිය සඳහා ලැබුණ අරමුදල්ද ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වත්කම් ද , ශ්‍රී ලංකා ගණකාධිකාරී ප්‍රමිති අංක 24 පරිදි ක්‍රමක්ෂය කර තිබේ. රුපියල් මිලියන 1.9 ක් විලම්බිත අදායම ලෙස ගිණුම් ගත කර තිබෙන අතර, ඉතිරි ශේෂයන් ඉදිරි වසර සඳහා ක්‍රමක්ෂය කර ඉදිරියට ගෙන ඇත.

කුඩා තේ වතු සංවර්ධනය සඳහා 1998 වසරේදී රජය විසින් රුපියල් මිලියන 200ක ප්‍රතිපාදන ලබා දුනි. තේ ශක්ති තේ කර්මාන්තශාලා ඉදිකිරීම, තේ කර්මාන්තශාලා සඳහා වර්ණ වෙන්කරන මිලදී ගැනීම් සහ තේ දළු නෙලීම සහ පොහොර ප්‍රවාහනය සඳහා වාහන මිලදී ගැනීම් ද මෙම ප්‍රතිපාදන හරහා සිදු කරන ලදී. මීට අමතරව තේ කර්මාන්තශාලා ජාලය පුළුල් කිරීම සඳහා 2000 සහ 2001 වසර තුලදී රජයෙන් අමතර රුපියල් මිලියන 373 ක ප්‍රදානයක් ද ලැබුණි. ඉන් විසින් තේ ශක්ති අරමුදල් අනතුරුව රජය පනත නීති ගත කරන ලද අතර වත්කම් තේ ශක්ති අරමුදල වෙත පවරන ලදී.

ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රතිපාදන ආයෝජනය කරන ලදී.රුපියල් මිලියන 93.6ක් වූ අයවැය ප්‍රදානයේ ශේෂය සැසඳූ අතර අවශ්‍ය ගැලපීම් සිදු කරමින් ඉදිරියේදී ගිණුම් සැසඳීම් සිදු කරනු ඇත.

## කුඩා තේවතු සංවර්ධන අධිකාරිය

### 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | (රුපියල් '000) |
|---|---|---|
| **ක්‍රියාකාරී කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ** | **2012** | **2011** |
| **සාමාන්‍ය කාර්යයන්ගේ අතිරික්තය (හිගය)** | (151,505) | (12,757) |
| **මුදල් නොවන චලනයන්** | | |
| ක්ෂය කිරීම | 13,891 | 21,424 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 14,727 | 16,309 |
| අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වැඩි කිරීම | 9,465 | 2,476 |
| ණය කරුවන්ගේ බොල් ණය / කපා දැමු ණය සඳහා | | (2,594) |
| පොළී ආදායම | (2,231) | (1,925) |
| ගෙවීමට ඇති මුදල් වැඩි වීම /අඩුවීම | 73,480 | 87,364 |
| ප්‍රත්‍යාගණන පාඩුව | | |
| සේවක පිරිවැය සඳහා වැඩි කළ ප්‍රතිපාදන | | |
| දේපළ, යන්ත්‍රෝපකරණ උපකරණ විකිනීමෙන් වාසි / අවාසි | (1,037) | (1,594) |
| වෙනත් වත්කම් වැඩි වීම /අඩුවීම | (1,508) | (6,764) |
| අයවිය යුතු දේ වැඩි වීම /අඩුවීම | 72,426 | 15,574 |
| බඩු ලේඛණ අයිතම වැඩි වීම /අඩුවීම | (2,771) | 5,214 |
| **ක්‍රියාකාරී කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහ** | 176,441 | (39,242) |
| **ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ** | | |
| **යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම** | (16,764) | (20,634) |
| **යන්ත්‍ර සහ උපකරණ** විකිනීමෙන් ලත් ආදායම | 1,281 | 1,634 |
| **ආයෝජන කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහ** | (15,483) | (19,000) |
| ලැබුණ පොළිය | 3,705 | 3275 |
| ගෙවූ පාරිතෝෂිකය | (7,696) | (4,714) |
| **මුදල් යෙදීමේ කාර්යයන්ගෙන් ඇති වූ මුදල් ප්‍රවාහ** | (3,991) | (1,439) |

| | | |
|---|---|---|
| **ප්‍රාග්ධන ප්‍රධාන** | (35,828) | 5,126 |
| **වසරට පෙර ගැලපිලි** | (35,828) | 5,126 |
| **මුදල් යෙදීමේ කාර්යයන්ගෙන් ඇති වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | (30,366) | (67,312) |
| **කාලච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල්වලට සමාන** | 70,392 | 137, 704 |
| **කාලච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල්වලට සමාන** | 40,026 | 70,392 |

(5) වලහන්දුවේ සංචාරක බංගලාව සහ ඉඩම ආශ්‍රිත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 10.54 කි. ඉඩම් ගොඩ කිරීමේ කොමිසමට අයිති මෙම ඉඩම මෙතෙක් අධිකාරියට පවරා නොමැත.

(6) නීතිමය අවශ්‍යතා
ජයන්ත ද අල්විස් මහතාගේ ගේ කම්කරු ආරවුල සමර්ථයකට පත් කිරීම සඳහා වසර තුළ රුපියල් මිලියන 1 ක මුදලක් ගෙවීමට සිදු විය.

**(7) නැවත වගා කිරීමේ සහනාධාර ක්‍රමයෙහි දක්නට තිබුණු කාර්ය සාධනය සහ මුල් ක්‍රියාකාරී සැලැස්ම අනුව වාර්ෂික වැඩ සැලැස්ම සකස් කර ඇති අතර, අයවැය ලේඛනය ඒ අනුව පිළියෙළ කරන ලදී. එසේ වුවද අතිරේක ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් නොලැබීම හේතුවෙන් වර්ෂය තුළ සිදු කළ සහනාධාර ගෙවීම් සඳහා අධිකාරිය සතු රුපියල් මිලියන 28 ක් වැය කිරීමට සිදු විය.**

(8) 2012 ජනවාරි 01 දින සිට වලංගු වන පරිදි, සහනාධාර ප්‍රමාණයන් පහත දැක්වෙන පරිදි ඉහල නංවා තිබේ.

| | | |
|---|---|---|
| නැවත වගා කිරීම | - | හෙක්ටෙයාර් එකකට රුපියල් 250,000 සිට 300,000 දක්වා |
| නව වගා කිරීම | - | රුපියල් 50,000 සිට 150,000 දක්වා |

(9) මෙම වසර තුලදී කුඩා තේ වතු හිමියන් සඳහා වූ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වූයේ ' දිවිනැගුම' ප්‍රතිපාදන හරහාය. මේ සඳහා වියදම් වූ මුළු මුදල රුපියල් මිලියන 9.3කි.

(10) කළුතර දිස්ත්‍රික් කාන්තා කුඩා තේ වතු හිමියන් 1000 ක අදායම් ඉහල නැංවීම සඳහා වූ සංවර්ධන වැඩසටහනක්ද වසර තුළ ක්‍රියාත්මක විය. බස්නාහිර පළාත් සභාව මේ සඳහා අරමුදල් සම්පාදනය කළ අතර, වියදම් වූ මුළු මුදල රුපියල් මිලියන 3.75කි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : එල්පී/ඩී/ටීඑස්එච්ඩීඒ/එෆ්ඒ/2012
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2014 ජූලි 24 දින

සභාපති

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

මාගේ සමාංක හා 2014 ජූනි 19 දිනැති මාගේ ලිපියට යොමුවේ.

02. ඉහත ලිපිය සමඟ ඉංග්‍රීසි අනුවාදය එවන ලද මාගේ වාර්තාවේ සිංහල අනුවාදය මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

පිටපත්: 1. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } එල්පී/ඩී/ටීඑස්ඩීඒ/එෆ්ඒ/2012  ඔබේ අංකය / உமது இல. / Your No. }  දිනය / திகதி / Date } 2014 ජූනි 19 දින

සභාපති
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පනතේ 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2014 ජනවාරි 23 දින අධිකාරියේ සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් පොත් හයක ශේෂ හා අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වෙන මුදල් පොතේ ශේෂ අතර එකතුව රු. 362,909 ක් වූ වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) ලෙජර් ගිණුම් හා ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල අදාළ උපලේඛන අතර පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය.

| ණය වර්ගය | ලෙජර් ගිණුම් අනුව ශේෂය | උපලේඛන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ආපදා ණය | 17,422,814 | 15,404,232 | 2,018,582 |
| නිවාස ණය | 41,253,692 | 41,412,838 | (159,146) |
| ණය සහන සඳහා ණය | 99,691 | 53,810 | 45,881 |
| යතුරු පැදි ණය | 364,233 | 237,326 | 126,897 |
| පාපැදි ණය | 63,230 | 330,927 | (267,697) |
| උත්සව අත්තිකාරම් | 86,106 | 57,000 | 29,106 |
| වැටුප් අත්තිකාරම් | - | 106,000 | (106,000) |
| විශේෂ වැටුප් අත්තිකාරම් | 67,950 | 9,000 | 58,950 |
| ආසියානු සංවර්ධන බැංකු ණය | - | 744,528 | (744,528) |
| සුභ සාධන ණය | - | 3,650 | (3,650) |
| විවිධ අත්තිකාරම් | 9,900 | - | 9,900 |

2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලයේ රු. 5,925,956 ක් හා ප්‍රාදේශීය කාර්යාලවල රු. 4,908,112 ක් වූ ණයගැතියන් වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ආ) එකතුව රු. 1,288,967 ක් වූ කළුතර, කෑගල්ල හා ඌව ප්‍රාදේශීය කාර්යාලවල ණය හිමියන් වර්ෂ 5 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ඇ) හන්තාන පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකුට ගෙවන ලද රු. 12,968,728 ක් වූ අත්තිකාරමක් වර්ෂ 10 කට වැඩි කාලයක් අයකර ගෙන නොතිබුණි. පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම 2001 වර්ෂයේදී නිම කර තිබූ බව නිරීක්ෂණය විය. ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබාදුන් උපදෙස් අනුව අයකර ගත නොහැකි මුදල 2013 වර්ෂයේ ගිණුම්වල ගැලපීම් කරන බව අධිකාරියේ සභාපති විසින් දන්වා තිබුණි.

(ඈ) රු. 8,147,878 ක්වූ යළි උපලේඛනගත කළ හිඟ මෝටර් වාහන ණය ශේෂය අයකර ගැනීමෙන් තොරව වර්ෂ 05 කට වැඩි කාලයක් ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ඉ) විගණනයට ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය සේවකයන්ගෙන් හා වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් ලැබිය යුතු ණය සහ අත්තිකාරම් හා වෙනත් ක්‍රියාත්මක නොවන ණය රු. 1,625,916 ක් විය.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විස්තරය | මුදල | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ව්‍යාපෘති මෝටර් වාහන පිරිවැය | 8,518,625 | උපලේඛන හා වෙනත් ආධාරක ලියකියවිලි |
| තේ පරික්ෂකවරුන් /ව්‍යාපෘති නිලධාරීන් සඳහා ලබාදුන් යතුරු පැදි ණය | 6,955,347 | |
| ගෙවිය යුතු තැන්පතු | 225,100 | |
| මෝටර් වාහන ණය | 17,309 | |
| ජල ගැලීම් සහන ණය | 20,452 | |
| සුභසාධක ණය හා අත්තිකාරම් | 11,070 | |
| කුඩා තේ වතු හිමියන් සඳහා අයවැය ප්‍රදාන (budget grants) | 93,610,309 | විස්තරාත්මක උපලේඛන |

2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව

| භාණ්ඩාගාර චක්‍රලේඛ | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 | චක්‍රලේඛයේ අවශ්‍ය පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් ප්‍රධාන කාර්යාලය සඳහා පවත්වා නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ වටිනාකම් වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

---

3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 154.16ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌනතාවය රු. මිලියන 12.76 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. මිලියන 141.4 ක කවදුරටත් පිරිහීමක් දැක්වුණි. මෙම ඌනතාවයේ වැඩිවීමට හේතු වූයේ මෙහෙයුම් වියදම් රු. මිලියන 83.44 කින් වැඩිවීමත් බොල් ණය රු. මිලියන 45.54 කින් කපා හැරීමත්ය.

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1 කාර්ය සාධනය

---

(අ) තේ නිෂ්පාදනය සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය

---

විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 326.28 ක් වූ අතර ඒ සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය කිලෝග්‍රෑම් මිලියන 233.10 ක් හෙවත් සියයට 71.4 ක් විය. ඉකුත් වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 328.37 ක් වූ අතර ඒ සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය කිලෝග්‍රෑම් මිලියන 229.94 ක් හෙවත් සියයට 70 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා කුඩා තේ හිමියන්ගේ දායකත්වය සියයට 1.4 කින් වැඩිවී තිබුණි.

(ආ) තේ වගා සංවර්ධනයන්

ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට අනුව, තේ නැවත වගා කිරීම හා නව වගා කිරීම්, ව්‍යාප්ත සේවා හා සමාජ සංවර්ධනය සහ ආයතනික ශක්තිමත් කිරීම වැනි සංවර්ධන කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 276.3 ක සහනාධාර මුදලක් ලබා දී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතර සඳහා වගා සංවර්ධන පිරිවැය සහ සංවර්ධන පිරිවැය රුපියල් එකකට ක්‍රියාත්මක කිරීමේ පිරිවැය පහත දැක්වේ.

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| සංවර්ධන පිරිවැය (රු. මිලියන) | 208.3 | 185.7 | 189.2 | 208.0 | 276.3 |
| ක්‍රියාත්මක කිරීමේ පිරිවැය (රු. මිලියන) | 188.7 | 202.1 | 205.4 | 218.5 | 233.5 |
| සංවර්ධන පිරිවැය රු. 1 කට ක්‍රියාත්මක කිරීමේ පිරිවැය | 0.91 | 1.08 | 1.08 | 1.04 | 0.85 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සහනාධාර යෝජනා ක්‍රම යටතේ තේ නැවත වගා කිරීම

ජාතික අවශ්‍යතාවයට අනුව, උපරිම ඵලදාව ලබාගැනීමට සහ තේ ඉඩම් නඩත්තු කිරීමට වාර්ෂිකව හෙක්ටයාර් 2,300 ක් නැවත වගා කළ යුතුය. කෙසේ වුවද ලබා ගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සහනාධාර යෝජනා ක්‍රමය යටතේ හෙක්ටයාර් 889 ක් පමණක් නැවත වගා කර තිබුණු අතර එය හෙක්ටයාර් 116,492 ක් වූ මුළු පරිණත තේ ඉඩම් වලින් සියයට 0.76 ක්නියෝජනය විය.

(ii) ව්‍යාප්ති හා උපදේශක සේවා

-------------------------------

- කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව, ව්‍යාප්ති සේවා කාර්ය මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී කණ්ඩායම් වැඩ සටහන් 6,508 ක් පවත්වා තිබුණු අතර එය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 6.6 ක අඩුවීමක් විය.
- සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාප්ති හා උපදේශක සේවා සඳහා වගා කරුවන් 143,456 දෙනෙකුගේ සහභාගිත්වය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 18 කින් අඩු වීමක් විය.
- ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ඵලදායි ව්‍යාප්ති සේවාවක් ඉටු කර ගැනීම සඳහා ව්‍යාප්ති නිලධාරියෙකුට වගා කරුවන් අනුපාතය 1:1000 ක් විය යුතුය. කෙසේ වුවද තථ්‍ය අනුපාතය 1:2730 ක් විය. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ සේවක සංඛ්‍යා තත්ත්වය අනුව, ව්‍යාප්ති නිලධාරීන්ගේ පුරප්පාඩු 22 ක් පැවතුණි.
- අභ්‍යන්තර විගණන වාර්තා අනුව, සහනාධාර ගෙවීම් සම්බන්ධයෙන් ව්‍යාප්ති නිලධාරීන් විසින් පහත සඳහන් අක්‍රමිකතා සිදු කර තිබූ බව නිරීක්ෂණය විය.

| ප්‍රාදේශීය කාර්යාලය | බලපත්‍ර අංකය | අක්‍රමිකතා පිළිබඳ විස්තර |
|---|---|---|
| ඌව | RP/HP/10/28<br>RP/HP/11/29 | රු. 189,824 ක් වූ සහනාධාර වැඩිපුර ගෙවීම් |
| නුවර එළිය | RP/NE/2004/DO/66,68<br>RP/NE/2005/DO/32,34,36<br>RP/NE/2007/DO/04,05,08,15,17<br>RP/NE/2008/DO/18 | රු. 519,503 ක් වූ සහනාධාර වැඩිපුර ගෙවීම් |
| | RP/NE/2004/DO/62<br>RP/NE/2005/DO/33 | කිසිදු සංවර්ධන කාර්යයක් සිදු නොකළ බලපත්‍ර සඳහා රු. 117,363 ක් වූ සහනාධාර ගෙවීම් |
| | RP/NE/2007/DO/07<br>RP/NE/2007/DO/06<br>RP/NE/2008/DO/16<br>RP/NE/2008/DO/19 | එකම ඉඩම සඳහා දෙවරක් නිකුත් කරන ලද බලපත්‍ර සඳහා රු. 267,102 ක්වූ සහනාධාර ගෙවීම් |
| කළුතර | RP/KAL/2010/MAHA/21 | රු. 64,752 ක්වූ සහනාධාර වැඩිපුර ගෙවීම් |

ඇතැම් වැඩිපුර ගෙවීම් අයකර ගෙන හෝ ඊළඟ වාරික ගෙවීම්වලින් කපාගෙන තිබූ බවත් වෙනත් අක්‍රමිකතා සඳහා අදාළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගෙන තිබූ බවත් අධිකාරියේ සභාපති විසින් දන්වා තිබුණි.

- අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව, 2003 සිට 2009 කාල පරිච්ඡේදය තුළදී ප්‍රාදේශීය කාර්යාල අට විසින් සිදු කරන ලද රු. මිලියන 1187.6 ක්වූ මුළු සහනාධාර ගෙවීම් වලින් රු. මිලියන 168.5 ක් 2012 අගෝස්තු 31 දක්වා නැවත වගා කිරීම සඳහා ගෙවූ බවට වාර්තා වී නොතිබුණි. එබැවින් මෙම වාර්තා නොවූ නැවත වගා කිරීමේ සහනාධාර ගෙවීම් ඵල රහිත ලෙස සලකා තිබූ බව නිරීක්ෂණය විය.

වගාකරුවන් වගා කිරීමේ කාලය තුළ කාලගුණය, ආර්ථික හා සාමාජයීය කරුණුවැනි ගැටළුවලට මුහුණ දී තිබූ බවත්, එබැවින් සමහර වගාකරුවන් විසින් වගා කිරීම සඳහා දිගු කාලයක් ගෙන තිබූ බවත්, සමහර වගාකරුවන් ඔවුන්ගේ වගාවන් අත්හැර දමා තිබූ බවත්, අනාගතයේදී මෙම ගැටළු ඉවත් කර ගැනීම සඳහා අධිකාරිය විසින් පිළියම් ක්‍රියාමාර්ග ගනු ලැබූ බවත් අධිකාරියේ සභාපති විසින් දන්වා තිබුණි.

(ඈ) ආයතනික පැළ තවාන්

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ තේ පැළ තවාන් 07 ක මෙහෙයුම්වලින් ප්‍රතිඵලය රු. 571,700 ක පාඩුවක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂයේ රු. 870,639 ක ලාභයක් වූ හෙයින් රු. 1,442,339 කින් මෙහෙයුම් ප්‍රතිඵලවල අඩුවීමක් දැක්වුණි.

(ii) තිස්පනේ පැළ තවානෙන් අඛණ්ඩ පාඩු දරා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ හා පෙර වර්ෂය තුළ පිළිවෙලින් රු. 314,573 ක් හා රු. 64,054 ක් වූ පාඩු සිදුවී තිබූ බව නිරීක්ෂණය විය.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරියේ පැළ තවාන් 07 ක මැරී තිබුණු පැළ සංඛ්‍යාව 306,317 ක්වූ අතර එය මුළු පැළ සංඛ්‍යාවෙන් සියයට 33 ක් විය. රඟතුන්ගොඩ, හිඟුල්ඔය, හැඩිගල්ල හා තිස්පනේ පැළ තවාන්වල මැරුණු පැළ සංඛ්‍යාව සමාලෝචිත වර්ෂය තුළදී අසාමාන්‍ය ලෙස වැඩි වී තිබුණි.

(ඈ) වාණිජ පැළ තවාන් ලියාපදිංචි කිරීම

(ඇ) වාණිජ පැළ තවාන් ලියාපදිංචි කිරීම

ලබාගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල විසින් පැළ තවාන් 969 ක් ලියා පදිංචි කර තිබුණි. එයින් පැළ තවාන් 338 ක පැළ පමණක් විකිණීම සඳහා නිර්දේශ කර තිබුණි.

ලියාපදිංචි පැළ තවාන් 620 ක් විසින් තථ්‍ය සතුටුදායක පැළ නිෂ්පාදනය කර තිබූ බවත්, තේ පර්යේෂණ ආයතනයේ නිලධාරීන්ගේ නිර්දේශය ප්‍රමාදවීම හේතුවෙන් "සී.එන් 65" පරීක්ෂණයට පෙර සමහර පැළ විකුණා තිබූ බවත් සභාපති විසින් දන්වා තිබුණි.

(ඉ) තේ පොහොර බෙදාහැරීම

තේ පොහොර බෙදාහැරීමේ ගිණුමට අනුව, තේ පොහොර බෙදාහැරීම් මධ්‍යස්ථානවල ලාභය/ (පාඩුව) පෙර වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| පොහොර මධ්‍යස්ථානය | වර්ෂය සඳහා ශුද්ධ ලාභය/ (පාඩුව) 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| සරසවි උයන | (වසා ඇත) | (174,121) |
| පොරමඩුල්ල | (33,009) | (132,161) |
| හිඟුල | වසා ඇත | (269,247) |
| ගම්පොළ | (43,168) | 134,044 |
| බණ්ඩාරවෙල | (3,275) | (2,219) |

2010 වර්ෂයේදී රජයේ ජාතික පොහොර යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමෙන් පසුව මෙම පොහොර මධ්‍යස්ථාන ක්‍රියාත්මක නොවූ බව විගණනයේදී නිරීක්ෂණය විය. සරසවි උයන පොහොර මධ්‍යස්ථානයේ ගබඩාවේ රු. 81,800 ක් වටිනාකම වූ පොහොර තොගයක් (කිලෝග්‍රෑම් 442 ක්) සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිට පැවතුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව ණය යෝජනා ක්‍රමය මගින් ඩොලමයිට් මෙට්‍රික් ටොන් 958 ක් ප්‍රාදේශීය කාර්යාල 08 අතර බෙදා හැරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය කාර්යාල 04 ක් අතර මෙට්‍රික් ටොන් 632 ක් පමණක් බෙදා හැර තිබුණි.

සහනාධාර මිලට දිවයිනේ ඕනෑම තැනක පොහොර ලබාගත හැකි හෙයින් පොහොර මධ්‍යස්ථාන ක්‍රියාත්මක නොවන බවත්, වගාකරුවන් අතර ඩොලමයිට් බෙදා දීමට සැලසුම් කර තිබුණද තේ ක්ෂේත්‍රයේ ඩොලමයිට් ප්‍රමාණවත්ව ලබා ගත හැකි හෙයින් වගා කරුවන් ඩොලමයිට් ඉල්ලුම් කර නොතිබූ බවත්, ඔවුන්ට ණය පහසුකම් ලබා දීම අවශ්‍ය නොවන බවත් සභාපති විසින් දන්වා තිබුණි.

(ඊ) කුඩා තේ වතු සංවර්ධන සමිති

කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව, කුඩා තේ වතු සංවර්ධන සමිති 1381 ක් ලියාපදිංචි වී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට මුළු ලියාපදිංචි සාමාජිකයන් සංඛ්‍යාව 261,493 ක් විය. පෙර වර්ෂයට සාපේක්ෂව, සමිති 02 ක් වැඩි වී තිබූ බවත් සාමාජිකයන් 12,668 ක් අඩුවී තිබූ බවත් නිරීක්ෂණය විය. කෙසේ වුවද, සංඛ්‍යා ලේඛන වාර්තාවලට අනුව හා සමිති 1,240 කින් ලැබී තිබුණු තොරතුරු අනුව සමිති 82 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොවූ අතර සමිති 319 ක් දුර්වල ක්‍රියාකාරිත්වයක පැවතුණි.

ඵලදායිතාවය වැඩිකර ගැනීම සඳහා චක්‍රීය අරමුදල හා සමිති අධීක්ෂණ ක්‍රමය වැනි කුඩා තේ වතු හිමියන්ගේ ප්‍රජා මූල සංවිධාන ශක්තිමත් කිරීම සඳහා ව්‍යාප්ත ප්‍රදේශ කමිටු වැඩ සටහන් (Range Development Committee Programmes)පවත්වනු ලැබේ. ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාප්ත ප්‍රදේශ සංවර්ධන කමිටු වැඩ සටහන් 836 ක් ඉලක්ක කර තිබුණද වැඩ සටහන් 120 ක් පමණක් පවත්වා තිබුණි. ගාල්ල මාතර හා මහනුවර ප්‍රාදේශීය කාර්යලවල ව්‍යාප්ත ප්‍රදේශ සංවර්ධන කමිටු වැඩ සටහන් 383 ක් ඉලක්ක කර තිබුණද එම කමිටු පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.2 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වටිනාකම රු. 485,736 ක්වූ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ පොකුපිටිය සේවක නිල නිවාස දිගු කාලයක සිට උපයෝජනය කර නොතිබුණි.

(ආ) මාතර ප්‍රාදේශීය කාර්යාලයේ අලපලාදෙණියෙහි කාර්යාල ගොඩනැගිල්ල, සේවක නිල නිවාස හා තේ ඉඩමක අයිතිය 2013 මැයි 30 විගණන දිනය දක්වා අධිකාරිය විසින් පවරා ගෙන නොතිබුණි. කෙසේ වුවද අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2011 වර්ෂයේ සිට වර්ෂ 05 ක කාලයක් සඳහා මාසික කුලිය රු. 6000 කට මෙම තේ ඉඩම බදු දී තිබුණි. කෙසේ වුවද බදු ගිවිසුම 2013 වර්ෂයේදී අවලංගු කළ බව සභාපති විසින් දන්වා තිබුණි.

(ඇ) මුද්‍රණය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් රු. 484,641 ක් වටිනා ප්‍රකාශන අතිරික්ත තොගයක් උනන්දුවක් දක්වන්නන් හට බෙදා හැරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩාවේ පැවතුණි.

4.3 අධිකාරියේ සම්පත් වෙනත් රාජ්‍ය අංශයේ ආයතනවලට ලබාදීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මෝටර් වාහන දෙකක් 2011 අගෝස්තු 11 දින සිට රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබුණි.

4.4 මානව සම්පත් කළමනාකරණය

---

2012 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත හා සත්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 39 | 16 | 23 |
| ද්විතියික මට්ටම | 44 | 41 | 03 |
| තෘතියික මට්ටම | 293 | 261 | 32 |
| ප්‍රාථමික මට්ටම | 46 | 44 | 02 |
| එකතුව | 422 | *362 | 60 |

*අතිරික්ත තනතුරු 76 ක් සත්‍ය සේවක සංඛ්‍යාවට ඇතුළත් කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට විධායක ශ්‍රේණි 23 ක් ඇතුළත් පුරප්පාඩු 60 ක් පැවතුණි. සභාපතිගේ අදහස් දැක්වීම්වලට අනුව "ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 13 ක් හා තෘතියික මට්ටමේ පුරප්පාඩු 27 ක් 2013 සැප්තැම්බර් 30 දක්වා පුරවා තිබුණි. අතිරික්ත තනතුරුවලින් තනතුරු 50 ක් සඳහා එම අවස්ථාවේ සේවයේ යෙදී සිටි සේවකයන්ට පෞද්ගලික වනසේ අනුමත කරන ලදී."

(ආ) කෙසේ වුවද සේවක සංඛ්‍යාවට බාහිරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 දෙසැම්බර් 26 දිනැති ලිපිය ප්‍රකාරව සහකාර කළමනාකරුවකු (ව්‍යාපෘති) පත්කර තිබුණි. වෙනම රාජකාරි ලැයිස්තුවක් ඔහුට නිකුත් කර නොතිබුණු බවත්, සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරියේ කටයුතු කිරීම සඳහා ඔහුව විශේෂිත රාජකාරියක් පවරා නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ඇ) කළමනාකරණ සහකරුවකු හා පිළිගැනීමේ නිලධාරියෙකු පිළිවෙලින් අනියම් පදනම හා කොන්ත්‍රාත් පදනම යටතේ අධිකාරියේ බඳවා ගැනීම් යෝජනා ක්‍රමය (SOR) අනුගමනය කිරීමෙන් තොරව පත්කර තිබුණි.

(ඈ) කාර්ය මණ්ඩලයේ අධ්‍යාපන හා සේවා සහතික පිළිබඳ සනාථ කිරීම් අදාළ ආයතනයන්ගෙන් ලබාගැනීම සඳහාකටයුතු කර නොතිබුණි.

(ඉ) 2010 අප්‍රේල් 27 සිට මානව සම්පත් හා පරිපාලන කළමනාකරු තනතුර පුරප්පාඩු වී පැවති අතර මාසික දීමනාව රු. 1,100 ක් ගෙවීමේ පදනම මත 2010 අගෝස්තු 02 දින සිට වැඩ බලන කළමනාකරුවකු ලෙස නිලධාරියෙකු පත්කර තිබුණි. මෙම තනතුර පිරවීම සඳහා සුදුසු පුද්ගලයෙකු බඳවා ගැනීමට 2013 අගෝස්තු 31, විගණන දිනය දක්වා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඊ) ව්‍යාප්ති, සැලසුම් හා සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩු වී පැවති ප්‍රාදේශීය කළමනාකරුවන් පස් දෙනෙකු හා සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් එකොළොස් දෙනෙකු පත්කිරීමට පියවර ගෙන නොතිබුණි.

**4.4** **මෝටර් වාහන උපයෝජනය**

---

මෝටර් වාහන 26 කින් හා යතුරු පැදි 115 කින් සමන්විත අධිකාරියේ වාහන පද්ධතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෝටර් වාහන දෙකක් 2011 වර්ෂයේ සිට අළුත්වැඩියා කිරීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලැබී තිබුණු වාහන තුනක අයිතිය අධිකාරිය වෙත මාරුකර නොතිබුණි.

(ඇ) අධිකාරියට අයත් නොවූ වාහනයක් 2012 වර්ෂයේ සිට 2013 සැප්තැම්බර් 05 විගණන දිනය දක්වා අධිකාරිය පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවතුණි.

වාහනය පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීම සඳහා එහි අයිතිකරුට 2012 නොවැම්බර් 06, 2013 මාර්තු 06 හා 2013 ඔක්තෝබර් 09 දිනයන්හි ලිපි යවා ඇති නමුත් අයිතිකරු විසින් එම වාහනය ඉවත් කරගෙන නොතිබුණු බව සභාපති විසින් දන්වා තිබුණි.

(ඈ) 2012 මාර්තු 30 දින අනතුරකට පත්ව ඇති මෝටර් වාහනයක් අළුත්වැඩියා කර නොතිබුණු අතර රක්ෂණ හිමිකම ලබාගෙන නොතිබුණි. ඇස්තමේන්තුගත හානියේ වටිනාකම රු. 20,850 ක් විය.

**4.5** **පාරිතෝෂික ප්‍රතිපාදන ආයෝජනය කිරීම**

---

රු. මිලියන 115.9 ක්වූ මුළු පාරිතෝෂික ප්‍රතිපාදනයෙන් 2014 ජනවාරි 31 දක්වා රු. මිලියන 7.89 ක මුදලක් හෙවත් සියයට 6.8 ක් පමණක් ආයෝජනය කර තිබුණි. ඒ අනුව 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ දක්වා ඇති පරිදි අනාගත බැරකම් දැරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් අධිකාරිය විසින් ආයෝජනය කර නොතිබුණි.

භාණ්ඩාගාරය විසින් පාරිතෝෂික වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් නොකරන ලද බවත්, පාරිතෝෂික ගෙවීම සඳහා වාර්ෂික ප්‍රතිපාදනය භාණ්ඩාගාරයෙන් ලැබෙන බවත් සභාපති විසින් දන්වා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

විගණනය විසින් කරන ලද අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන්ට අනුව, අධිකාරිය විසින් 2012 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගෙන 2014 මැයි 07 දින නැවත ඉදිරිපත් කරන ලදී.

6. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් අධිකාරියේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

(ආ) මුදල් පාලනය හා බැංකු සැසඳුම්

(ඇ) සහනාධාර ගෙවීම

(ඈ) ණය හා අත්තිකාරම් ගෙවීම සහ අයකර ගැනීම

(ඉ) වත්කම් කළමනාකරණය

එච්.ඒ.එස්. සමරවීර

විගණකාධිපති.